බලශක්ති අමාත්‍යාංශය

வலுசக்தி அமைச்சு

Ministry of Energy

2025

ප්‍රගති වාර්තාව

முன்னேற்ற அறிக்கை

Progress Report

බලශක්ති අමාත්‍යාංශය

ප්‍රගති වාර්තාව 2025

(2025 වර්ෂයේ ප්‍රගතිය සහ 2026 වර්ෂය සඳහා වූ ඉදිරි සැලසුම්)

අංක 437, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංකය - 011 2574922
ෆැක්ස් - 011 2574741
වෙබ් අඩවිය - www.powermin.gov.lk
www.energymin.gov.lk

අන්තර්ගතය

පිටු අංකය

ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය VII

ලේකම්තුමාගේ පණිවිඩය IX

හැඳින්වීම XI

පළමු පරිච්ඡේදය - බලශක්ති අමාත්‍යාංශය 1

අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු
1.1. අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්
1.2. අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ
1.3. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන
1.4. 2025 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය
1.5. 2025 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය
1.6. අමාත්‍යාංශයේ 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

දෙවන පරිච්ඡේදය - ලංකා විදුලිබල මණ්ඩලය 44

තෙවන පරිච්ඡේදය - සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම 55

හතරවන පරිච්ඡේදය - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 59

පස්වන පරිච්ඡේදය - ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව 69

හයවන පරිච්ඡේදය - ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය 74

හත්වන පරිච්ඡේදය - සී/ස ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම 86

අටවන පරිච්ඡේදය - ශ්‍රී ලංකා එනර්ජීස් ප්‍රයිවට් ලිමිටඩ් 88

නවවන පරිච්ඡේදය - සී/ස එල් ටී එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම 90

දසවන පරිච්ඡේදය - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 106

එකොළොස්වන පරිච්ඡේදය - ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 113

දොළොස්වන පරිච්ඡේදය - ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය 119

වගු නාමාවලිය

පිටු අංකය

වගුව 1.1	2025 සැප්තැම්බර් මස අවසානය වන විට පාරිභෝගික සංඛ්‍යාව	5
වගුව 1.2	2025 ජුනි මස අවසානය වන විට උත්පාදන මිශ්‍රණය (ගි.වො.පැ. ඒකක වලින්)	7
වගුව 1.3	2025 ජුනි මස අවසානය වන විට ස්ථාපිත ධාරිතාව (මෙ.වො. ඒකක වලින්)	8
වගුව 1.4	දැනට ක්‍රියාත්මක කොන්ත්‍රාත්තු සහ ඉලක්කවල කාර්යසාධනය	18
වගුව 1.5	සිදු කෙරෙමින් පවතින වැඩ කටයුතුවල ප්‍රගතිය	18
වගුව 1.6	ආසියා-පැසිෆික් කලාප බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රකාශිත මිල ගණන් - 2025	26
වගුව 1.7	2025 වර්ෂයේ ඛනිජ තෙල් නිෂ්පාදනවල ඉහළම, අවම සහ සාමාන්‍ය මිල ගණන් (සිංගප්පූරු ප්ලැට්ස් මිල ගණන් අනුව)	27
වගුව 1.8	ඉන්ධන ආනයනය කිරීමේදී දරන ලද පිරිවැයෙහි සාමාන්‍ය මාසික අගය - 2025	27
වගුව 1.9	ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය - 2025.09.30 දිනට	28
වගුව 1.10	ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය - 2025.09.30 දිනට	28
වගුව 1.11	සමස්ථ ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව (2025.09.30 දිනට)	29
වගුව 1.12	ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය (2025.09.30 දිනට)	29
වගුව 1.13	සමස්ත සාමාන්‍ය දෛනික තෙල් පරිභෝජනය (මෙ.ටො.)	30
වගුව 1.14	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව - 2025.09.30 දිනට	32
වගුව 1.15	2025 වර්ෂය තුළ වාර්තා වූ උපරිම සහ අවම වෙළෙඳපොළ මිල ගණන්	33
වගුව 1.16	ලිහිසිතෙල් අංශයේ ක්‍රියාකාරකම් - 2025	36
වගුව 1.17	ඉන්ධන ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු	41
වගුව 1.18	ඉන්ධන නල මාර්ග සංවර්ධන ව්‍යාපෘති	41
වගුව 1.19	2025 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයේ මූල්‍ය ප්‍රගතිය - බලශක්ති අමාත්‍යාංශය (ශීර්ෂය 119)	42
වගුව 2.1	ප්‍රධාන ජනන සංවර්ධන ව්‍යාපෘති	44
වගුව 2.2	බලශක්ති ගබඩාකරණ සංවර්ධන ව්‍යාපෘති	45
වගුව 2.3	පද්ධති නවීකරණ සහ සහායක ව්‍යාපෘති	45
වගුව 2.4	ස.නො.පු.බ. සංවර්ධන ව්‍යාපෘති	45
වගුව 2.5	ක්‍රියාත්මකව පවත්නා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය	48
වගුව 2.6	බෙදාහැරීම් සංවර්ධන කටයුතු ආශ්‍රිත වැඩසටහන් සහ ප්‍රගතිය	52
වගුව 2.7	ණය හිමියන් විසින් අරමුදල් සම්පාදනය කිරීම මත ක්‍රියාත්මක වීමට නියමිත ජනන, ගබඩාකරණ, ස.නො.පු.බ., සහ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති	54
වගුව 3.1	2020 සිට 2025 ජූනි දක්වා මූල්‍ය තත්ත්වය	56
වගුව 4.1	වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇති ප්‍රධාන අභියෝග	59
වගුව 4.2	EOI ක්‍රියාවලිය යටතේ ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර	61
වගුව 4.3	අගෝස්තු මස අවසානය වන විට විවිධ ක්‍රියාත්මක අදියරවල ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර	61

වගු නාමාවලිය

		පිටු අංකය
වගුව 4.4	යෝජිත උත්පාදක සංකලනය	64
වගුව 4.5	ජාතික ව්‍යාපෘති පිළිබඳ විස්තර	66
වගුව 5.1	නියාමන ක්‍රියාකාරකම්	70
වගුව 5.2	ජාතික පුහුණු පාඨමාලා	71
වගුව 5.3	රෙගුලාසි, රීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම	71
වගුව 5.4	නියාමන ක්‍රියාකාරකම්	72
වගුව 6.1	2025 අගෝස්තු දක්වා මුළු ආදායම - රු. මිලියන 52.9	75
වගුව 6.2	2025 ජනවාරි සිට අගෝස්තු අවසානය දක්වා උපයා ගත් ආදායම	75
වගුව 6.3	පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර	82
වගුව 10.1	ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන තොරතුරු (2022 - 2025.09.30 දිනට)	106
වගුව 10.2	පිරිපහදුවේ නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) (2022 - 2025.09.30 දිනට)	108
වගුව 10.3	ආනයනික නිමි නිෂ්පාදන සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන - (2022 - 2025.09.30 දිනට)	108
වගුව 10.4	සමස්ත ඉන්ධන අලෙවිය (2023 - 2025.09.30 දිනට)	109
වගුව 10.5	විදුලි ජනනයට ඉන්ධන අලෙවි කිරීම - (2022 - 2025.09.30 දින දක්වා)	110
වගුව 10.6	ගුවන් යානා ඉන්ධන අලෙවිය - (2022 - 2025.09.30 දින දක්වා)	110
වගුව 10.7	ලිහිසි තෙල් අලෙවිය - (2022 - 2025.09.30 දිනට)	111
වගුව 11.1	කොලොන්නාව සහ සපුගස්කන්ද ඉන්ධන ගබඩා තොරතුරු	114
වගුව 11.2	ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය - 2025.09.30 දිනට	115

ප්‍රස්තාර / සිතියම් / රූප සටහන්

පිටු අංකය

ප්‍රස්ථාර 1.1	එක් එක් ප්‍රභවයේ ප්‍රමාණයන් සහිතව 2025 ඔක්තෝබර් 14 වන දිනට දිවා කාලයේ උත්පාදන සාරාංශය	6
ප්‍රස්ථාර 1.2	මුළු විදුලි උත්පාදනය සඳහා උත්පාදන මිශ්‍රණයේ දායකත්වය ප්‍රතිශත ලෙස	7
ප්‍රස්ථාර 1.3	දිගුකාලීන විදුලි ජනන සැලැස්මේ දැක්වෙන පරිදි අපේක්ෂිත ධාරිතා පුළුල් කිරීම්	8
ප්‍රස්ථාර 1.4	2025 වර්ෂයේ සමස්ත සාමාන්‍ය දෛනික තෙල් පරිභෝජනය	31
ප්‍රස්ථාර 1.5	2025.09.30 දිනට වාර්තා වූ වෙළෙඳපොළ මිල ගණන්	34
ප්‍රස්ථාර 4.1	NCRE සමුච්චිත ධාරිතාව එකතු කිරීම	61
ප්‍රස්ථාර 4.2	වහල මත සවි කරන ලද සූර්යබල පද්ධතිවල වර්ධනය	63
ප්‍රස්තාර 10.1	පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය (2022 - 2025.09.30 දිනට)	107
ප්‍රස්ථාර 10.2	ගුවන් යානා ඉන්ධන අලෙවි කිරීම - (2022 - 2025.09.30 දිනට)	111
ප්‍රස්ථාර 11.1	ඉන්ධන බෙදාහැරීමේ සංයුතිය - 2025	115

සිතියම් 1.1	දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින (Existing), ඉදිකිරීමට එකඟතාව ලැබී ඇති (Committed) සහ ඉදිකිරීමට සැලසුම් කෙරෙන (Candidate) බලාගාර	9
සිතියම් 1.2	2030 දී ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය	15
සිතියම් 12.1	2025 මන්නාරම් ද්‍රෝණියේ බලපත්‍ර වටය සඳහා වෙන් කර ඇති ආසන්න ප්‍රදේශය (SL 2025 - 01)	120

රූප සටහන් 1	LECO බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර්වල බැටරි ගබඩා පද්ධති	20
රූප සටහන් 2	ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය	38

ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

වත්මන් රජය බලයට පත්වී වසරක් සපිරී ඇති මොහොතක "**ප්‍රගති වාර්තාව - 2025**" වෙනුවෙන් මෙම පණිවිඩය නිකුත් කරනුයේ ඉමහත් වූ සතුටිනි. ගෙවී ගිය වර්ෂය දෙස යළි හැරී බලන විට,"පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" යන රජයේ දැක්ම හා අනුගතව බොහෝ වැඩ කටයුතු සාර්ථකව දියත් කරමින් ඒවා නිමාවට පත් කිරීමට මෙම අමාත්‍යාංශය සමත් වී ඇත. එහිදී ප්‍රතිපත්තිමය මට්ටමින් වූ මැදිහත්වීම් කිහිපයක් ද හඳුන්වා දීමට සිදු වූ අතර ඒවා මේ වන විටත් ක්‍රියාවට නංවා ඇත.

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම මෙම කාල පරිච්ඡේදය තුළ අත් කරගැනීමට හැකි වූ සුවිශේෂී ජයග්‍රහණයන් අතරින් එකක් ලෙස හැඳින්විය හැකි ය. මෙය සිදු කරනු ලැබූයේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ පැවති සවිස්තරාත්මක සමාලෝචනයකින් සහ පුළුල් අදහස් විමසීමකින් අනතුරුව ය. යෝජිත ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් අවැසි සියලු විධිවිධාන මේ වන විටත් මෙම සංශෝධන පනතට ඇතුළත් කර ඇති අතර, ලංකා විදුලිබල මණ්ඩලය (CEB) යටතේ නව සමාගම් හතරක් හඳුන්වා දෙනු ලැබීම ද ඒ අතර වේ. ලංකා විදුලිබල මණ්ඩලය සමාගම්වලට බෙදා වෙන් කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු කෙරෙමින් පවතී.

විදුලිය සහ ඉන්ධන ගාස්තු පිළිවෙලින් වසරකට දෙවරක් සහ මාසිකව සමාලෝචනය කරනු ලැබේ. එම සෑම සමාලෝචනයකදී ම, සාමාන්‍ය ජනතාවට මෙන් ම කර්මාන්ත උදෙසා ද උපරිම සහනයක් සැලසීමට සෑම අයුරකින් ම ක්‍රියා කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, පෙර වසරට සාපේක්ෂව ආසන්න වශයෙන් 05% කින් පමණ විදුලි බිල්පත් ගාස්තු අඩුව ඇති අතර, ඉන්ධන මිල ද 10% කින් අඩු වී තිබේ. මෙම සියලු මූලික ක්‍රියාමාර්ග සහ අඛණ්ඩ ප්‍රතිසංස්කරණ දියත් කෙරෙනුයේ විදුලිබල සහ ඛනිජ තෙල් ක්ෂේත්‍රයන් සවිබලගැන්වීමේ පරමාර්ථයෙන් මෙන් ම කලාපය තුළ අවම ගාස්තු අනුපාත සහිත රටක් බවට පත් කරවන්නා වූ පරම ඉලක්කය ද පෙරදැරිවයි.

මෙරට තුළ ඉහළ යමින් පවතින බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා පුනර්ජනනීය බලශක්ති සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා රජය මහත් සේ කැපවී ක්‍රියා කරයි. පාරිසරික ගැටළු කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු කාරක වන පොසිල ඉන්ධන භාවිතයේ සිට පුනර්ජනනීය බලශක්තිය වෙත පරිවර්තනය වීම අද වන විට ගෝලීය වශයෙන් පිළිගැනෙන්නේ ආර්ථික වශයෙන් ශක්‍ය වූ මාවතකට පිවිසීමක් ලෙසයි. මෙම සන්දර්භය තුළ, විදුලිබල ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචනය 25% කින් අඩු කිරීමේ සහ වර්ෂ 2050 වන විට කාබන් උදාසීනත්වය ළඟා කරගැනීමේ අරමුණින් අප විසින් ඇති කර ගෙන ඇති ජාත්‍යන්තර බැඳීම් හා අනුකූල වන පරිදි, වර්ෂ 2030 වන විට විදුලි උත්පාදනයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සපුරාගැනීමට ශ්‍රී ලංකාව කැප වීමෙන් කටයුතු කරමින් සිටියි. 2025 වර්ෂය තුළ පුනර්ජනනීය බලශක්තිය 50% කට වඩා වැඩි මට්ටමකින් අඛණ්ඩව පවත්වා ගෙන යාමට මෙරට සමත් වී තිබේ.

සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් සිදු කරනු ලැබූ අධ්‍යයනයන් මගින් හෙළිදරව් වී ඇති පරිදි මෙරට බලශක්ති අවශ්‍යතාවය ද අභිබවා යාමට සමත් පුනර්ජනනීය බලශක්ති විභවයක් ශ්‍රී ලංකාව සතුවෙයි. එහෙයින්, මෙම අතිවිශාල

විභවය ප්‍රයෝජනයට ගනු ලැබීම සඳහා දූරදර්ශී උපාය මාර්ග සකස් කිරීම අපගේ ප්‍රමුඛතාව වී තිබෙයි. බැටරි බලශක්ති ගබඩා පද්ධති හඳුන්වාදීම, හයිඩ්‍රජන් බලශක්ති යෙදවුම් සහ අනෙකුත් නවීන තාක්ෂණයන් වැනි මුලපිරීම් සම්බන්ධයෙන් මේ වන විටත් සැලසුම් සකස් කෙරෙමින් පවතින අතර ක්‍රමික වූත් ක්‍රමානුකූල වූත් ප්‍රවේශයක් තුළින් ඒවා ක්‍රියාත්මක කරලීමට ඉදිරියේ දී කටයුතු කෙරෙයි.

මෙම ජාතික වගකීම ඉෂ්ට සිද්ධ කිරීම උදෙසා නොපසුබට දායකත්වයකින් උර දෙන බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමාට, කැපවීමෙන් කටයුතු කරනු ලබන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට, අමාත්‍යාංශය යටතේ පවතින්නා වූ ආයතනවල කළමනාකාරිත්වයට සහ සේවකයින්ට මෙන් ම අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ට මේ අවස්ථාවේ දී මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

ඉංජිනේරු කුමාර ජයකොඩි (පා.ම.)
බලශක්ති අමාත්‍ය

ගරු ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සියලුම ජනයාට විදුලිය සහ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා බාධාවකින් තොර ප්‍රවේශයක් සෑම විටම සහතික කිරීම රජයේ වගකීමයි. මෙම ජාතික වගකීම ඉටු කරලීමේ කාර්යය පැවරී ඇත්තේ බලශක්ති අමාත්‍යාංශයටයි. ඒ අනුව, විශ්වසනීය වූ විදුලිබල හා ඉන්ධන සැපයුම් පහසුකම් සම්පාදනය කිරීම අපගේ මූලික වගකීම බවට පත්ව තිබෙන අතර, මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා මෙම අමාත්‍යාංශය බලශක්ති ක්ෂේත්‍රයේ සෑම අංශයක්ම ආවරණය කෙරෙන පරිදි පුළුල් පරාසයක වූ වැඩ කටයුතු සඳහා මුලපුරා ඇත.

2025 වර්ෂය තුළ, නව ව්‍යාපෘති කිහිපයක් හඳුනා ගැනීමටත්, ඒවා සඳහා **ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන්** අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමටත් හැකියාව ලැබී ඇත. මූල්‍ය සම්පත් සලසා ගැනීම, ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම සහ ක්‍රියාත්මක කරනු ලැබීම යනාදී වූ නොයෙකුත් අදියරයන් හි මේ වන විට මෙම ව්‍යාපෘති පසුවෙයි. මෙම වසර තුළ විදුලිබල පද්ධතිය වෙත **මෙ.වො. 600** ඉක්මවූ සැලකිය යුතු **සූර්ය බලශක්ති ධාරිතාවක්** එක් කිරීමටත්, එමඟින් සමස්ත සූර්ය බලශක්ති ධාරිතාව මෙ.වො. 2,000 ඉක්මවීමටත් සමත් වී තිබේ. මීට අමතරව, **සුළං බලශක්ති ව්‍යාපෘති, බැටරි බලශක්ති ගබඩා ව්‍යාපෘති කිහිපයක් සහ පොම්ප බලාගාර ජල විදුලි ව්‍යාපෘතියක්** සඳහා මූලික වැඩ කටයුතු දියත් කර ඇත.

ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ඉදිරිපත් කළ පොරොන්දු කිහිපයක් ම ක්‍රියාත්මක තත්ත්වයට පත් කරවමින් මේ වන විටත් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගැනීමට මෙම අමාත්‍යාංශයට හැකිවී තිබේ. **සපුගස්කන්ද තෙල් පිරිපහදුව** වැඩිදියුණු කිරීමේ සහ අලුත්වැඩියාවට ලක් කිරීමේ වැඩ කටයුතු අරඹා ඇති අතර, නව පිරිපහදුවක් ඉදිකිරීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා ශක්‍යතා අධ්‍යයන ද මේ හා සමගාමීව සිදු කෙරෙමින් පවතී. මීට අමතරව, **ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ටැංකි 24 සහ හවුල්කාර සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන ටැංකි 61** මගින් ජාතික ආර්ථිකය වෙත උපරිම ප්‍රතිලාභ අත්වීම සහතික කරවන නව ව්‍යාපාර ආකෘතියක් සකස් කිරීමත්, ඛනිජ තෙල් ක්ෂේත්‍රය දැනට ක්‍රියාත්මක ගිවිසුම් සමාලෝචනය කිරීමත් සිදු වෙමින් ඇත.

පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි වැඩි පිරිසක් පෙළඹවීම සඳහා ආකර්ෂණීය මිලදී ගැනීමේ ගාස්තු අනුපාතයක් හඳුන්වා දෙනු ලබමින් සහ අවශ්‍ය අවස්ථාවක දී අතිරික්ත විදුලිය ජාතික විදුලිබල පද්ධතිය වෙත එක් කිරීමට ද හැකියාව සලසමින් බැටරි බලශක්ති ගබඩා කිරීමේ පහසුකම සහිත පියැසි පාදක සූර්ය බලශක්ති උත්පාදනය සම්බන්ධයෙන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී. ඒ හා සමගාමීව, විශේෂ අවස්ථා සංවිධානය කරනු ලබමින් පුනර්ජනනීය බලශක්තිය සහ පිවිතුරු බලශක්ති තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම සවිබල ගැන්වීමට ක්‍රියා කර ඇත. **ශ්‍රී ලංකා බලශක්ති සංක්‍රාන්ති සමුළුව 2025, ජාත්‍යන්තර සූර්යබල සන්ධානයේ (ISA) ආසියා සහ පැසිෆික් කලාපීය කමිටුවේ හත්වන රැස්වීම, න්‍යෂ්ටික බලශක්තිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයක භූමිකාවන් සහ වගකීම් පිළිබඳ ජාතික වැඩමුළුව, "උපායමාර්ගයෙන් ක්‍රියාමාර්ග කරා (From Strategy to Action)" යන තේමාව යටතේ පැවති හරිත හයිඩ්‍රජන් පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩමුළුව** මේ අතරින් ප්‍රමුඛ වේ.

මෙම අමාත්‍යාංශය විසින් පහසුකම් සලසනු ලැබූ, පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, රාජ්‍ය තාන්ත්‍රිකයින්, සංවර්ධන හවුල්කරුවන්, මූල්‍ය ආයතන, ජාත්‍යන්තර ප්‍රවීණයින් සහ දේශීය පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුතුව පැවති මෙම සමුළුවලට ඉදිරිගාමී බලශක්ති සංවර්ධනය පිළිබඳ කතිකාවතක් සඳහා අගනා වූ වේදිකාවන් නිර්මාණය කිරීමට හැකියාව ලැබී ඇත.

ඊට අමතරව, බලශක්ති අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ සියලුම පනත් සමාලෝචනය කිරීමෙන් සහ අදාළ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් ලබා ගැනීමෙන් අනතුරුව, නව බලශක්ති සංක්‍රාන්ති පනතක් කෙටුම්පත් කිරීම සඳහා ඉහළ මට්ටමේ කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇත. **ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග** (2019 අගෝස්තු 9 වන දිනැති අංක 2135/61 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) සහ එහි ප්‍රතිඵල සැලසීමේ කාර්යරාමුව (**Result Delivery Framework**) වත්මන් රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සමඟ අනුකූල වන පරිදි සමාලෝචනය කිරීමට ද තවත් කමිටුවක් පත් කර ඇත.

"ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන, **ඩිජිටල් ආර්ථික න්‍යාය පත්‍රය සහ රජයේ දූෂණ විරෝධී වැඩපිළිවෙල** වැනි ජාතික ප්‍රමුඛතාවක් ලබා දී ඇති මුලපිරීම් උදෙසා ද මෙම අමාත්‍යාංශය විසින් සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

2025 වර්ෂය මුළුල්ලෙහි ම මෙම කටයුතු නිසි කාලීනව නිමාවට පත් කිරීම සහතික කරමින් මෙම අමාත්‍යාංශය වෙත උර දුන් සියලුම පාර්ශ්වයන් වෙත මාගේ හදපිරි කෘතඥතාව පුද කර සිටීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි. ජාතියේ බලශක්ති ඉලක්ක ජය ගැනීමේ අප්‍රතිහත උත්සාහයක අප නිරතව සිටින බැවින් 2026 වර්ෂයේ දී ද ඔබගේ නොමඳ සහයෝගය මෙම කර්තව්‍ය සඳහා හිමිවනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මහාචාර්ය කේ.ටී.එම්. උදයංග හේමපාල
ලේකම්
බලශක්ති අමාත්‍යාංශය

හැඳින්වීම

ජෛව ස්කන්ධ ඉන්ධන සහ පොසිල ඉන්ධන භාවිතයෙන් ජල විදුලිය වෙතද ගල් අඟුරු සහ ඛනිජ තෙල් භාවිතයෙන් සූර්ය හා සුළං වැනි පුනර්ජනනීය විදුලිය වෙතද පරිවර්තනය වෙමින් සිටින මෙරට බලශක්ති ක්ෂේත්‍රය තුළ ඉදිරි පියවරක් සනිටුහන් කිරීමට සමත් වූ වර්ෂයක් ලෙස 2025 වර්ෂය හැඳින්විය හැකි ය. ආයතනික ප්‍රතිසංස්කරණ සහිත වූ ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ මෙරට වත්මන් බලශක්ති සංක්‍රාන්තිය කෙරෙහි කැපී පෙනෙන්නා වූ පිටිවහලක් සපයමින් නවීන තාක්ෂණයන් හා සම්බන්ධතා අන්තර්ගත කරගැනීම උදෙසා නව මාවත් ගවේෂණය කරමින් ක්‍රියාත්මක වේ.

රජයේ සංවර්ධන පරමාර්ථ සපුරා ගැනීම පිණිස බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන සමස්ත ප්‍රතිපත්ති සකස් කිරීමේ වගකීම පැවරී ඇත්තේ බලශක්ති අමාත්‍යාංශය (MOE) වෙත ය. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL), ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC) ඇතුළු බලශක්ති ක්ෂේත්‍රයේ නොයෙකුත් නියාමන ආයතන සඳහා වූ ප්‍රතිපත්ති නියෝග සම්පාදනය කිරීමේ බලය බලශක්ති අමාත්‍යාංශය සතුව පවතින අතර විදුලිය, ඛනිජ තෙල්, පුනර්ජනනීය බලශක්තිය සහ පරමාණුක බලශක්තිය ආශ්‍රිත කටයුතු හා නියැලී සිටින නොයෙකුත් රජය සතු ආයතන අධීක්ෂණය කිරීම ද මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන්නේ ය.

2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව පිහිටුවන ලද බලශක්ති අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා සමාජ අභිවෘද්ධිය කෙරෙහි සහාය වීම පිණිස සුරක්ෂිත, විශ්වසනීය හා සුනිත්‍ය බලශක්ති සැපයුමක් සහතික කරනු ලැබීමේ සුවිශේෂී කාර්යභාරයක නියුක්තව සිටියි. කාර්යක්ෂමතාව, නවෝත්පාදනය සහ පාරිසරික වගකීම ඉහළ නැංවීමට කටයුතු කරන අතරවාරයේ, උපාය මාර්ග සකස් කරනු ලැබීම, ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනු ලැබීම සහ මෙරට බලශක්ති අවශ්‍යතා සපුරාලීම උදෙසා රජය සතු ආයතන මෙහෙයවනු ලැබීම "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති රාමුවේ මගපෙන්වීම යටතේ මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරයන් වේ.

රාජ්‍ය හිමිකාරීත්වය සහිත, තනි ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වන ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විදුලිබල ක්ෂේත්‍රය තුළ ආධිපත්‍යය තහවුරු කරගැනීමට සමත්ව සිටින අතර, පෞද්ගලික අංශය විසින් විදුලිය උත්පාදනය සම්බන්ධව, විශේෂයෙන් ම සූර්ය හා සුළං බලශක්ති පාදක කරගත් විදුලි උත්පාදනයේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරමින් ඇත. විදුලිය සම්ප්‍රේෂණය කිරීම ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ද, විදුලිය බෙදාහැරීම ලංකා විදුලිබල මණ්ඩලය සහ රජය සතු සමාගමක් වන ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) යටතේ ද ක්‍රියාත්මක වෙමින් ඇත. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් විදුලිබල ක්ෂේත්‍රය නියාමනය කෙරෙන අතර, උත්පාදනය, සම්ප්‍රේෂණය, පද්ධති මෙහෙයුම් සහ බෙදාහැරීම සම්බන්ධයෙන් වගකිව යුතු, කර්තව්‍ය ප්‍රකාරව වෙන් වෙන්ව ක්‍රියාත්මක වන ආයතනවලට ලංකා විදුලිබල මණ්ඩලය බෙදා වෙන් කිරීම අරමුණු කරගනිමින් මෑතකදී රජය විසින් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත බලාත්මක කර ඇත. 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යම් යම් සංශෝධන ද ඇතුළත්ව 2025 අගෝස්තු මාසයේදී එය සංශෝධනය කර ඇත. ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුකූලව දිගුකාලීන බලශක්ති සංවර්ධන සැලැස්ම (LTPDP) සකස් කිරීමේ සහ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ බලය ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ පිහිටුවීමට නියමිත ජාතික පද්ධති ක්‍රියාකරු වෙත පැවරී ඇත.

ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරනු ලැබූ පොරොන්දු කිහිපයක් ම රජය බලයට පත්වී එක් වසරක් ඇතුළත ක්‍රියාවට නංවමින් සැලකිය යුතු ප්‍රගතියක් කරා ගමන් කිරීමට

මෙම අමාත්‍යාංශය මේ වන විටත් සමත්ව ඇත. සපුගස්කන්ද තෙල් පිරිපහදුව වැඩිදියුණු කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා මුලපුරා ඇති අතර, ඒ හා සමගාමීව නව පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සොයා බැලීම පිණිස ශක්‍යතා අධ්‍යයනයන් ද සිදු කෙරෙමින් ඇත. ඊට අමතරව, ඛනිජ තෙල් සංස්ථාව සතු ටැංකි 24 සහ හවුල්කාර සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන ටැංකි 61 මඟින් ජාතික ආර්ථිකය වෙත උපරිම ප්‍රතිලාභ අත් වීම සහතික කරමින් නව ව්‍යාපාර ආකෘතියක් සකස් කිරීම ඇතුළුව ඛනිජ තෙල් ක්ෂේත්‍රය තුළ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ගිවිසුම් සමාලෝචනය කිරීම ද සිදු වෙමින් ඇත.

මෙම අමාත්‍යාංශය විසින් මෙරට පුරා ඉන්ධන බෙදා හැරීම ශක්තිමත් කරලීම සඳහා උසස් මට්ටමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සඳහා දුම්රිය ඉන්ධන ගබඩා කිරීමේ සහ බෙදා හැරීමේ පද්ධතියේ නවීකරණ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, ඛනිජ තෙල් ඉන්ධන නිෂ්පාදන ගොඩබෑම සහ පැටවීම විශ්වසනීය ලෙස සිදු කිරීම සහතික කෙරෙන පරිදි කොළඹ වරාය සහ කොළොන්නාව පර්යන්තය අතර හානියට පත් වී ඇති නළ මාර්ගය ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) ආයෝජන සහිතව ප්‍රතිසංකරණය කෙරෙමින් ඇත. මෙම ප්‍රයත්නයන් හා සමගාමීව, මන්නාරම සහ කාවේරි ද්‍රෝණි හඳුනාගනු ලැබූ ස්වාභාවික වායු සහ අනෙකුත් පොසිල ඉන්ධන නිස්සාරණය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරෙන නව ගිවිසුම් ද ඇතුළත්ව, පොසිල ඉන්ධන ගවේෂණය කිරීම සහ නිෂ්පාදනය කිරීම කඩිනම් කරලීම උදෙසා තීරණාත්මක ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම මූලික ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ බලශක්ති ස්වාධීනත්වය ඇති කිරීමෙහි ලා වැදගත් පියවරක් තැබීමට සමත් වනු ඇත.

මේ හා සමගාමීව, පුනර්ජනනීය බලශක්තිය සහ පිවිතුරු තාක්ෂණයන් ප්‍රවර්ධනය කඩිනම් කිරීමට කටයුතු කර ඇත. අනාගත සංවර්ධනයන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස පුළුල් සංසදයක් පවත්වනු ලැබීම අරමුණු කරගත් ප්‍රධාන සම්මන්ත්‍රණ ත්‍රිත්වයක් සඳහා මෙම අමාත්‍යාංශය විසින් පහසුකම් සැලසීමට ක්‍රියා කර ඇත. ශ්‍රී ලංකා බලශක්ති සංක්‍රාන්ති සමුළුව-2025 පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්, තීරණ ගනු ලබන ඉහළ පෙළේ නිලධාරීන්, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, සංවර්ධන හවුල්කරුවන් සහ මූල්‍ය ආයතන ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් යුතුව 2025 පෙබරවාරි 27 වන දින කොළඹ සිනමන් ලයිෆ් හෝටල් පරිශ්‍රයේදී පැවැත්වීය. ජාත්‍යන්තර සූර්යබල සන්ධානයේ (ISA) ආසියා සහ පැසිෆික් කලාපීය කමිටුවේ හත්වන රැස්වීම ශ්‍රී ලංකාවේ සත්කාරකත්වයෙන් 2025 ජූලි 15 - 17 දින දක්වා කොළඹදී පැවැත්වීමට කටයුතු කරන ලද අතර එහිදී අන්තර්ක්‍රියාකාරී සැසි වාර සහ ප්‍රදර්ශනයක් ද පැවැත්වීය. ජාත්‍යන්තර ප්‍රවීණයන්ගේ සහ උනන්දුවක් දක්වනු ලබන දේශීය කණ්ඩායම්හි සහභාගීත්වයෙන් යුතුව 2025 සැප්තැම්බර් 11 වන දින හරිත හයිඩ්‍රජන් පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩමුළුව උපායමාර්ගයෙන් ක්‍රියාමාර්ග කරා (From Strategy to Actions) යන තේමාව යටතේ පවත්වනු ලැබීය.

මෙම කාල සීමාව තුළ මෙ.වො.600 කට අධික සූර්ය බලශක්ති ධාරිතාවක් විදුලිබල පද්ධතිය වෙත එක් කර ඇති අතර සුළං බලශක්ති ව්‍යාපෘති, බැටරි බලශක්ති ගබඩා ව්‍යාපෘති සහ පොම්ප ජල විදුලි බලාගාර ව්‍යාපෘති කිහිපයකම ප්‍රාරම්භක කටයුතු දියත් කර ඇත. විදුලි වාහන සඳහා දිවයින පුරා බැටරි ආරෝපණ මධ්‍යස්ථාන ජාලයක් ස්ථාපිත කෙරෙමින් පවතින අතර, මධ්‍යස්ථාන හතක් මේ වනවිටත් ක්‍රියාත්මක තත්ත්වයෙන් ද, තවත් මධ්‍යස්ථාන තුනක ඉදිකිරීම් කටයුතු ද සිදුවෙමින් පවතී. තවද, ඉදිකිරීම, අයිතිය දැරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම (BOOT) පදනම යටතේ, පාවෙන වායු ගබඩා සහ ප්‍රතිවායුකරණ ඒකකය (FSRU) කෙරවලපිටිය සහ කැලණිතිස්ස විදුලි බලාගාර සමඟ සම්බන්ධ කරවීම සඳහා සැලසුම් කරනු ලැබූ, ඇ.ඩො. මිලියන 40 ක වටිනාකමකින් යුතු, එහෙත් 2023 වර්ෂයේ දී අත්හිටුවනු ලැබූ ප්‍රතිවායුකරණය කරන ලද ස්වභාවික වායු (R-LNG) ප්‍රවාහන නළ මාර්ග ව්‍යාපෘතිය, 2025 මාර්තු මාසයේදී ඊට අදාළව ව්‍යාපෘති කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් යළි පත් කිරීමත් සමඟ නැවත ක්‍රියාවට නංවා ඇත.

මෙම මූලික ක්‍රියාමාර්ගයන්ට අමතරව, මෙම අමාත්‍යාංශය විසින් සිය ප්‍රධාන ආයතන වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC),

ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL), ලංකා විදුලිබල මණ්ඩලය (CEB), ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO), ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) යන ආයතන සඳහා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම ලබා දීමට සහ සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීමට අඛණ්ඩව කටයුතු කරමින් ඇත. උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, ගබඩා කිරීම සහ බලශක්ති සම්පත් නියාමනය කිරීම සඳහා මෙම ආයතන එක්ව දායකත්වය ලබා දෙමින් සිටින අතර පුනර්ජනනීය බලශක්තිය ක්‍රියාවට නැංවීම සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ කටයුතු ප්‍රගතිය කරා මෙහෙයවමින් ඇත. මෙරට තුළ න්‍යෂ්ටික බලශක්ති යෙදවුම් සංවර්ධනය කිරීම හා අදාළව සිය කටයුතු නොනවත්වා ඉදිරියට ගෙන යාමට ක්‍රියා කරමින් සිටින ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC) සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) විදුලිබලය උත්පාදනය කිරීම පිණිස න්‍යෂ්ටික බලශක්තිය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ සහ සැලසුම් කිරීමේ වැඩසටහන ද අඛණ්ඩව ඉදිරියට ගෙන ගොස් ඇත. මෙම කාල සීමාව තුළ ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC), ශ්‍රී ලංකා එනර්ජීස් සමාගම (SLE) සහ එල්ටීඑල් හෝල්ඩින්ග්ස් සමාගම (LTL) විසින් සිය මෙහෙයුම් සහ සංවර්ධන කටයුතු ද නොකඩවා පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

මෙම වාර්ෂික වාර්තාව මඟින් වාර්තා කෙරෙන වර්ෂය තුළ මෙම අමාත්‍යාංශයේ සහ එහි අනුබද්ධිත ආයතනවල ප්‍රගතිය, කාර්ය සාධනය සහ ප්‍රධාන ජයග්‍රහණ පිළිබඳ ඉදිරිපත් කර ඇත. ප්‍රතිපත්ති සකස් කිරීම්, යටිතල පහසුකම් ආයෝජන, මෙහෙයුම් ප්‍රතිඵල සහ මුහුණ දුන් අභියෝග පිළිබඳව මෙමඟින් අවධාරණය කරන අතර ම, බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම, පුනර්ජනනීය බලශක්තිය පුළුල් කිරීම සහ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සමඟින් මෙම ක්ෂේත්‍රය අනුගත කරවීම උදෙසා ගනු ලැබූ සාමූහික ප්‍රයත්නයන් පිළිබඳව ද ගෙනහැර දක්වයි.

සාධනීය නියාමනය, ශක්තිමත් ආයතනික සහයෝගීත්වය ඔස්සේ බලශක්ති ක්ෂේත්‍රය තුළ පරිවර්තනයක් ඇති කිරීමෙහි ලා මෙම අමාත්‍යාංශය ඇප කැප වී ක්‍රියා කරන අතර, එමගින් ප්‍රත්‍යාස්ථ සහ බලශක්ති-සුරක්ෂිතතාව තහවුරු කළ අනාගතයක් පිළිබඳ ශ්‍රී ලංකාවේ දැක්ම උදෙසා සිය දායකත්වය සපුරාලීමට කටයුතු කරමින් සිටියි.

පළමුවන පරිච්ඡේදය

බලශක්ති අමාත්‍යාංශය

දැක්ම

"ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීම"

මෙහෙවර

විදුලිබල අංශය

"ජාතික ආර්ථික සෞභාග්‍යය උදෙසා අවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසර හා මිල දැරිය හැකි විදුලිබල සැපයුමක් සහතික කිරීම"

මෙහෙවර

බලශක්ති අංශය

"ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම"

1.1 අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්

2024 නොවැම්බර් මස 25 දිනැති අංක 2412/08 දරන ගැසට් නිවේදනය අනුව බලශක්ති අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් පහත පරිදි වේ.

- සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මඟින් පුනර්ජනන බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්ති නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය
- ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාව සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම
- බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම
- දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- බලශක්ති සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම
- ජනනය කරනු ලබන විදුලිබලය උපරිම කාර්යක්ෂමතාව සහිතව භාවිතා කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම
- විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩුකිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම
- පවතින අධික වියදම් සහිත විදුලි උත්පාදන ප්‍රභවයන් අඩු වියදම්, පරිසර හිතකාමී, පුනර්ජනනීය ප්‍රභවයන් සමඟ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජන සඳහා දේශීය සමාගම්වලට සමාන අවස්ථා ලැබෙන බව සහතික කිරීම
- කාර්මික අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්ති උත්පාදනය වැඩි කිරීම
- සමුපකාර මූලධර්ම මත පදනම්ව බලශක්ති ඒකක ලෙස ක්ෂුද්‍ර ජාල ස්ථාපිත කිරීම
- බලශක්ති ක්ෂේත්‍රයේ උපාය මාර්ගික හවුල්කාරිත්වයන් සහ ආයෝජන අවස්ථා ඇති කිරීම
- විශේෂයෙන්ම පවතින ගිවිසුම් අලුත් කිරීම මඟින් කුඩා පරිමාණ ජල විදුලි උත්පාදනය සඳහා නැවත ආයෝජනය කිරීම දිරිමත් කිරීම
- විදුලි බිල යාවත්කාලීන කිරීම සහ ඛනිජ තෙල් සහ ගෑස් සඳහා මිල සූත්‍රය යෙදීම සඳහා වඩාත් සාධාරණ හා විනිවිද පෙනෙන ක්‍රමයක් හඳුන්වා දීම
- දිගු කාලීන අවශ්‍යතා මත බලශක්ති උත්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- ආයතනික කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු සහ විදුලි ජනන හා බෙදාහැරීමේ පද්ධතියට සිදුවන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- විදුලි වාහන භාවිතයට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම
- ශ්‍රී ලංකාව බලශක්ති වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම සඳහා කටයුතු කිරීම
- හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම
- ග්‍රාමීය විද්‍යුතනය
- ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම
- ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
- ඛනිජ තෙල් හා ස්වාභාවික ගෑස් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු
- ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් හා අතුරු නිෂ්පාදන වලට අදාළ කටයුතු තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය හා බෙදාහැරීම
- ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
- තෙල් පිරිපහදු කිරීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ පෙට්‍රෝලියම් ද්වි-නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත දිරිමත් කිරීම

- ඉන්ධන සැපයීමේ විශ්වසනීයත්වය, අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

1.2 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ

බලශක්ති අමාත්‍යාංශය පහත සඳහන් අංශ වලින් සමන්විත වේ.

- සංවර්ධන අංශය
- විදුලිබල හා විදුලිබල ප්‍රතිසංස්කරණ අංශය
- තාක්ෂණික අංශය
- මානව සම්පත් අංශය
- කාර්යසම්පාදන අංශය
- සැලසුම් අංශය
- ප්‍රසම්පාදන අංශය
- මූල්‍ය අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ
- ලේකම් කාර්යාලය

1.3 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

- ලංකා විදුලිබල මණ්ඩලය (CEB)
- සී/ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO)
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA)
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC)
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB)
- සී/ස. ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC)
- සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම (SLE)
- සී/ස. එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම (LTL)
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)
- ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)
- ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL)
- ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගම (TPTL)

2025 ඔක්තෝබර් 18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන ගැසට් නිවේදනය සංශෝධනය කර ඇති අතර පහත සඳහන් ආයතන බලශක්ති අමාත්‍යාංශයෙන් ඉවත් කර ඇත;

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව.
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය.

එමෙන්ම පහත සඳහන් නව ආයතන ඇතුළත් කර ඇත.

- ජාතික පද්ධති පාලන (පුද්ගලික) සමාගම
- ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම් (පුද්ගලික) සමාගම
- විදුලිබල බෙදාහැරීමේ ලංකා (පුද්ගලික) සමාගම
- විදුලි ජනන ලංකා (පුද්ගලික) සමාගම

1.4 2025 වසරේ විදුලිබල අංශයේ කාර්යසාධනය

2025 වසරේ දී මහා පරිමාණ නව සංවර්ධන ව්‍යාපෘති බොහෝමයක් සඳහා මුලපිරීමට හැකි වී ඇත. මෙ.වො. 50 සාම්පූර් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය, අදියර II - මන්නාරම මෙ.වො. 50 සුළං බලශක්ති ව්‍යාපෘතිය, සියඹලාණ්ඩුව මෙ.වො.100 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය, කොලොන්නාව මෙ.වො.100/මෙ.වො.පැ.100 බැටරි බලශක්ති ගබඩා පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සහ ඉදි කිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම මත මෙ.වො.50 මුල්ලිකුලම් සුළං ව්‍යාපෘතියේ ටෙන්ඩර් ක්‍රියාවලිය ඇතුළුව විදුලිබල පද්ධතිය සවිබලගැන්වීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය යටතේ වන පැකේජ 7 ඊට අයත් ය. මීට අමතරව, ලංකා විදුලිබල මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතාව නඟා සිටුවීමේ ව්‍යාපෘතියේ පැකේජ හතරක්, විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමේ ව්‍යාපෘතිය (SESRIP) - පැකේජය 4, නව හබරණ - කප්පල්තුරෙයි කි.වෝ. 220

සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය, සාම්පූර් කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය සහ නව අනුරාධපුර නව හබරණ, කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ව්‍යාපෘතිය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙමින් ඇත. ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය සිදු කෙරෙන ආගමික ස්ථානවල පියැසි පාදක සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සහ ඉන්දීය රජයේ ප්‍රදාන පහසුකම මගින් අරමුදල් සපයන ඩෙල්ෆ්ට්, අනලතිව්, නයිනතිව් යන යාපනයේ කුඩා දූපත් හි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති වේ.

තවද, කෙරවලපිටිය අක්වෙරළෙහි ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීමේ (BOO) පදනම මත පාවෙන වායු ගබඩා සහ ප්‍රතිවායුකරණ ඒකකයක් (FSRU), හා ඉදිකිරීම, අයිතිය දැරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීමේ (BOOT) පදනම මත ඊට ගැළපෙන නැංගුරම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, සහ කි.වෝ. 220 දෙවන භූගත කේබලය කෙරවලපිටියේ සිට කොළඹ ග්‍රිඩ් උපපොළ දක්වා ඉදිකිරීම මේ වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රාරම්භක අදියරේ පසුවේ. මහ ඔය පොම්ප කළ ජල ගබඩා විදුලි බලාගාර පුළුල් සැලැස්ම, උතුරු කරයේ කි.වෝ.400 සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම, පාදුක්ක කි.වෝ. 220 ග්‍රිඩ් උපපොළෙහි STATCOM ඒකකය ස්ථාපනය කිරීම, නව හබරණ හි මෙ.වො.ඇ. 75 සමමුහුර්ත ධාරිත්‍රක (Synchronous Condenser) ඒකකයක් ස්ථාපනය කිරීම, ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් අංශ හතර සඳහා අධීක්ෂණ පාලන දත්ත උකහා ගැනුම් පද්ධති (SCADA) පිහිටුවීම සහ මීගමු ප්‍රදේශය තුළ ලංකා විදුලි පුද්ගලික සමාගමේ බෙදාහැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ණය පිළිබඳ සම්මුති සාකච්ඡා සිදු වන අදියරේ පවතින්නා වූ නව ව්‍යාපෘති වේ. ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ක්ෂේත්‍රයෙහි බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක ගොඩනැගිලිවල බලශක්ති කාර්යක්ෂමතාව සඳහා වන හවුල්කාරිත්ව ව්‍යාපෘතිය (PEEB), පියැසි පාදක සූර්ය බලශක්තිය එක්කිරීමේ සහ අනත්‍ය ශුද්ධ මනුකරණය පිළිබඳ ව්‍යාපෘතිය සහ පුනර්ජනනීය බලශක්තිය අන්තර්ගත කරගැනීමේ සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (LECO) විදේශ ප්‍රදාන අනුග්‍රහය යටතේ මුල පිරීමට නියමිත ව්‍යාපෘති වේ. වසර 15 ක මෙහෙයුම් කාල සීමාවක් සහිතව ඉදි කිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීම (BOO) යන පදනම මත මෙ.වො. 10/මෙ.වො.පැ. 40 ප්‍රත්‍යාවර්ථ ධාරා (AC) ධාරිතාවක් සහිත මෙ.වො. 160/මෙ.වො.පැ. 640 තනි බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) ස්ථාපිත කිරීමේ ව්‍යාපෘත ස්ථාන 16 ක දී ආරම්භ කිරීමට නියමිත ය. ඉහත ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් අනුමැතීන් ලබා ගැනීම 2025 වසර තුළ සිදු කර ඇති අතර, දැනට එම ව්‍යාපෘති මූල්‍ය සම්පත් සලසා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ හෝ ක්‍රියාත්මක කිරීමේ ආදී වූ අදියරයන් හි පසු වේ.

කෙරවලපිටිය සොබාදනවි (මෙ.වො. 350 ධාරිතාවකින් යුතු) දෙවන ඒකාබද්ධ චක්‍රීය ව්‍යාපෘතිය සහ හබරණ-වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය යනාදී ව්‍යාපෘති කිහිපයක් ම 2025 වසර තුළ මේ වන විටත් මෙහෙවරෙහි යොදවා ඇත. හම්බන්තොට ග්‍රිඩ් උපපොළේ බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් ස්ථාපනය කිරීම සහ බස්නාහිර පළාත් දකුණ සඳහා අධීක්ෂණ පාලන දත්ත උකහාගැනුම් පද්ධතියක් (SCADA) සහිත උසස් බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානයක් පිහිටුවීම යන ව්‍යාපෘති 2025 වසර අවසානයට පෙර මෙහෙවරෙහි යෙදවීමට නියමිත ය.

2025 වසර තුළ විදුලිබල පද්ධතිය වෙත මෙ.වො. 600 කට වඩා වැඩි සූර්ය බලශක්ති ධාරිතාවක් එක් කිරීමෙන්, සමස්තය ආසන්න වශයෙන් මෙ.වො. 2000 ඉක්මවා ගොස් ඇති අතර තුළ සුළං බලශක්ති ව්‍යාපෘති, බැටරි බලශක්ති ගබඩා ව්‍යාපෘති සහ පොම්ප කළ ජල ගබඩා විදුලි බලාගාර ව්‍යාපෘති කිහිපයක ප්‍රාරම්භක කටයුතු මෙම කාල සීමාව තුළ අරඹා ඇත. විදුලිය මිලදී ගැනීමේ දී ඉහළ ගාස්තු අනුපාතයක් හඳුන්වා දෙනු ලබමින්, අවශ්‍ය විටෙක දී එසේ ගබඩා කළ බලශක්තිය ජාතික විදුලිබල පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීමේ හැකියාව සැලසෙන පරිදි බැටරි බලශක්ති ගබඩා පහසුකම් සහිත පියැසි

පාදක සූර්ය බලශක්ති උත්පාදනය දිරිගැන්වීමට කටයුතු කර ඇත. ඒ හා සමගාමීව, අනාගත සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පුළුල් වූ පොදු වේදිකාවක් සැකසීම වෙනුවෙන් ප්‍රධාන සමුළු තුනක් මෙම අමාත්‍යාංශය විසින් පහසුකම් සලසා ක්‍රියාත්මක කළ අතර, එමගින් පුනර්ජනනීය බලශක්තිය සහ පිවිතුරු තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම කඩිනම් කරවීමට හැකියාව ලැබී ඇත. "ශ්‍රී ලංකා බලශක්ති සංක්‍රාන්ති සමුළුව 2025", "ජාත්‍යන්තර සූර්යබල සන්ධානයේ ආසියා සහ පැසිෆික් කලාපීය කමිටුවේ හත්වන රැස්වීම", "න්‍යෂ්ටික බලශක්තිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයක භූමිකාවන් සහ වගකීම් පිළිබඳ ජාතික වැඩමුළුව" සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්, තීරණ ගනු ලබන ඉහළ නිලධාරීන්, රාජ්‍ය තාන්ත්‍රිකයින්, සංවර්ධන හවුල්කරුවන් සහ මූල්‍ය ආයතන, ජාත්‍යන්තර විශේෂඥයින් සහ උනන්දුවක් දක්වනු ලබන දේශීය කණ්ඩායම් ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් " උපායමාර්ගයෙන් ක්‍රියාමාර්ග කරා" යන තේමාව යටතේ "හරිත හයිඩ්‍රජන් පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩමුළුව" පැවැත්වීමට කටයුතු කර ඇත.

බලශක්ති අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සියලුම පනත් සමාලෝචනය කර අදාළ පාර්ශ්වකරුවන්ගේ එකඟතාව ලබා ගැනීමෙන් අනතුරුව නව "බලශක්ති සංක්‍රාන්ති පනත" සකස් කිරීම සඳහා ඉහළ මට්ටමේ කමිටුවක් පත් කර ඇත. 2019 අගෝස්තු 9 වන දිනැති අංක 2135/61 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ දැනට ක්‍රියාත්මක "ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග" සමාලෝචනය කිරීම සඳහා තවත් කමිටුවක් පත් කර ඇති අතර වත්මන් රජයේ ප්‍රතිපත්ති සමග ඒකාබද්ධ කරමින් එහි "ප්‍රතිඵල සැලසීමේ කාර්යරාමුව" ඇගයීමට ලක් කර ඇත.

1.4.1. 2025 වසරේ විදුලි පරිභෝජනය

මෙරට බෙදාහැරීම් බලපත්‍රලාභීන් ලෙස ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම කටයුතු කරන අතර පාරිභෝගිකයින්ට පහසුවෙන් ප්‍රවේශ වෙමින් භාවිත කළ හැකි පරිදි "CEBAssist" සහ "MyLECO" යන යෙදවුම් ඔවුන් විසින් හඳුන්වා දී ඇත. නිසි කලට බිල්පත් ගෙවීම් සිදු කිරීම සඳහා SMS සහ මාර්ගගත බිල්පත් පද්ධති ද හඳුන්වා දී ඇත. 2025 වසරේ සැප්තැම්බර් මස දක්වා වාර්තා වූ මුළු විදුලි පාරිභෝගිකයින් සංඛ්‍යාව 7,772,159 කි. ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් සිය පාරිභෝගිකයින් සඳහා සුහුරු විදුලි මනු (ස්මාර්ට් මීටර්) 148,000 ක් සපයා ඇති අතර පියැසි පාදක සූර්ය බලශක්ති පැනල 28,789 ක් සම්බන්ධ කරවා ඇත. ලංකා විදුලිබල මණ්ඩලය සුහුරු විදුලි මනු 500,000 කට ආසන්න ප්‍රමාණයක් සපයා ඇති අතර පියැසි පාදක සූර්ය බලශක්ති පැනල 110,000 ක් සම්බන්ධ කරවා ඇත.

වගුව 1.1 -
2025 සැප්තැම්බර් මස අවසානය වන විට
පාරිභෝගික සංඛ්‍යාව

	කාණ්ඩය	ලං.වි.ම.	ලං.වි.පු.ස.	මුළු එකතුව
1	ගෘහස්ථ	6,114,071	518,875	6,632,946
2	ආගමික ස්ථාන	44,533	2,820	47,353
3	කර්මාන්ත	72,556	3,550	76,106
4	පොදු කාර්යය	892,790	105,969	998,759
5	හෝටල්	866	100	966
6	රාජ්‍ය ආයතන	9,271	432	9,703
7	කෘෂිකාර්මික කටයුතු	4,377	-	4,377
8	වීදි ආලෝකකරණය	-	1,949	1,949
	එකතුව	**7,138,464**	**633,695**	**7,772,159**

මූල්‍ය අර්බුද තත්ත්වය හේතුවෙන් පසුගිය වසරවල විදුලි පරිභෝජනය සඳහා ඇති ඉල්ලුම පහත වැටී තිබුණු අතර ආර්ථිකය මෙන්ම සාමාන්‍ය ජන ජීවිතය යථාතත්ත්වයට පත් වෙමින් පැවතීමත් සමග එය ක්‍රම ක්‍රමයෙන් ඉහළ යන බව දක්නට ඇත. පසුගිය වසර 15 තුළ දී ඉල්ලුම වර්ධනය වී ඇත්තේ වාර්ෂිකව 4.1% ක සාමාන්‍ය අනුපාතයකින් වන අතර උපරිම ඉල්ලුම වැඩි වී ඇත්තේ වසරකට 2.6% ක ප්‍රතිශතයකින් ය.

විදුලිය උත්පාදනය කරනු ලබන්නේ රටේ වත්මන් ඉල්ලුම මත පදනම්ව ය. 2024 වසරේ දී ශුද්ධ උත්පාදනය ගි.වො.පැ. 16,802 ක් වූ අතර එය 2023 වසරට වඩා 7.9% කින් වැඩි වී ඇත. 2024

වසරේ දී එක් දිනක උපරිම ඉල්ලුම මෙ.වො.පැ. 2,673 ක් ලෙස වාර්තා වී තිබූයේ පෙර වසරට වඩා 10.7% ක ඉහළ යාමක් පෙන්නුම් කරමිනි. 2025 වසරේ මුල් මාස හය තුළ 4.7% ක ඉහළ යාමක් පෙන්නුම් කරමින් ශුද්ධ උත්පාදනය ගි.වො.පැ. 8,678 ක් ලෙස වාර්තා වී තිබූ අතර පෙර වසරේ එම කාල සීමාවට සාපේක්ෂව 10% ක ඉහළ යාමක් පෙන්නුම් කරමින් එක් දිනක උපරිම ඉල්ලුම මෙ.වො. 2,778 ක් ලෙස වාර්තා වී ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ වෙබ් අඩවියෙන් ලබාගත් මෑතකාලීන උත්පාදන පිළිබඳ සාරාංශය (2025 ඔක්තෝබර් 14) පහත ප්‍රස්ථාරයෙන් දක්වා ඇත. එහි දී අළුයම කාලයේ සහ රාත්‍රී කාලයේ

යුතු පුනර්ජනනීය බලශක්තිය විශාල ලෙස විදුලිබල පද්ධතිය වෙත එක් කෙරෙන විට පද්ධතියේ ස්ථායිතාව පවත්වාගැනීමට කටයුතු කිරීමට සිදුවීම ශ්‍රී ලංකාවේ විදුලිබල ජාලය සම්බන්ධයෙන් උද්ගතව ඇති කඩිනමින් සලකා බැලිය යුතු ගැටළුව වී තිබේ.

1.4.2. විදුලිය උත්පාදනය

අ). උත්පාදන මිශ්‍රණය

ශ්‍රී ලංකාව සතුව ඇත්තේ විවිධාංගීකරණය වූ විදුලිබල උත්පාදන මිශ්‍රණයක් වන අතර ලංකා විදුලිබල මණ්ඩලය සහ පුද්ගලික විදුලි

ප්‍රස්තාරය 1.1
එක් එක් ප්‍රභවයේ ප්‍රමාණයන් සහිතව 2025 ඔක්තෝබර් 14 වන දිනට දිවා කාලයේ උත්පාදන සාරාංශය



මූලාශ්‍රය : ලං.වි.ම.

උපරිම ඉල්ලුමක් ඇති වන අවස්ථා (peaks) දෙකක් පෙන්නුම් වන අතර රාත්‍රී කාලයේ ඇති වන උපරිම ඉල්ලුමේ දී ඊට අවශ්‍ය විදුලි සැපයුම ජනනය කිරීම සඳහා තාප විදුලි බලාගාර සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වේ. සූර්ය, සුළං සහ කුඩා ජල විදුලි බලාගාර උත්පාදනයන් අවස්ථිතිය-රහිත විචල්‍ය ස්වභාවයක් ගන්නා අතර සමස්ත උත්පාදනයෙන් 60% කට වඩා වැඩි ප්‍රමාණයකට දායකත්වය ලබා දේ. විචල්‍ය ස්වභාවයකින්

නිෂ්පාදකයින් විසින් හිමිකාරීත්වය දරනු ලබන පුනර්ජනනීය (ප්‍රධාන ජල විදුලි, කුඩා ජල විදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ, ජෛව ස්කන්ධ සහ නාගරික අපද්‍රව්‍ය) සහ පොසිල ඉන්ධන පාදක (ගල් අඟුරු, දැවි තෙල්) විදුලි උත්පාදන බලාගාරවලින් එය සමන්විත වේ. වගුව 1.2 මඟින් පළමු මාස හය තුළ විදුලිබල උත්පාදන පිළිබඳ දත්ත දක්වා ඇති අතර ප්‍රස්තාරය 1.2 මඟින් මුළු විදුලි උත්පාදනය සඳහා උත්පාදන මිශ්‍රණයේ දායකත්වය ප්‍රතිශත ලෙස දක්වා ඇත.

වගුව 1.2

මුළු විදුලි උත්පාදනය සඳහා උත්පාදන මිශ්‍රණයේ දායකත්වය ප්‍රතිශත ලෙස

	ලංවිම සිදු කළ උත්පාදන	ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් (ස්.බ.නි.) සිදු කළ උත්පාදන
ප්‍රධාන ජල විදුලි	2,975	-
දැවි තෙල්	619	395
තාප ගල් අඟුරු	2,682	-
සුළං	166	181
කුඩා ජල විදුලි	-	712
භූමිය මත ස්ථාපිත සූර්ය පැනල	-	136
පියැසි මත ස්ථාපිත සූර්ය පැනල	-	711
ඩෙන්ඩ්‍රෝ	-	53
ජෛව ස්කන්ධ	-	10
නාගරික අපද්‍රව්‍ය	-	37
එකතුව	6,442	2,236
මුළු එකතුව	**8,678**	

මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ප්‍රස්තාරය 1.2

මුළු විදුලි උත්පාදනය සඳහා උත්පාදන මිශ්‍රණයේ දායකත්වය ප්‍රතිශත ලෙස



ආ). ස්ථාපිත ධාරිතාව

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදනයේ ස්ථාපිත ධාරිතාව මෙ.වො. 6,521 කි. එය පුනර්ජනනීය (සමස්ත මෙ.වො. 4,338 ක් ආසන්න වශයෙන් මුළු ස්ථාපිත ධාරිතාවෙන් 66.5% ක් පමණ) සහ පුනර්ජනනීය නොවන (පොසිල ඉන්ධන මත සමස්ත මෙ.වො. 2,183) ලෙස වර්ගීකරණය කළ හැකිය. ප්‍රධාන ජල විදුලි බලාගාර සාම්ප්‍රදායික පුනර්ජනනීය බලශක්තිය ලෙස සලකනු ලබන අතර අනෙකුත් පුනර්ජනනීය මූලාශ්‍ර සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය ලෙස සැලකේ.

වගුව 1.3

2025 ජුනි මස අවසානය වන විට ස්ථාපිත ධාරිතාව (මෙ.වො. ඒකක වලින්)

උත්පාදන මූලාශ්‍රය	ලං.වි.ම	ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් (ස්.බ.නි.)	එකතුව
පුනර්ජනනීය			
01 ප්‍රධාන ජල විදුලි/ කුඩා ජල විදුල	1,533	435	1,968
02 සුළං	104	163	267
03 භූමිය මත ස්ථාපිත සූර්ය පැනල	-	172	172
04 පියැසි මත ස්ථාපිත සූර්ය පැනල	-	1,868	1,868
05 ඩෙන්ඩ්‍රෝ	-	27	27
06 ජෛවස්කන්ධ		26	26
07 නාගරික අපද්‍රව්‍ය	-	10	10
එකතුව	*1,637*	*2,701*	*4,338*
පොසිල ඉන්ධන			
08. දැවි තෙල්	801	482	1,283
09. ගල් අඟුරු	900	-	900
එකතුව	*1,701*	*482*	*2,183*
මුළු එකතුව			**6,521**

මූලාශ්‍රය : ලං.වි.ම.

වසර 2030 වන විට විදුලි ඉල්ලුමෙන් 70% ක් පුනර්ජනනීය මූලාශ්‍රයන්ගෙන් සපුරාගැනීම සහ වසර 2050 වන විට කාබන් උදාසීනත්වය ළඟා කර ගැනීම ශ්‍රී ලංකා රජයේ අරමුණ වී තිබේ. ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ "2025-2044 දිගු කාලීන විදුලි ජනන සැලැස්ම" හි දැක්වෙන සැලසුම්ගත සමුච්චිත ධාරිතාව පිළිබඳ මාර්ග සිතියම පහත ප්‍රස්තාරයෙන් දැක්වේ. වසර 2050 වන විට කාබන් උදාසීනත්වය ළඟා කර ගැනීම අරමුණු කරගනිමින් විචල්‍ය ස්වභාවයෙන් යුතු පුනර්ජනනීය බලශක්ති පද්ධති විශාල ප්‍රමාණයක් ස්ථාපනය කිරීමට කටයුතු කෙරේ. විචල්‍ය ස්වභාවයෙන් යුතු පුනර්ජනනීය බලශක්තිය විදුලිබල පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගනිමින් වැඩි වශයෙන් පද්ධතිය වෙත අවශෝෂණය කරවීමට නව තාක්ෂණයන් හරහා ඉඩ සැලසෙනු ඇත.

ප්‍රස්තාරය 1.3

දිගුකාලීන විදුලි ජනන සැලැස්මේ දැක්වෙන පරිදි අපේක්ෂිත ධාරිතා පුළුල් කිරීම



මූලාශ්‍රය : ලං.වි.ම.

ප්‍රධාන ජල විදුලි බලාගාර 19ක්, තාප තෙල් බලාගාර 8ක්, එක් ගල් අඟුරු බලාගාරයක් සහ එක් සුළං බලාගාරයක් ඇතුළුව මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය හිමිකාරීත්වය දරන මුළු බලාගාර සංඛ්‍යාව 29කි. ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් සතුවන කුඩා ජල විදුලි බලාගාර 217ක්, සුළං බලාගාර 19ක්, විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇති සූර්ය බලාගාර 93ක්, අනෙකුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර 15ක් සහ තාප තෙල් බලාගාර දෙකක් වශයෙන් ක්‍රියාත්මක මුළු බලාගාර සංඛ්‍යාව 346කි.

දැනට ක්‍රියාත්මක බලාගාර සහ ඉදිකිරීමට එකඟතාව ලැබී ඇති බලාගාර (මේ වන විට ක්‍රියාත්මක සහ සැලසුම් කර ඇති ව්‍යාපෘති) පිළිබඳ පහත සිතියමෙහි දැක්වේ.

සිතියම 1.1
දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින (Existing), ඉදිකිරීමට එකඟතාව ලැබී ඇති (Committed) සහ ඉදිකිරීමට සැලසුම් කෙරෙන (Candidate) බලාගාර





No	POWER PLANT	CAPACITY MW
	Hydro Power Plants (Existing)	
1	Canyon ▲	60
2	Wimalasurendra ▲	50
3	New Laxapana ▲	100
4	Old Laxapana ▲	50
5	Polpitiya ▲	90
6	Kotmale ▲	201
7	Victoriya ▲	210
8	Randenigala ▲	120
9	Rantembe ▲	50
10	Ukuwela ▲	40
11	Bowatenna ▲	40
12	Samanalawewa ▲	120
13	Udawalawe ▲	06
14	Inginiyagala ▲	11
15	Nilambe ▲	03
16	Kukule ▲	75
17	Upper Kotmale ▲	150
18	Broadlands ▲	35
19	Uma Oya ▲	122
	Hydro Power Plants (Committed)	
20	Moragolla ✱	30
	Other Renewable(Existing)	
21	Mannar Wind Park	100
	Thermal Power Plants (Existing)	
A	Lakvijaya Coal Power Plant ▲	900
B	Kelanithissa CCY1, CCY2 ▲	165,163
C	Sapugaskanda PP ▲	160
D	Uthuru Janani ▲	27
E	CEB Barge Mounted Plant ▲	62
F	West Coast PP ▲	270
	Thermal Power Plants (Committed)	
G	Sobadhanavi Combine Cycle Plant ✱	350
H	Natural Gas Combine Cycle Plant Kelawarapitiya - ii ✱	350
I	IC Engine ✱	200
J	Kelanithissa GT ✱	130

මූලාශ්‍රය : ලං.වි.ම.

ඇ. විදුලිබල උත්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘති

i. ප්‍රධාන ජල විදුලි ව්‍යාපෘති

- **මොරගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙ.වො. 30.5)**

මොරගොල්ල ව්‍යාපෘතිය යනු මහනුවර දිස්ත්‍රික්කයේ උලපනේ ප්‍රදේශයේ පිහිටා ඇති, මහවැලි ගඟේ ජලය උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක වන ප්‍රධාන ජල විදුලි ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත වාර්ෂික විදුලි උත්පාදනය ගි.වො.පැ. 100.5 කි. වේල්ල, විදුලි බලාගාරය සහ උමං මාර්ග ඉදිකිරීම 2025 වසර තුළ අවසන් කෙරෙන අතර, සැප්තැම්බර් මාසය අවසන් වන විට 90% ක භෞතික ප්‍රගතියක් සහ 90% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. ආසියානු සංවර්ධන බැංකුව (ADB) මූල්‍ය ආධාර ලබා දී ඇති අතර මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 19,288 කි.

වේල්ලේ ඉදිකිරීම් කටයුතු

බලාගාරයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික කොටස් ස්ථාපනය

ii. සූර්ය බලශක්ති ව්‍යාපෘති

- **සියඹලාණ්ඩුව භූමිය මත ඉදිකෙරෙන සූර්ය බල උද්‍යානය (මෙ.වො. 100)**

මෙම සූර්ය බලාගාරයෙන් මෙගවොග 100 ක විදුලියක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනට ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුවන අතර ප්‍රවේශ වීමේ මාර්ග සහ මායිම් සලකුණු කිරීම් වැනි සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. ටෙන්ඩරය ප්‍රදානය කර ඇති අතර බලශක්ති බලපත්‍රය නිකුත් කර ඇත. 2024.08.02 දින විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් තබා ඇත. මෙම ව්‍යාපෘතිය Wind Force PLC, සීමාසහිත ලක්දනව් සමාගම, සහ සිංගප්පූරුවේ The Blue Circle Pvt. Ltd. සමාගම සමග හවුල්කාරිත්වයෙන් යුතුව ක්‍රියාත්මක වේ. සංවර්ධකයා සමග සම්ප්‍රේෂණ ගිවිසුම, ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම සහ ඉඩම් බදු ගිවිසුම අත්සන් තබා ඇති අතර මෙම ව්‍යාපෘතිය මාස 18ක් ඇතුළත අවසන් කෙරෙනු ඇත.

- **සාම්පූර් සූර්ය බලාගාර ව්‍යාපෘතිය (මෙ.වො. 135) - අදියර i (මෙ.වො. 50)**

මෙ.වො. 135ක් දක්වා පුළුල් කිරීමේ හැකියාව ඇති පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මෙම ද්විත්ව අදියර ව්‍යාපෘතියෙහි, මෙ.වො. 50 පළමු අදියරේ කටයුතු ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ඉන්දියාවේ ජාතික තාප බල සංස්ථාව (NTPC) එක්ව පිහිටුවා ඇති සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම (TPCL) විසින් සිදු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සඳහා සාම්පූර් ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම සඳහා වෙන් කර ඇති ඉඩම උපයෝගී කර ගනු ලබයි. සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා මේ වනවිටත් මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත. 2025 අප්‍රේල් මාසයේදී විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම (PPA) අත්සන් තබා ඇත. සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම් සම්බන්ධයෙන් ටෙන්ඩර් කටයුතු සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2027 දී අවසන් කිරීමට නියමිත ය.

- **ඉන්දියානු ණය ආධාර යටතේ සූර්ය පියැසි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

මෙම ව්‍යාපෘතිය මගින් ආගමික ස්ථාන 5,000 කට සූර්ය පියැසි පද්ධති ස්ථාපනය කිරීමට අපේක්ෂිතය. සූර්ය බල පද්ධති කට්ටල ගෙන්වා බෙදාහැරීම් කටයුතු අවසන් කර ඇති අතර දිවයින පුරා ස්ථාපිත කිරීම් සිදුකෙරෙමින් තිබේ. 2025 වසරේ ඔක්තෝබර් මස වන විටදී මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

ආගමික ස්ථාන 5,000ක් සඳහා කි.වො. 5 බැගින් වූ සූර්ය පැනල සවි කිරීම පිණිස සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් හා නඩත්තු සිදු කිරීම සඳහා ඇ.ඩො. මිලියන 17ක අරමුදලක් වෙන් කර ඇත. පැනල සවි කිරීම් හි ප්‍රගතිය - පද්ධති බෙදා හැරීම් 100% සිදු කර ඇත, පද්ධති ස්ථාපනය කිරීම් 98% අවසන් ව ඇත, සැප්තැම්බර් මස අවසානය වන විට ජාතික සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ කර ඇති ප්‍රමාණය 74% වේ.

සූර්ය පැනල ස්ථාපනය කිරීම

iii. සුළං බලශක්ති ව්‍යාපෘති

- **මන්නාරම "තම්බපවණි" සුළං විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙ.වො. 50)- අදියර ii**

මෙ.වො. 100ක් සමගින් තම්බපවණි අදියර I ලංකා විදුලිබල මණ්ඩලය යටතේ සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතී. අදියර II සඳහා අභිප්‍රාය පළ කිරීමේ යෝජනා (EOI) කැඳවීම සිදුකර ඇති අතර Hayleys Fentons Ltd යන තෝරාගත් ලංසුකරු සමඟින් 2025 මැයි මස දී විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් තබා ඇත. ඉඩම් බදු දීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2027 දී අවසන් කිරීමට නියමිත ය.

- **මුල්ලිකුලම් හි මෙ.වො. 50 x 2 සුළං බලාගාර උද්‍යානය**

ව්‍යාපෘතියේ මූලික සූදානම් කිරීමේ කටයුතු අතරට ඉදිකිරීම් භූමි මාර්ග සංවර්ධනය කිරීම, ටර්බයින සවිකරන ස්ථාන එළිපෙහෙළි කිරීම් හා සීමා නිර්ණය කිරීම සහ ඉදිකිරීම් භූමියේ නවාතැන් පහසුකම් සැකසීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසින් සංවර්ධනය කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති සංවර්ධකයින් සඳහා අවස්ථාව සලසා ඇත. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 284.00 ක් වන අතර සුළං බලාගාරය ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීමේ ක්‍රියාවලිය සිදුවෙමින් ඇත. මෙම ව්‍යාපෘතිය 2027 දී අවසන් කිරීමට නියමිත ය.

iv. යාපනය අර්ධද්වීපයේ දූපත් තුනක් සඳහා දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම

ඩෙල්ෆ්, අනලතිව් සහ නයිනතිව් යන උතුරේ දූපත් සඳහා සූර්ය බලය, සුළං, ඩීසල් වලින් විදුලිය ජනනය සහ ලිතියම්-අයන් බැටරි ගබඩා පද්ධති ඇතුළත් දෙමුහුන් ව්‍යාපෘතියක් ලෙස විදුලිය සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ඉන්දියාව විසින් ඉන්දියානු මූල්‍ය ප්‍රදාන යටතේ වූ ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ඇත. මෙම ව්‍යාපෘතිය 2025 වසරේ මැද භාගයේදී නිම කිරීමට සැලසුම් කර ඇත. 2023 දෙසැම්බර් 11 දිනැතිව ලබාදෙන ලද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ඉන්දියාවේ M/S U-Solar Clean Energy Solutions (Pvt) Ltd. වෙත ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා

සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර ව්‍යාපෘතියේ අධීක්ෂණ සහ සුපරීක්ෂණ කටයුතු ඇතුළුව උපදේශන සේවා ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වෙතින් ලබාගැනීම සඳහා පියවර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය 2026 වසරේ දී මෙහෙවරෙහි යෙදීමට නියමිත ය.

ප්‍රශස්ත උත්පාදන මිශ්‍රණය හා අනුරූප වන පරිදි බැටරි බලශක්ති ගබඩා පද්ධති ඇතුළුව, සූර්ය පැනල, සුළං සහ ඩීසල් පාදක ජනක යන්ත්‍ර ධාරිතාවන් සෑම දූපතක් සඳහා ම නිර්ණය කර ඇත.

නයිනතිව් දූපත

දූපත	ඩීසල් පාදක උත්පාදනය	සූර්ය පැනල උත්පාදනය	සුළං බලශක්ති උත්පාදනය	බැටරි බලශක්ති ගබඩාකරණය
නයිනතිව්	කි.වො.300 + කි.වො.500	කි.වො.700	කි.වො.200	කි.වො.පැ.1000 (කි.වො.550)
අනලතිව්	කි.වො.150 + කි.වො.300	කි.වො.300	කි.වො.80	කි.වො.පැ.550 (කි.වො.250)
ඩෙල්ෆ්	කි.වො.300 + කි.වො.500	කි.වො.700	කි.වො.250	කි.වො.පැ.800 (කි.වො.650)

මොඩියුල සහ අවශ්‍ය කොටස් ස්ථාපනය -

අනලතිව් දූපත

ඩෙල්ෆ් දූපත

v. හම්බන්තොට බැටරි බලශක්ති ගබඩා පද්ධතිය (BESS) ස්ථාපනය කිරීම

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පළමු බැටරි බලශක්ති ගබඩා පද්ධතිය වන අතර එය හම්බන්තොට ග්‍රිඩ් උපපොළෙහි ස්ථාපනය කෙරෙනු ඇත. එය මෙ.වො. 5/මෙ.වො.පැ. 10.7ක ධාරිතාවයකින් යුත් නියමු ව්‍යාපෘතියකි. මෙම යෝජිත බලශක්ති ගබඩා පද්ධතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 11.9 ක් වන අතර කොරියාවේ වෙළඳ, කර්මාන්ත සහ බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රදානයක් මත සහ කොරියානු තාක්ෂණ දියුණුව සඳහා වූ ආයතනයේ (KIAT) තාක්ෂණික සහාය යටතේ ක්‍රියාත්මක කෙරේ.

ව්‍යාපෘතිය සිදු කරන කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයින් ලංකා විදුලිබල මණ්ඩලය හා එක්ව සැලසුම් සමාලෝචනය හා සිවිල් ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර 2025 වසරේ දී ව්‍යාපෘතිය අවසන් කෙරෙනු ඇත.

II. පුනර්ජනනීය නොවන බලශක්ති උත්පාදනය

i. ස්වභාවික ද්‍රව වායු (LNG) ව්‍යාපෘති

ජාත්‍යන්තර කැපවීම් මුදුන්පත් කර ගැනීම සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයන විචල්‍ය පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම් ඉහළ නැංවීම සඳහා ද්විත්ව ඉන්ධන ධාරිතාවක් සහිත මෙ.වො. 200 ස්වාභාවික වායුවෙන් ක්‍රියාත්මක වන අභ්‍යන්තර දහන එන්ජින් බලාගාර ව්‍යාපෘතියේ අත්‍යවශ්‍යතාව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති 2023-2042 දිගුකාලීන විදුලි ජනන සැලැස්ම මගින් හඳුනාගෙන ඇත. විදුලිබල උත්පාදනයේදී ඩීසල් වෙනුවට ස්වභාවික ද්‍රව වායු උපයෝගී කරගැනීමෙන් කි.වො.පැ. ඒකකට රු. 30ට වඩා වැඩි ඉතිරියක් ලබා ගත හැකිය.

- **කෙරවලපිටියේ මෙ.වො.350 ප්‍රතිවායුකරණය කරන ලද ස්වභාවික වායු (RLNG)/ ඒකාබද්ධ චක්‍රීය ඩීසල් බලාගාරය ඉදිකිරීම**

ස්වභාවික ද්‍රව වායු වලින් ක්‍රියාත්මක මෙ.වො. 350 සොබාදනව් ඒකාබද්ධ චක්‍රීය බලාගාරය ලක්දනව් සමාගම විසින් කෙරවලපිටියේ ඉදිකරනු ලැබ ඇත. 2024 අගෝස්තු මාසයේ දී එහි විවෘත චක්‍රීය ගෑස් ටර්බයිනය මෙහෙවරෙහි යොදවන ලද අතර වාෂ්ප ටර්බයිනය 2025 වසරේදී මෙහෙවරෙහි යොදවන ලදී.

- **පාවෙන වායු ගබඩා සහ ප්‍රතිවායුකරණ ඒකකය ඉදිකිරීම (FSRU)**

මෙම ව්‍යාපෘතිය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් කෙරවලපිටිය අක් වෙරළෙහි පාවෙන වායු ගබඩා සහ ප්‍රතිවායුකරණ ඒකකයක් සහ ඊට ගැළපෙන නැංගුරම් පද්ධතියක් ස්ථාපනය කිරීම සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් එම පාවෙන වායු ගබඩා සහ ප්‍රතිවායුකරණ ඒකකයේ සිට කෙරවලපිටිය සහ කැලණිතිස්ස බලාගාර දක්වා ස්වභාවික වායු ප්‍රවාහන නළ මාර්ග පද්ධතියක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022 අගෝස්තු මාසයේ සිට අත්හිටුවා තිබුණි. ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා 2024 දෙසැම්බර් 9 වන දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. 2025 පෙබරවාරි 21 වන දින මීට අදාළ ව්‍යාපෘති කමිටුව (PC) සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව (CANC) නැවත පිහිටුවන ලදී. China Harbour Engineering Corporation Limited (China) සහ Engro Corporation Limited (Pakistan) සාමූහික ව්‍යාපෘති සමාගම- (CHEC-Engro Consortium) තෝරාගත් සංවර්ධකයා වේ. පාවෙන වායු ගබඩා සහ ප්‍රතිවායුකරණ ඒකකයේ ව්‍යාපෘති විස්තර පහත පරිදි වේ;

ව්‍යාපෘතිය ආරම්භක දිනය - අවසන් දිනය	2020 ජූලි 15 2028 දෙසැ. 31
2028 දෙසැ. 31	වසර 3 මාස 6
අරමුදල් මූලාශ්‍රය (දේශීය/විදේශීය ණය ප්‍රදාන)	ව්‍යාපෘති සංවර්ධක විසින් (PPP basis)
මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලි.)	60,000

ii. න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ තිරසර, විශ්වසනීය, ස්ථාවර සහ පරිසර හිතකාමී බලශක්තිය ජනනය කිරීම උදෙසා, විශේෂයෙන්ම න්‍යෂ්ටික බලය මගින් විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගැනීමේදී අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට රජයට සහාය ලබා දීමයි. මූලික වශයෙන් මෙ.වො. 30-400 ක ධාරිතාවයකින් යුත් න්‍යෂ්ටික බලාගාරයක් හරහා විදුලිය ජනනය කිරීම මෙමගින් අපේක්ෂිත ප්‍රතිඵලයයි. මෙම ආරම්භක පියවර සඳහා සම්බන්ධ වී සිටින සංවිධාන අතරට අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ඇතුළත් වන අතර, න්‍යෂ්ටික වගකීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් දෙකක් අපරානුමත කිරීම සහ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් (IWP) සකස් කිරීම සම්බන්ධයෙන් එක්ව කටයුතු කර ඇත. 2024 අගෝස්තු මාසයේදී මෙහෙයුම් කමිටුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) ක්‍රියාකාරී කණ්ඩායම් 09 ක් පත් කර ඇත. පහත සඳහන් කටයුතු සිදුවෙමින් පවතී;

- **පිළිගත් සුදුසු න්‍යෂ්ටික බලශක්ති විකිණුම්කරුවන්ගෙන් අභිප්‍රාය පළ කිරීමේ යෝජනා (EOI) කැඳවීම.**
    - අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව (CANC) වෙත ඉදිරිපත් කිරීම පිණිස අභිප්‍රාය පළ කිරීමේ යෝජනා ලේඛනය සමාලෝචනය කිරීමට සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපෘති කමිටුවක් පත් කර ඇත. තොරතුරු සඳහා ඉල්ලීම (RFI), සුදුසුකම් සඳහා ඉල්ලීම (RFQ) සහ යෝජනා සඳහා ඉල්ලීම (RFP) ද සකස් කර ඇත.

- අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහය යටතේ පසු විපරම් කිරීමේ ඒකාබද්ධ න්‍යෂ්ටික යටිතල පහසුකම් සමාලෝචන (FU-INIR) මෙහෙයුමේ නිර්දේශ සහ යෝජනා ඉදිරියට ගෙන යාම
- 2026 වසර තුළ අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහය යටතේ ජාතික වැඩමුළු පැවැත්වීම
- ශ්‍රී ලංකාවේ අනාගත න්‍යෂ්ටික ස්ථාපන කටයුතු සඳහා ස්ථාන සමීක්ෂණය, ස්ථාන තෝරා ගැනීමේ ක්‍රියාවලිය සහ ස්ථාන ලක්ෂණ හඳුනාගැනීම සිදු කොට අවසන් කිරීම
- න්‍යෂ්ටික බලශක්ති අධ්‍යාපන හා පුහුණු ආයතන පහසුකමක් පිහිටුවීම
- අදාළ මානව සම්පත් සමඟ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ආයතනික ව්‍යුහය යටතේ න්‍යෂ්ටික බලශක්ති සැලසුම් ඒකකයක් පිහිටුවීම

1.4.3. විදුලිබල සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ උපදෙස් ලබා ගනිමින් දිගුකාලීන සම්ප්‍රේෂණ සැලැස්ම සකස් කර ඇති අතර සංවර්ධන හවුල්කරුවන් විසින් ලබා දෙන ණය පහසුකම් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් අනුග්‍රහය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. 2030 වසර තෙක් දැනට ක්‍රියාත්මක සහ සැලසුම් කර ඇති සම්ප්‍රේෂණ මාර්ග පහත සිතියමෙහි දක්වා ඇත.

සිතියම 1.2
2030 දී ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය



මූලාශ්‍රය : ලං.වි.ම.

අ). සම්ප්‍රේෂණ පුළුල් කිරීමේ ව්‍යාපෘති

i. විදුලිබල පද්ධතිය සවිබල ගැන්වීම සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය (PSSREIP)

මෙම ව්‍යාපෘතිය සඳහා 2025 වසරේදී ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඩො.මිලියන 150 ක ණය මුදලක් වෙන් කර ඇත. ජාතික විදුලිබල පද්ධතිය වෙත වැඩි වශයෙන් පුනර්ජනනීය බලශක්තිය පාදක විදුලි උත්පාදනයන් එක් කිරීම මෙම ව්‍යාපෘතියෙහි සමස්ත අරමුණ වන අතර පහත සඳහන් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මූල පුරා ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සිදුවෙමින් පවතී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් පැකේජ හයක් හඳුනාගෙන ඇත.

- **පැකේජය 1A** යටතේ මීරිගම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොළ (2× මෙ.වෝ.ඇ. 63) සහ පැලියගොඩ කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2× මෙ.වෝ.ඇ. 45) ඉදිකිරීම සහ නව හබරණ, වේයන්ගොඩ, කැලණිය සහ කොටුගොඩ ග්‍රිඩ් උපපොළවල නවීකරණය කිරීම් ඇතුළුව නිමකොට භාරදීමේ පදනම (turnkey basis) මත ගෑස් පරිවරණය කරන ලද ස්විච් ගියර් තාක්ෂණයෙන් යුත් (GIS) අභ්‍යන්තර ග්‍රිඩ් උපපොළවල් ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රුපියල් මිලියන 16,408 ක් වන අතර, ව්‍යාපෘතිය 2025 සැප්තැම්බර් සිට 2027 අගෝස්තු දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ටෙන්ඩරය 2025 ජුනි 18 වන දින අවසන් කරන ලද අතර 2025 සැප්තැම්බර් 23 වන දින තාක්ෂණික ලංසු ඇගයීමේ වාර්තාව ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.
- **පැකේජය 1B** යටතේ හෝමාගම කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×මෙ.වෝ.ඇ. 45) සහ මීගමුව කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2× මෙ.වෝ.ඇ. 63) ඉදිකිරීම ඇතුළුව, නිමකොට භාරදීමේ පදනම (turnkey basis) මත කි.වෝ. 132 වායු පරිවරණය කරන ලද ස්විච් ගියර් තාක්ෂණයෙන් යුත් (AIS) බාහිර ග්‍රිඩ් උපපොළවල් ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රුපියල් මිලියන 10,021 ක් වන අතර, ව්‍යාපෘතිය 2025 සැප්තැම්බර් සිට 2028 ජනවාරි දක්වා ක්‍රියාත්මක වන අතර මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. තාක්ෂණික ලංසු ඇගයීමේ වාර්තාව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත ය.
- **පැකේජය 2** යටතේ හම්බන්තොට-මාතර කි.වෝ. 132 ද්විත්ව පරිපථ (DC) සම්ප්‍රේෂණ මාර්ගය (කි.මී. 78), විවිධ ග්‍රිඩ් උපපොළවල් සඳහා කි.වෝ. 132 තනි පරිපථ ආදාන-ප්‍රතිදාන රැහැන් සම්බන්ධතා (SC LILOs) සහ මීරිගම ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ. 220 ද්විත්ව පරිපථ ආදාන-ප්‍රතිදාන රැහැන් සම්බන්ධතාව (DC LILO) ඇතුළු රැහැන් මාර්ග කිහිපයක් ඉදිකිරීම ඇතුළත්ව නිමකොට භාරදීමේ පදනම මත (turnkey basis) කුළුණු මතින් දිවෙන විදුලි රැහැන් මාර්ග ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 10,025 ක් වන අතර, ව්‍යාපෘති කාලසීමාව 2025 සැප්තැම්බර් සිට 2028 අගෝස්තු දක්වා වේ. මේ හා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී.
- **පැකේජය 3** මෙහි විෂය පථය වෙනස් කිරීම සඳහා විදුලිබල මණ්ඩලය මඟින් මණ්ඩලීය පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මුළු පිරිවැය රු. මිලියන 10,060 ක් වන අතර, ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් සිට 2027 නොවැම්බර් දක්වා ක්‍රියාත්මක කෙරේ.
- **පැකේජය 4** යටතේ, කැලණිය-කොටුගොඩ ද්විත්ව පරිපථ (DC) සම්ප්‍රේෂණ මාර්ගයේ සිට පැලියගොඩ ග්‍රිඩ් උපපොළ දක්වා (කි.මී. 2) තනි පරිපථ (SC) ආදාන-ප්‍රතිදාන රැහැන් සම්බන්ධතාව සහිතව භූගත කේබලයක් ඉදිකිරීම ඇතුළුව, නිමකොට භාරදීමේ පදනම (turnkey basis) මත කි.වෝ. 132 භූගත කේබල් සම්ප්‍රේෂණ මාර්ග ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 3,567 ක් වන අතර, ව්‍යාපෘතිය නිම කිරීම 2025 දෙසැම්බර් සිට 2027 නොවැම්බර් දක්වා සිදු කිරීමට සැලසුම් කර ඇත.
- **පැකේජය 5** - කොළොන්නාව ග්‍රිඩ් උපපොළෙහි බැටරි බලශක්ති ගබඩා පද්ධතිය (BESS පද්ධතිය) ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. කොළොන්නාව ග්‍රිඩ් උපපොළ ආවර්ධනය කිරීම සහ කොළොන්නාව මෙ.වො. 100/මෙ.වො.පැ. 100 බැටරි බලශක්ති ගබඩා පද්ධතිය සැපයීම, බෙදා හැරීම සහ ඉදිකිරීම සඳහා රු. මිලියන 9,600 ක් වෙන් කර ඇත.
- **පැකේජය 6** - ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයෙහි පුනර්ජනනීය බලශක්ති පාලන සහ අධීක්ෂණ අංශයක් (Renewable Energy Control and Monitoring Desk) සංවර්ධනය කිරීම රු. මිලියන 3,600 ක වියදමින් සිදු කෙරේ. ලංසු තැබීමේ ක්‍රියාවලිය සහ වෙළඳපල අධ්‍යයනය සිදු කෙරෙමින් පවතී.

පැකේජය 4A, අනුරාධපුර - නව හබරණ රැහැන් මාර්ග යේ H107 –H115 කොටසේ රැහැන් ඉවත් කිරීමේ කටයුතු

ii. ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධනය (NTDND & EIP)

ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA) විසින් ලබා දී ඇති ජපාන යෙන් මිලියන 24,930ක් වූ මෙම ණය මුදල යටතේ සම්ප්‍රේෂණ රැහැන් මාර්ග සංවර්ධන කටයුතු හතරක් සහ ග්‍රිඩ් උපපොළ සංවර්ධනය කිරීමේ පැකේජ හතරක් ක්‍රියාත්මක කෙරේ. කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධනය අඩුකම හේතුවෙන් මුල් ව්‍යාපෘති සම්පූර්ණ වශයෙන් නිම කිරීමේ දිනය සංශෝධනය කරන ලද අතර එය 2028 ජූනි 28 දක්වා දීර්ඝ කරන ලදී. කොන්ත්‍රාත්කරුවන් පැකේජ දෙකක් සඳහා අත්හිටු වූ දීමනා හිමිකම් ඉදිරිපත් කර ඇති අතර අනෙක් පැකේජ දෙක සඳහා නැවත ටෙන්ඩර් කැඳවීම ආරම්භ කර ඇත.

- **පැකේජය 01** යටතේ ගම්පහ, කොළඹ සහ කුරුණෑගල ප්‍රදේශවල සම්ප්‍රේෂණ මාර්ග (කි.වෝ. 400, කි.වෝ. 220, සහ කි.වෝ. 132) ඉදිකිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 14,623 ක් වන අතර, ව්‍යාපෘතිය 2026 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට නියමිතය.
- **පැකේජය 02** යටතේ ගම්පහ, කොළඹ, මහනුවර සහ කෑගල්ල යන ප්‍රදේශවල ග්‍රිඩ් උපපොළවල ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මුළු පිරිවැය රු. මිලියන 8,531 ක් වන අතර, 2026 ඔක්තෝම්බර් මාසයේදී අවසන් කිරීමටත් නියමිත ය.
- **පැකේජය 03** යටතේ අනුරාධපුර, මාතලේ, මහනුවර, කෑගල්ල සහ නුවරඑළිය යන ප්‍රදේශවල සම්ප්‍රේෂණ මාර්ග (කි.වෝ. 220, කි.වෝ. 132) ඉදිකිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 11,253 ක් වන අතර, ව්‍යාපෘතිය 2027 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට නියමිත ය.
- **පැකේජය 04** යටතේ කොළඹ නගරයේ බෙදාහැරීමේ කේබල් (කි.වෝ. 33, කි.වෝ. 11, සහ කි.වෝ. 0.4) ඉදිකිරීම ආවරණය කෙරේ. මුළු පිරිවැය රු. මිලියන 7,183 ක් වන අතර, ව්‍යාපෘතිය 2028 ජූනි මාසයේදී අවසන් කිරීමට නියමිත ය.

වගුව 1.4
දැනට ක්‍රියාත්මක කොන්ත්‍රාත්තු සහ ඉලක්කවල කාර්යසාධනය

කොන්ත්‍රාත්තුව	සම්පූර්ණ කිරීමේ ඉලක්කගත දිනය	සමුච්චිත ප්‍රගතිය %	JICA ණය අත්හිටුවීම හේතුවෙන් කොන්ත්‍රාත්තු වල තත්ත්වය
පැකේජය 1	2026 අගෝස්තු 31	76.1%	අත්හිටුවන ලදී - 2022 දෙසැම්බර් 15 නැවත ආරම්භ කර ක්‍රියාත්මක වේ
පැකේජය 2	2026 ඔක්තෝබර් 30	78.5%	මන්දගාමී විය - 2022 සැප්තැම්බර් 6 නැවත ආරම්භ කර ක්‍රියාත්මක වේ
පැකේජය 3	අදියර I - 2023 පෙබරවාරි 16 දින අවසන් කරන ලදී නව ඉලක්ක අදියර II - 2027 අගෝස්තු	59.8% (T) සම්පූර්ණයි 4%	අත්හිටුවන ලදී - 2022 මැයි 17 අවසන් කරන ලදී - 2023 පෙබරවාරි 16 ශේෂ විෂය පථය සඳහා නැවත ලංසු තබා ඇත
පැකේජය 4	අදියර I - 2022 ඔක්තෝබර් 15 නව ඉලක්ක අදියර II - 2028 ජුනි	41% 2%	අත්හිටුවන ලදී - 2022 අගෝස්තු 10 අවසන් කරන ලදී - 2022 ඔක්තෝබර් 15 ශේෂ විෂය පථය සඳහා නැවත ලංසු තබා ඇත

iii. විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය (SESRIP)

මෙම ව්‍යාපෘතිය යටතට මුළු දිවයින පුරා කි.මී. 300 ක දිගින් යුතු කි.වෝ. 33 රැහැන් කුළුණු සහ කි.වෝ. 33 සම්බන්ධන ගැන්ට්‍රි (switching gantries) 13 ක් (පැකේජය 4 යටතේ) ඉදිකිරීම ඇතුළත් වේ. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 7,314.052 ක් වන අතර එය 2019.10.28 දින සිට ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලබයි. සැප්තැම්බර් මස අවසානය වන විට මෙහි ප්‍රගතිය පහත දක්වා ඇත.

වගුව 1.5
සිදු කෙරෙමින් පවතින වැඩ කටයුතුවල ප්‍රගතිය

අපේක්ෂිත ප්‍රතිඵල (නිමැයුම්)	2025.08.31 දිනට සමුච්චිත ඉලක්කය (%)	2025.08.31 දිනට සමුච්චිත කාර්ය සාධනය (%)
සැලසුම් නිම කිරීම	100	99
රැහැන් සහ ගැන්ට්‍රි ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම	99	95
කුළුණු අත්තිවාරම් ඉදිකිරීම	95	85
කුළුණු පිහිටුවීම	82	65
කුළුණු පිහිටුවීම	60	43
ගැන්ට්‍රි ඉදිකිරීම	87	82

බිබිලේ ගැන්ට්‍රිය

මහව-මා එළිය රැහැන් මාර්ගය

iv. හබරණ සිට ත්‍රිකුණාමලය දක්වා සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) ණය ආධාර යටතේ දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශයෙන් පුනර්ජනනීය බලශක්තිය විදුලි පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීම සඳහා යටිතල පහසුකම් නිම කිරීමට සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති දෙකක් සූදානම් කර ඇත. මේ සම්බන්ධ ණය ගිවිසුම ඉදිරියේ දී අත්සන් තැබීමට නියමිත ය.

- **සාම්පූර් කප්පල්තුරෙයි කි.වෝ. 220 සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය**
  ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වන විටත් ආරම්භ කර ඇති අතර ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ මූලික ප්‍රසම්පාදන නිෂ්කාශනය අපේක්ෂාවෙන් සිටී. සාම්පූර් ඒකරාශීකරණ ග්‍රිඩ් උපපොළ සහ සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලැබේ.

- **නව හබරණ - කප්පල්තුරෙයි කි.වෝ. 220 සම්ප්‍රේෂණ සංවර්ධනය**
  නව හබරණ කප්පල්තුරෙයි කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය සහ නව හබරණ වහරු අංගනය ආවර්ධනය කිරීම සහ කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොළ නවීකරණය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් නිම කෙරේ.

v. කෙරවලපිටියේ සිට කොළඹ L ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ. 220 දෙවන භූගත කේබලය ඉදිකිරීම

මෙම ව්‍යාපෘතියට කෙරවලපිටිය උපපොළේ සිට කොළඹ L දක්වා කි.වෝ. 220 දෙවන භූගත කේබලය ඉදිකිරීම ඇතුළත් වන අතර, මුළු පිරිවැය රු. මිලියන 9,119 වේ. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් අරමුදල් සපයනු ලබයි. මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇත. 2025 සැප්තැම්බර් මාසයේදී ණය ගිවිසුම අත්සන් තබා ඇති අතර ව්‍යාපෘති කටයුතු ආරම්භ කර ඇත.

vi. ඉන්දු-ශ්‍රී ලංකා ජාල අන්තර්සම්බන්ධතාව විදුලිය ආනයනය/අපනයනය කිරීම පිණිස

ඉන්දු- ශ්‍රී ලංකා අධි වෝල්ටීයතා සරල ධාරා (HVDC) අන්තර් සම්බන්ධතාවය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය සහ ඉන්දීය ජනරජයේ රජය අතර අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම සඳහා බලශක්ති අමාත්‍යාංශය සහ විදේශ කටයුතු සහ විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් 2025.03.28 දින ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් 2025.04.01 දිනැති අංක 25/0569/825/029-I දරන තීරණය මගින් මේ සඳහා අනුමැතිය ලබා දී ඇත. ශ්‍රී ලංකාව වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් 2025.04.05 දින මෙම අවබෝධතා ගිවිසුම සඳහා අත්සන් තබන ලදී. ශක්‍යතා අධ්‍යයනයන් අවසන් කර ඇති අතර ඒකාබද්ධ තාක්ෂණික කණ්ඩායමේ සාකච්ඡා 2025 අප්‍රේල් මාසයේදී ඉන්දියාවේදී පැවැත්විණි.

ආ). බෙදාහැරීම් සංවර්ධන හා පුළුල් කිරීම් කටයුතු

ලංකා විදුලිබල මණ්ඩලය බෙදාහැරීමේ අංශ හතරක් මෙහෙයවනු ලබන අතර ලංකා විදුලි පුද්ගලික සමාගම පස්වන බෙදාහැරීමේ අංශය ලෙස කටයුතු කරයි. මෙම ආයතන ද්විත්වය ම පාරිභෝගිකයින් සඳහා වඩාත් හොඳ සේවාවක් ලබා දීමේ අරමුණින් බෙදාහැරීමේ ජාලය සංවර්ධනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් පවතී. මේ අතර, පියැසි පාදක සූර්ය බලශක්ති ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ග සම්බන්ධයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර පවතින අනනුකූලතාවන්ට විසඳුම් ලබාදීමට සහ ඒකීයත්වය සහ විනිවිදභාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇත. අනාගත ධාරිතා අවශ්‍යතා සපුරාලීම සඳහා බෙදාහැරීමේ පද්ධතිය සවිබල ගැන්වීමේ සහ විදුලි සැපයුමේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමේ අරමුණින් ව්‍යාපෘති කිහිපයක් ම සැලසුම් කර ඇත.

- ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනට සිදු කර ගෙන යන සංවර්ධන කටයුතු වලට අමතරව, ආසියානු සංවර්ධන බැංකුවේ

මූල්‍යකරණය යටතේ අධීක්ෂණ පාලන දත්ත උකහාගැනුම් පද්ධතියක් (SCADA) සහිත උසස් බෙදාහැරීම් කළමනාකරණ පද්ධතියකින් (ADMS) යුතු බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන (DCCs) හතරක් සහ බෙදාහැරීමේ අංශ හතර සඳහා උසස් මනුකරණ යටිතල පහසුකම් (AMI) ස්ථාපිත කිරීමට සහ පියැසි පාදක සූර්ය බලශක්තිය ඒකාබද්ධ කිරීම සහ අඵත්‍ය ශුද්ධ මනුකරණය සඳහා පහසුකම් සැලසීමට 2026 වසරේ දී නව ව්‍යාපෘති දෙකක් ආරම්භ කිරීමට නියමිත ය.

- ලංකා විදුලි පුද්ගලික සමාගමේ විදුලිබල පද්ධතියේ ධාරිතාව, විශ්වසනීයත්වය සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධකිරීම් වැඩිදියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඩො. මිලියන 50 ක ණයක් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, එහි ප්‍රසම්පාදන කටයුතු සාර්ථකව සිදු කෙරෙමින් පවතී. ශ්‍රී ලංකාවේ අභිලාෂය වී ඇති වසර 2030 වන විට විදුලිබලයෙන් 70%ක් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ජනනය කිරීමේ ජාතික ඉලක්කය සමඟ මෙම මූලික ක්‍රියාමාර්ගය උපායමාර්ගිකව අනුකූල වන්නේ ය. ලංකා විදුලි පුද්ගලික සමාගමේ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත්තේ කැලණිය, මීගමුව, කෝට්ටේ සහ නුගේගොඩ යන ජනාකීර්ණ නාගරික කලාප කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිය විදුලිය බෙදාහැරීමේ පද්ධතිය පුරා විදුලිබල ජාලයේ විශ්වසනීයත්වය, මෙහෙයුම් නම්‍යශීලීත්වය සහ සූර්ය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණෙන් ය.

ලංකා විදුලි පුද්ගලික සමාගමේ විදුලි ජාලය වෙත කි.වෝ. 33 බෙදාහැරීම් වෝල්ටීයතාව හඳුන්වාදෙනු ලැබීම මෙම ව්‍යාපෘතියේ සුවිශේෂී ලක්ෂණය වේ. මෙම වෝල්ටීයතා පුළුල් කිරීම හරහා විදුලි භාරය කළමනාකරණය කිරීමේ හැකියාවන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු වීම, විදුලි බිඳවැටීම් අවම කිරීම සහ විසිරී ඇති සූර්ය බලශක්ති පැනල මඟින් උත්පාදිත විදුලිය ඒකාබද්ධ කිරීම සඳහා විදුලි ජාලයේ පවතින ධාරිතාව පුළුල් වීම සිදු වනු ඇත. මෙම පුළුල් නවීකරණ වැඩසටහන මඟින් අතිශය වැදගත් ප්‍රගතීන් තුනක් වන යටිතල පහසුකම් නවීකරණය, වෝල්ටීයතා මට්ටම් පරිවර්තනය සහ විදුලි ජාලයේ ඩිජිටල් පරිණාමය සිදු වනු ඇත;

- ආසියානු සංවර්ධන බැංකුවේ දෙවන මූල්‍යන අනුග්‍රහය මීගමුව ප්‍රදේශය තුළ ලංකා විදුලි පුද්ගලික සමාගමේ බෙදාහැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා ගැනීමට නියමිත ය.
- මීට අමතරව, පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් යුරෝපා සංගමයේ ප්‍රදාන සහාය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.
    - ➢ විදුලි බෙදාහැරීමේ ජාල සඳහා එල්ලා වැටීම් අඩු හානි අවම HTLS සන්නායක හඳුන්වා දීම.

රූප සටහන 1

LECO බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර්වල බැටරි ගබඩා පද්ධති (මූලාශ්‍රය -LECO)



➢ අතථ්‍ය බලාගාර ක්‍රියාකාරිත්වය (Virtual Power Plant) සක්‍රීය කිරීම සහ සූර්ය පැනල ඒකාබද්ධ කිරීම ඉහළ නැංවීම සඳහා ලංකා විදුලි පුද්ගලික සමාගමේ බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර්වල බැටරි ගබඩා පද්ධති ස්ථාපිත කිරීම.

➢ උපයෝගිතාව මත පදනම් වූ සූර්ය පැනල ඒකරාශීකරණ ව්‍යාපෘතිය (Solar PV aggregation project) හඳුන්වා දීම.

1.4.4 ආයතනික ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය තීරණ

අ). විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනික ප්‍රතිසංස්කරණ

- විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගෙන් සහ බලශක්ති ප්‍රතිපත්ති සම්බන්ධ ප්‍රවීණයන්ගෙන් සමන්විතව පත් කරන ලද කමිටුව විසින් විදුලිබල පනත සහ එහි සංශෝධනය පිළිබඳ වත්මන් තත්ත්වය සහ මූලික අදහස් හඳුනා ගනු ලබමින් සිය යෝජනා සහ නිර්දේශ සහිත වාර්තාව 2025.01.20 දින බලශක්ති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව 2025.01.23 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.
- ශ්‍රේෂ්ඨාධිකරණයේදී පෙත්සම් විභාගවන අවස්ථාවේ සහ 2025 ජූලි මස 11,15 සහ 17 යන තෙදින තුලදී පැවැති පාර්ලිමේන්තු යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, සිවිල් සංවිධාන, වෘත්තීය සමිති සහ අනෙකුත් ව්‍යාපාරික සංසදයන්ගේ අදහස් සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතට සිදුකල යුතු තවත් සංශෝධන ප්‍රමාණයක් හඳුනාගන්නා ලදි.
- ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතට ඉදිරිපත් කරන ලද යෝජිත සංශෝධන පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව 2025.06.30 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත 2025.08.06 දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද අතර, ගරු කථානායකතුමා විසින් 2025.08.18 දින සහතිකය සටහන් කිරීමෙන් අනතුරුව 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත ලෙස බලාත්මක වී ඇත. මෙය 2025.08.26 දිනැති අංක 2451/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ භාෂා තුනෙන් ම පළ කර ඇත.

- ▪ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් සඳහා වූ ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත.
- ▪ අමාත්‍ය මණ්ඩලය විසින් 2025.09.08 දින පැවති සිය රැස්වීමේදී ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 8(2) උපවගන්තිය ප්‍රකාරව, බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන කමිටුව පත්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

ආ) බලශක්ති ප්‍රතිපත්තියේ සහ උපාය මාර්ග හි උන්නතිය සඳහා අමාත්‍යාංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි;

- ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම තුළින් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු හා අනුකූලව කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- බලශක්ති සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව සහ සුනිත්‍යභාවය සහතික කිරීම සඳහා දැනට ක්‍රියාත්මක ජාතික බලශක්ති ප්‍රතිපත්තිය, උපාය මාර්ග රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව යාවත්කාලීන කිරීම.
- බලශක්ති ක්ෂේත්‍රයේ දිගුකාලීන සැලසුම් සකස් කිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සහ ජාතික සංවර්ධන ඉලක්ක හා අනුරූපව කටයුතු කිරීම.
- නීති සම්පාදක කටයුතුවල කාලීන ප්‍රගතිය සහතික කරනු ලබමින් බලශක්ති සංක්‍රාන්ති පනත් කෙටුම්පත හා අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ඒවාට පහසුකම් සැලසීම.

ඇ). පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- **පුනර්ජනනීය බලශක්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවක් පිහිටුවීම**

පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම් ඉහළ යමින් පවතින සන්දර්භය හමුවේ සුරක්ෂිත, විශ්වසනීය සහ තිරසාර බලශක්ති අනාගතයක් සහතික කිරීමේ ප්‍රමුඛ ඉලක්කය පෙරදැරිව, විදුලිබල පද්ධතිය තත්කාලීනව අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම ඉහළ නැංවීමේ අරමුණින් පූර්වෝපායික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා කමිටුවක් පත් කර ඇත. පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේ කාර්යය කමිටුව වෙත පැවරී ඇතඃ

1. පුනර්ජනනීය බලශක්ති අංශයක් (Renewable Energy Desk) පිහිටුවීම.
2. පිරිවැය-පරාවර්තක කාල පාදක (ToU) ගාස්තු ක්‍රියාත්මක කිරීම.
3. විදුලි භාරයේ පැතිකඩ (load profiles) ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම සඳහා විදුලිය භාවිතයේ දී කාර්යබහුල කාල පරාසයෙන් කාර්ය බහුල නොවන කාල පරාසයට මාරුවීම හෙවත් ඉල්ලුම-වෙනස් කිරීමේ යාන්ත්‍රණ (Demand-Shifting Mechanisms) කාර්මික සහ වාණිජ ක්ෂේත්‍ර ඉලක්ක කරගනිමින් හඳුන්වාදීම.
4. බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) කඩිනමින් ප්‍රසම්පාදනය කිරීම.
5. පියැසි පාදක සූර්ය බලශක්ති උත්පාදනය සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ හැකියාව සැලසීම.
6. කොන්ත්‍රාත් ගිවිසුම්වල අදාළ වගන්ති සංශෝධනය කිරීම සහ නව වගන්ති හඳුන්වාදීම.
7. නවීන තාක්ෂණික සහ ප්‍රතිපත්ති අවශ්‍යතා සමඟ ගිවිසුම් කාර්යරාමු අනුරූප වන බවට සහතික කිරීම.

- **පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධන සැලැස්ම (2025-2030)**

2025-2030 කාල සීමාව තුළ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සහාය යටතේ පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. රටේ ප්‍රමුඛ බලශක්ති අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරමින් මෙම සැලැස්ම සකස් කර ඇත. සැලසුම් කර ඇති පරිදි පුනර්ජනනීය බලශක්ති සම්පත් ඵලදායී ලෙස පද්ධතියට එක් කරවීම සඳහා ජාතික විදුලිබල පද්ධතිය ක්‍රමානුකූලව සහ ඉලක්කගත අයුරින් සංවර්ධනය කිරීමට මෙමඟින් සැලකිය යුතු ඉදිරි පියවරක් තබා ඇත.

- **විදුලි පාරිභෝගිකයින් සඳහා චක්‍රීය විදුලිබල පහසුකම (Power Wheeling Facility) ක්‍රියාත්මක කිරීම**

සිය විදුලි අවශ්‍යතාවන් වෙනත් ස්ථානයක පිහිටා ඇති අය හට අයත් පුනර්ජනනීය බලශක්ති බලාගාරවල විදුලිබල උත්පාදනය මඟින් සපුරාගැනීමට හැකියාව ලැබෙන පරිදි මහා පරිමාණයෙන් පුනර්ජනනීය බලශක්තිය භාවිතයට ගන්නා පාරිභෝගිකයින් සඳහා උපකාරී වන අයුරින් 2024 වසරේ දී චක්‍රීය විදුලිබල පහසුකම් යාන්ත්‍රණය හඳුන්වා දී ඇත. අදාළ චක්‍රීය ගාස්තු (wheeling charges) නිර්ණය කිරීමේ බලය ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සහ ලංකා විදුලිබල මණ්ඩලය වෙත පවරා ඇත.

- **පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් වන ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම (JWG)**

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳ 2 වන ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම 2025 සැප්තැම්බර් 23 වන දින මාර්ගගතව රැස්වන ලදී. දෙරට අතර ද්විපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත් කිරීම, තාක්ෂණික විශේෂඥතාව හුවමාරු කරගැනීම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය ඉදිරියට ගෙන යාම සඳහා ඒකාබද්ධව සිදු කළ හැකි මූලික ක්‍රියාමාර්ග පිළිබඳ සොයාබැලීම මෙම ක්‍රියාකාරී සහයෝගීතාවයේ අරමුණයි.

- **පියැසි මත සවි කරන සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති (සූර්ය පැනල පද්ධති) ඒකාබද්ධ කිරීම**

පියැසි පාදක සූර්ය පැනල පද්ධති ජාතික විදුලිබල පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීම විධිමත් කිරීමේ සහ ඉහළ නැංවීමේ අරමුණින් යුතුව,

ඉදිරියේදී ක්‍රියාත්මක කෙරෙන පියැසි පාදක සූර්ය පැනල පද්ධති සඳහා නිර්දේශ ලබා දීමට කමිටුවක් පත් කරන ලදී.

ඇ. විදුලි මිල සංශෝධනය

"විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ කාල සීමාව මාස තුනේ සිට මාස හයක් දක්වා සංශෝධයනය කිරීම සඳහා පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංශෝධනය කිරීම" මැයෙන් බලශක්ති අමාත්‍යවරයා විසින් 2024.12.05 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් 2024.12.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දැනට ක්‍රියාත්මකවන විදුලි ගාස්තු සංශෝධන කාල සීමාවන් සංශෝධනය කිරීමට අදාළ සවිස්තරාත්මක යෝජනාවක් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එළඹ ඇති විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහනේ මීළඟ කාර්ය මණ්ඩල මට්ටමේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලෙස බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග කරන ලදී.

ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය විසින් "Report to IMF on the Necessity of Reversion of Tariff Period from 3 Months to 6 Months" යන මැයෙන් වූ වාර්තාව 2025.07.01 දිනැති අංක DGM(CS&RA)/TRF/Trf.2025 දරන ලිපිය සමඟ ඉදිරිපත් කරන ලදී. බලශක්ති අමාත්‍යාංශය විසින් 2025.08.26 දිනැති අංක PE/01/46 දරන ලිපිය මගින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත එම වාර්තාව ඉදිරිපත් කරන ලදී.

ඉ). පුනර්ජනනීය බලශක්ති ගාස්තු සංශෝධනය කිරීම

2024 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි සමතල ගාස්තු විකල්පයක් (flat tariff option) හඳුන්වා දී ඇත. පෙර භාවිත කළ ත්‍රිත්ව-ස්තර ගාස්තු ව්‍යුහය සහ විචල්‍ය ගාස්තු 2024 වසරේ සිට තවදුරටත් ක්‍රියාත්මක නොකෙරේ. 2025 වර්ෂය සඳහා, මෙ.වො.10 හෝ ඊට වඩා අඩු ධාරිතාවක් සහිත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සහ පියැසි පාදක සූර්ය බලශක්ති පද්ධති සඳහා වන ගාස්තු 2025 ජුනි 16 වන දින සිට සංශෝධනය කර ඇත. පියැසි පාදක සූර්ය බලශක්ති පද්ධති සමඟ ඒකාබද්ධ කරන ලද බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) සඳහා ගාස්තු ක්‍රමයක් මෙම වසරේ දී හඳුන්වා දී ඇත. පියැසි පාදක සූර්ය බලශක්ති පද්ධති සමඟ ඒකාබද්ධ කරන ලද බැටරි බලශක්ති ගබඩා පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් ද සකස් කර ඇති නමුත් එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙතෙක් තීරණ ගෙන නොමැත.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනට නිසි ලෙස ක්‍රියාත්මක නොකරන විචල්‍ය ගාස්තුව කාලෝචිතව භාවිතය සඳහා යොදාගැනීමේ අරමුණින් එම ගාස්තුව සමාලෝචනය කිරීමට කමිටුවක් පත් කර ඇත. මෙ.වො. 10 සහ ඊට අඩු ධාරිතාවක් සහිත පුනර්ජනනීය බලශක්ති බලාගාර ජාතික විදුලිබල පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීම සඳහා ගාස්තු සූත්‍රයක් සකස් කිරීමට ද කමිටුවක් පත් කර ඇත.

ඊ). සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම (SPPA)

1999 දී රජය විසින් ගෙන ඇති පරිපාලනමය තීරණයක් මත සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම බලාගාර ධාරිතාවය මෙ.වො. 10 කට සීමා වී ඇත. මෙහිදී, නීතිපතිගේ නිෂ්කාශන ලබා ගැනීමෙන් අනතුරුව ගිවිසුමෙහි අඩංගු වගන්ති සමාලෝචනය කර ව්‍යාපෘති සංවර්ධකයාට සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට යන දෙපාර්ශවයටම යෝග්‍ය වන ලෙස සංශෝධනයන් සිදු කර ඇත.

එසේම, ව්‍යාපෘති ආයෝජකයින්ගේ නැඹුරුව ඇතිකර ගැනීමට සහ ව්‍යාපෘති බැංකුකරණ අංශයන් පිළිබඳ ණය දෙන්නන්ගේ ඇගයීම් ශීඝ්‍රයෙන් වෙනස් වී ඇති බැවින් පැවති සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමෙහි සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා යෝජනා සමාලෝචනය කර සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම වෙත සංශෝධන ඇතුළත් කර ඇත. අනතුරුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් සංශෝධිත සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම 2024 දෙසැම්බර් 6 වන දින නෛතික නිෂ්කාශනය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටියි.

ඩ). විදුලිබල ක්ෂේත්‍රයේ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDC) අධීක්ෂණය කිරීම-

වසර 2021 සිට 2030 දක්වා විදුලිබල ක්ෂේත්‍රයට අදාළව ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව ඉලක්ක ක්‍රියාවට නැංවීමේ වගකීම දරනු ලබන්නේ බලශක්ති අමාත්‍යාංශය විසින් ය. දැනට පවතින ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව හි 2.0 යන දායකත්වය 2026 සිට 2035 දක්වා වූ කාල සීමාව සඳහා ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව අංක 3.0 දක්වා යාවත්කාලීන කර ඇත. මෙයට බැටරි බලශක්ති ගබඩා පද්ධති, අක්වෙරළ සුළං සහ පොම්ප ගබඩා පද්ධති එක් කිරීම් වැනි නව ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

1.4.5. 2026 වසර සඳහා අනාගත සැලසුම්

2026 වසරේ දී පහත සඳහන් ව්‍යාපෘති විදේශ මූල්‍යකරණය යටතේ ආරම්භ කිරීමට නියමිතව ඇත.

- උසස් බෙදාහැරීමේ කළමනාකරණ පද්ධතියක් (ADMS) සහිත බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන හතරක් සහ බෙදාහැරීමේ අංශ 04 සඳහා උසස් මනුකරණ යටිතල පහසුකම් (AMI) ස්ථාපිත කිරීම.
- මෙ.වො.600 මහ ඔය පොම්ප කළ ජල ගබඩා විදුලි බලාගාරයේ (PSHP) සවිස්තරාත්මක සැලැසුම සකස් කිරීම (ලංකා විදුලිබල මණ්ඩලය විසින් ආසියානු සංවර්ධන බැංකු ණය හරහා මෙය සිදුකෙරේ) ආරම්භ කර ඇත.

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර මූලික කටයුතු ඉදිරියේ දී ආරම්භ කෙරෙනු ඇත.

- කිලිනොච්චි සිට හබරණ දක්වා උතුරු පළාතේ කි.වෝ. 400 සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම.
- නොරොච්චෝලේ - වාරියපොළ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය සහ වාරියපොළ වහරු අංගනය ඉදිකිරීම.
- පාදුක්ක කි.වෝ. 220 ග්‍රිඩ් උපපොළේ ස්ථිතික සමමුහුර්ත හානිපූරක ඒකකය (STATCOM) ස්ථාපනය කිරීම.
- නව හබරණ ග්‍රිඩ් උපපොළේ මෙ.වො.ඇ. 75 සමමුහුර්ත ධාරිත්‍රක ඒකකයක් ස්ථාපනය කිරීම.
- මීගමු ප්‍රදේශයේ ලංකා විදුලි පුද්ගලික සමාගමේ බෙදාහැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය.
- පූඬලු ඔය සහ පූඬලු ඔය ඇල්ල ද්විතීයික අංශ යෝජනා ක්‍රමය - ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය.
- සුළං සම්පත් තක්සේරුව, දැදුරු ඔය පාවෙන ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය බලශක්ති ව්‍යාපෘතිය, කරච්චි සුළං බලශක්ති ව්‍යාපෘතිය.

1.5 2025 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය

බලශක්ති අමාත්‍යාංශයේ ඛනිජ තෙල් අංශය ජාතියේ බලශක්ති අවශ්‍යතා සපුරාලීමේදී සහ ආර්ථික හා සමාජීය සංවර්ධනයට සහායවීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඉන්ධන ජනතාවගේ දෛනික ජීවිතයේ අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර, ප්‍රවාහනය, කර්මාන්ත හා නිවාස බලගන්වමින් පොදු සේවාවන්හි සුමට ක්‍රියාකාරීත්වය සහතික කරයි. අමාත්‍යාංශය මඟින් ඉන්ධන සැපයුම් විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම, පිරිපහදු මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ ගබඩා හා බෙදාහැරීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම දිගටම සිදු කරනු ලබයි. දේශීය ඉන්ධන මිලට බලපාන ගෝලීය වෙළඳපොළ උච්ඡාවචනයන් මධ්‍යයේ වුවද, රටේ වර්ධනය වන බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා ස්ථාවරත්වය පවත්වා ගැනීමටත්, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා අඛණ්ඩ ප්‍රවේශයක් සහතික කිරීමටත් මෙම අංශය කටයුතු කර ඇත. 2025 වර්ෂය තුළ ගෝලීය ඉන්ධන මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි දක්වන ලද බලපෑම, දේශීය ඉන්ධන ඉල්ලුම සපුරාලීමට දක්වන ලද දායකත්වය, ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනයට අමාත්‍යාංශය ගනු ලැබූ ක්‍රියා මාර්ගවලට අදාළ ප්‍රගතිය සහ 2026 වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත සැලසුම් මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර ඇත.

1.5.1 බලශක්ති (ඛනිජ තෙල්) අංශය - 2025

සමස්ත පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය	මෙට්‍රික් ටොන් 3,749,896.33
සමස්ත බොර තෙල් ආනයනය	මෙට්‍රික් ටොන් 1,319,299.00
සපුගස්කන්ද පිරිපහදුවේ නිෂ්පාදනය	මෙට්‍රික් ටොන් 1,287,215
සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල ආනයන පිරිවැය	ඇ.එ.ජ.ඩො. මිලියන 2,423.139
සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල අලෙවිය	මෙට්‍රික් ටොන් 4,656,810
ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව	1,436
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ත ගබඩා ධාරිතාවය	මෙට්‍රික් ටොන් 474,043

1.5.2 ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

i. ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා

ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල කෙරෙහි සෘජු බලපෑමක් සිදු කරන අතර, 2025 වසර තුළ ආසියා පැසිෆික් කලාපයේ බොරතෙල් සහ පිරිපහදු ඉන්ධන මිලෙහි පහත හැසිරීම් නිරීක්ෂණය කළ හැකිය.

2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුළ, ආසියා-පැසිෆික් කලාපයේ බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන මිලෙහි මධ්‍යස්ථ අස්ථාවරත්වයක් පෙන්නුම් කරන ලදී. බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 63 සිට 80 අතර වෙනස් වූ අතර, පෙට්‍රල් (92 සහ 95 ඔක්ටේන්) සහ ඩීසල් (ඔටෝ සහ සුපර්) මිලද එමඟින් සමාන ආකාරයේ ප්‍රවණතාවයක් පෙන්වීය. වසරේ පළමු භාගයේදී ගෝලීය ඉල්ලුම අවම වීම සහ සැපයුම් තත්ත්වයන් වඩා හොඳ වීම හේතුවෙන් මිල ප්‍රමාණවත් ලෙස පහත වැටීමක් දක්නට ලැබුණි. එහෙත් ජූනි මාසයෙන් පසු, ආර්ථික ක්‍රියාකාරකම් නැවත සක්‍රීය වීම සහ ප්‍රධාන තෙල් අපනයන රටවල් විසින් නිෂ්පාදන ප්‍රමාණයන් සීමා කිරීම නිසා මිල යළි ඉහළ යන ප්‍රවනතාවයක් දක්නට ලැබිණි. මෙවැනි ගෝලීය මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ දේශීය ඉන්ධන මිලකරණ ව්‍යුහය මත සෘජු බලපෑමක් ඇති කළ අතර, වසර තුළ ඛනිජ තෙල් ආනයන පිරිවැයට ද බලපෑමක් ඇති කරන ලදී.

2025 වසර තුළ ගෝලීය ඛනිජ තෙල් මිලෙහි උච්ඡාවචනයන් ශ්‍රී ලංකාවේ දේශීය ඉන්ධන මිලකරණ යාන්ත්‍රණයට සැළකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. රට පූර්ණ වශයෙන් ආනයනික බොරතෙල් සහ පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදන මත රඳා පවතින බැවින්, ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන් සහ විදේශ විනිමය අනුපාත වෙනස්වීම් දේශීය ඉන්ධන පිරිවැයට සෘජුවම බලපානු ලැබීය. ගෝලීය මිල චලනයන් සහ විනිමය අනුපාත විචලනයන් පිළිබිඹු කරන දේශීය ඉන්ධන මිල සූත්‍රය, ඉන්ධන සැපයුමේ මිල ස්ථායීතාව සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා වරින් වර නැවත සකස් කරන ලදී. වසර ආරම්භයේදී ගෝලීය මිල පහත වැටීමෙන් ආනයන පිරිවැය අඩු වීමක් දක්නට ලැබුණ ද, වසර මැද සිට මිල යළි ඉහළ යාමත් සමඟ දේශීය අලෙවි මිල මත ඉහළ පීඩනයක් ඇතිවිය.

මෙම තත්ත්වයට ප්‍රතිචාර ලෙස, බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සමග එක්ව, ඉන්ධන සැපයුමේ අඛණ්ඩතාවය පවත්වා ගැනීම, දේශීය මිලෙහි අධික වෙනස්වීම් අවම කිරීම, සහ භාවිතාකරුවන්ට ඉන්ධන ලබාදීමේ ආර්ථික පහසුකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිණි. ඒ සමඟම ඛනිජ තෙල් අංශයේ මූල්‍ය ස්ථාවරත්වය රැක ගැනීමත් අරමුණු කරගෙන කටයුතු කරන ලදී.

වගුව 1.6

ආසියා-පැසිෆික් කළාප බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රකාශිත මිල ගණන් - 2025

මාසය	බැරලයක මිල (ඇමරිකන් ඩොලර්)				
	පෙට්‍රල් 92 ඔක්ටේන්	පෙට්‍රල් 95 ඔක්ටේන්	සුපර් ඩීසල්	ඔටෝ ඩීසල්	බොරතෙල්
ජනවාරි	84.482	86.750	95.412	94.765	72.81
පෙබරවාරි	84.833	86.301	91.706	90.625	73.28
මාර්තු	79.558	81.001	86.477	85.129	80.22
අප්‍රේල්	75.303	76.754	81.774	80.480	77.62
මැයි	75.029	76.467	79.365	78.851	72.63
ජූනි	80.103	82.006	87.032	86.587	67.73
ජූලි	77.929	79.597	90.889	89.819	63.62
අගෝස්තු	77.964	80.127	86.373	85.475	69.81
සැප්තැම්බර්	79.515	81.556	89.081	88.222	71.12

මූලාශ්‍රය : S&P global commodity insights

ඛනිජ තෙල් නිෂ්පාදන මිල ප්‍රවණතා - 2025 (සිංගප්පූරු ප්ලැට්ස් මිල ගණන් මත පදනම්ව)

2025 වර්ෂය තුළ සිංගප්පූරු ප්ලැට්ස් (Singapore Platts) මිළගණන් සැළකිල්ලට ගැනීමේදී,

- බොරතෙල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 80.22 ක් මාර්තු මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 63.62 ක් ජූලි මාසයේදීත් වාර්තා වූ අතර බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 72.093 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 84.833 ක් පෙබරවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 75.029 ක් මැයි මාසයේදීත් වාර්තා වූ අතර පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 79.413 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- පෙට්‍රල් 95 ඔක්ටේන් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 86.750 ක් ජනවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 76.467 ක් මැයි මාසයේදීත් වාර්තා වූ අතර පෙට්‍රල් 95 ඔක්ටේන් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 81.173 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- ඔටෝ ඩීසල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 94.765 ක් ජනවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 78.851 ක් මැයි මාසයේදීත් වාර්තා වූ අතර ඔටෝ ඩීසල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 86.661 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- සුපර් ඩීසල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 95.412 ක් ජනවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 79.365 ක් මැයි මාසයේදීත් වාර්තා වූ අතර සුපර් ඩීසල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 87.568 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.

වගුව 1.7
2025 වර්ෂයේ ඛනිජ තෙල් නිෂ්පාදනවල ඉහළම, අවම සහ සාමාන්‍ය මිල ගණන්
(සිංගප්පූරු ප්ලැට්ස් මිල ගණන් අනුව)

ඉන්ධන වර්ගය	ඉහළම මිල (ඇමරිකන් ඩොලර් / බැරලයක්)	වාර්තා වූ මාසය	අවම මිල (ඇමරිකන් ඩොලර් / බැරලයක්)	වාර්තා වූ මාසය	සාමාන්‍ය මිල (ඇමරිකන් ඩොලර් / බැරලයක්)
බොරතෙල්	80.22	මාර්තු	63.62	ජූලි	72.093
පෙට්‍රල් 92 ඔක්ටේන්	84.833	පෙබරවාරි	75.029	මැයි	79.413
පෙට්‍රල් 95 ඔක්ටේන්	86.750	ජනවාරි	76.467	මැයි	81.173
ඔටෝ ඩීසල්	94.765	ජනවාරි	78.851	මැයි	86.661
සුපර් ඩීසල්	95.412	ජනවාරි	79.365	මැයි	87.568

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ii. ගෝලීය මිල ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් ආනයනික ඛනිජ තෙල් නිෂ්පාදන මත රඳා පවතින බැවින් ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල කෙරෙහි සෘජුවම බලපෑමක් ඇති කරනු ලැබේ. පෙට්‍රල් ඔක්ටේන් 92 සහ ඔටෝ ඩීසල් සඳහා ඉහළ දෛනික අලෙවියක් පවතින බැවින් එම ඉන්ධනවල ගෝලීය මිල උච්චාවචනයන් සෘජුවම දේශීය ඉන්ධන මිල කෙරෙහි බලපෑමක් ඇති කරනු ලැබේ. කෙසේ වෙතත්, පෙට්‍රල් ඔක්ටේන් 95 සහ සුපර් ඩීසල්වල දෛනික අලෙවිය සුළු ප්‍රමාණයක් වන බැවින් ජාත්‍යන්තර මිල වෙනස් වූ පමණින්ම දේශීය මිල වෙනස් වීමක් දක්නට නොලැබේ.

2025 වර්ෂය තුළ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් දරන ලද සාමාන්‍ය මාසික ආනයන පිරිවැය මත පදනම්ව,පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක් සඳහා වාර්තාගත ඉහළම පිරිවැය පෙබරවාරි මාසයේදී ඇමරිකානු ඩොලර් 84.833 ක් වූ අතර අවම පිරිවැය මැයි මාසයේදී ඇමරිකානු ඩොලර් 75.029 ක් විය. ඒ හා සමානව,ඔටෝ ඩීසල් සඳහා, බැරලයකට වාර්තාගත ඉහළම පිරිවැය ජනවාරි මාසයේදී ඇමරිකානු ඩොලර් 94.765 ක් වූ අතර අවම පිරිවැය මැයි මාසයේදී ඇමරිකානු ඩොලර් 78.851 ක් විය.

වගුව 1.8
ඉන්ධන ආනයනය කිරීමේදී දරන ලද පිරිවැයෙහි සාමාන්‍ය මාසික අගය - 2025
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

මාසය	බැරලයක සාමාන්‍ය ආනයන පිරිවැය (Landed Cost) (ඇ.ඩො.)	
	පෙට්‍රල් 92 ඔක්ටේන්	ලංකා ඔටෝ ඩීසල්
ජනවාරි	94.73	106.95
පෙබරවාරි	100.28	106.95
මාර්තු	105.44	109.51
අප්‍රේල්	108.34	109.32
මැයි	102.29	101.34
ජුනි	93.17	103.23
ජූලි	-	-
අගෝස්තු	89.93	94.99
සැප්තැම්බර්	83.66	86.82

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

1.5.3 2025 වර්ෂය සඳහා දේශීය ඛනිජ තෙල් සැපයුම සඳහා දායකත්වය

i. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය

මෑත කාලීන ආර්ථික අර්බුදයෙන් පසු ආර්ථිකය ක්‍රමයෙන් ස්ථාවර වීම සහ විදේශ විනිමය හිඟය ලිහිල් වීමත් සමග, 2025 වසර තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය වඩාත් සංවිධානාත්මක හා ස්ථාවර විය. ඒ අනුව, දේශීය ඛනිජ තෙල් ඉල්ලුම සපුරාලීම සඳහා, බොරතෙල් ඇතුළු

ඛනිජ තෙල් නිෂ්පාදන වර්ග අටක් (08) ඇතුළත් මෙට්‍රික් ටොන් 3,749,896.33 ක මුළු ප්‍රමාණයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ඇතුළු ප්‍රධාන සැපයුම්කරුවන් හතර දෙනෙකු (04) විසින් ආනයනය කර සපයන ලදී. මෙම ආනයන සඳහා වසර තුළ දරන ලද මුළු වියදම ඇමරිකානු ඩොලර් මිලියන 2,423.139 කි.

වගුව 1.9

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය - 2025.09.30 දිනට

නිෂ්පාදනය	නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.)				
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක්ස් සමාගම	එකතුව
බොර තෙල්	1,319,299				**1,319,299**
ලංකා ඔටෝ ඩීසල්	408,450.03	255,183.91	143,781	109,095.31	**916,510.25**
ලංකා සුපර් ඩීසල්	15,098.09	7,955.97	5,988	6,016.79	**35,058.85**
පෙට්‍රල් - 92 ඔක්ටේන්	465,751.15	241,242.46	125,977	110,834.25	**943,804.86**
පෙට්‍රල් - 95 ඔක්ටේන්	10,277.91	13,989.28	3,000	6,081.76	**33,348.95**
ගුවන් යානා ඉන්ධන	219,142.59	-	-	-	**219,142.59**
වැඩි සල්ෆර් දැවි තෙල්	-	-	19,122	-	**19,122.00**
අඩු සල්ෆර් දැවිතෙල් (180 CTS)	-	140,078.83	123,531	-	**263,609.83**
එකතුව	**2,438,018.77**	**658,450.45**	**421,399**	**232,028.11**	**3,749,896.33**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක්ස් සමාගම

වගුව 1.10

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය - 2025.09.30 දිනට

නිෂ්පාදනය	ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො. මිලියන)				
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක්ස් සමාගම	එකතුව
බොර තෙල්	761.473	-	-	-	**761.473**
ලංකා ඔටෝ ඩීසල්	222.047	170.421	136.63	73.87	**602.968**
ලංකා සුපර් ඩීසල්	10.106	5.559	3.99	4.16	**23.815**
පෙට්‍රල් - 92 ඔක්ටේන්	328.771	173.935	121.98	79.66	**704.346**
පෙට්‍රල් - 95 ඔක්ටේන්	7.215	10.170	2.33	4.58	**24.295**
ගුවන් යානා ඉන්ධන	152.269	-	-	-	**152.269**
වැඩි සල්ෆර් දැවි තෙල්	-	-	8.99	-	**8.99**
අඩු සල්ෆර් දැවිතෙල් (180 CTS)	-	77.043	67.94	-	**144.983**
එකතුව	**1,481.881**	**437.128**	**341.86**	**162.27**	**2,423.139**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක්ස් සමාගම

ii. ඛනිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීම

2025 වර්ෂය වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, ආර්.එම්. පාර්ක්ස් සමාගම සහ සිනොපෙක් එනර්ජී ලංකා පුද්ගලික සමාගම යන ඉන්ධන සැපයුම්කාර ආයතන හතර විසින් ඉන්ධන බෙදාහැරීමේ කටයුතු සිදු කරන අතර දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් මඟින් ඉන්ධන බෙදාහැරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

iii. ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

ජාතික ආර්ථිකයේ සියළු අංශයන්හි එනම් ප්‍රවාහන, විදුලි බල සැපයුම, කර්මාන්ත, කෘෂිකර්ම, ධීවර යනාදී අංශයන්හි ක්‍රියාකාරීත්වය බලශක්තිය සැපයුම මත රඳා පවතින බැවින් එම අංශවල සුමට ක්‍රියාකාරිත්වයක් පැවතීම සඳහා ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව එක් එක් ඉන්ධන සැපයුම්කරු විසින් 2025 වර්ෂයේ දී ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය සඳහා දක්වන ලද දායකත්වය පහතින් දැක්වේ. 2025.09.30 දින දක්වා සමස්ථ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මෙට්‍රික් ටොන් 4,656,810 ක් විය.

වගුව 1.11
සමස්ත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව (2025.09.30 දිනට)

පළාත	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	ආර්.එම්. පාර්ක්ස් සමාගම	සිනොපෙක් එනර්ජී ලංකා පුද්ගලික සමාගම	එකතුව
මධ්‍යම පළාත	71	36	10	11	**128**
නැගෙනහිර පළාත	90	19	13	15	**137**
උතුරුමැද පළාත	59	14	9	9	**91**
උතුරු පළාත	96	16	7	7	**126**
වයඹ පළාත	129	28	23	28	**208**
සබරගමුව පළාත	57	17	10	10	**94**
දකුණු පළාත	119	27	11	13	**170**
ඌව පළාත	40	16	8	9	**73**
බස්නාහිර පළාත	226	96	39	48	**409**
එකතුව	**887**	**269**	**130**	**150**	**1,436**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක්ස් සමාගම

වගුව 1.12
ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය (2025.09.30 දිනට)

නිෂ්පාදනය	අලෙවි ප්‍රමාණය (මෙ.ටො.)				
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක්ස් සමාගම	එකතුව (මෙ.ටො.)
පෙට්‍රල් - 92 ඔක්ටේන්	1,078,772	223,069.104	120,178.74	82,210	**1,504,230**
පෙට්‍රල් - 95 ඔක්ටේන්	31,958	12,893.404	4,253.87	3,488	**52,593**
ලංකා ඔටෝ ඩීසල්	1,076,668	264,484.367	139,547.34	93,701	**1,574,401**
ලංකා සුපර් ඩීසල්	28,112	9,190.909	5,453.71	4,731	**47,488**
ලංකා භූමිතෙල්	179,270	-	-	-	**179,270**
ලංකා කර්මාන්ත භූමිතෙල්	10,529	-	-	-	**10,529**

ලංකා රසායනික නැප්තා	186,320	-	-	-	**186,320**
ලංකා දැවි තෙල් 800	-	-	-	-	-
ලංකා දැවි තෙල් 1500 (වැඩි සල්ෆර්)	83,864	-	-	-	**83,864**
ලංකා දැවි තෙල් 1500 (අඩු සල්ෆර්) ලංකා දැවි තෙල් 1500 (අඩු සල්ෆර්)	96,443	169,360.955	-	-	**265,804**
ලංකා දැවි තෙල් සුපර්	132,012	-	-	-	**132,012**
ගුවන් යානා ඉන්ධන	598,656	-	-	-	**598,656**
සොල්වන්ට් (SBP) ද්‍රාවණය	1,618	-	-	-	**1,618**
ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු	19,918	-	-	-	**19,918**
ලංකා ගැස්	108	-	-	-	**108**
එකතුව	**3,524,248**	**678,999**	**269,434**	**184,130**	**4,656,810**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක්ස් සමාගම

සැලකිය යුතුයි :

බැරල් 1 = ලීටර් 159

කිලෝ ලීටර් 1 = ලීටර් 1000 = බැරල් 6.29

බොර තෙල් : මෙට්‍රික් ටොන් 1 = බැරල් 7.33 = කිලෝ ලීටර් 1.165

ඩීසල් : මෙට්‍රික් ටොන් 1 = බැරල් 7.45 = කිලෝ ලීටර් 1.19

පෙට්‍රල් : මෙට්‍රික් ටොන් 1 = බැරල් 8.5 = කිලෝ ලීටර් 1.36

වගුව 1.13

සමස්ත සාමාන්‍ය දෛනික තෙල් පරිභෝජනය (මෙ.ටො.)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම

මාසය	92 ඔක්ටේන් (දිනකට මෙ.ටො.)	95 ඔක්ටේන් (දිකනට මෙ.ටො.)	සුපර් ඩීසල් (දිකනට මෙ.ටො.)	ඔටෝ ඩීසල් (දිකනට මෙ.ටො.)	සමස්ත දෛනික ඉන්ධන පරිභෝජනය මෙ.ටො.
ජනවාරි	3,689.01	130.8	500.43	3,876.75	**8,196.99**
පෙබරවාරි	3,836.91	130.95	549.13	4,653.61	**9,170.60**
මාර්තු	3,823.75	129.88	552.49	4,380.14	**8,886.26**
අප්‍රේල්	4,154.48	142.43	536.64	4,144.41	**8,977.96**
මැයි	4,024.81	142.64	504.25	4,014.56	**8,686.26**
ජුනි	4,299.94	175.92	618.38	4,579.44	**9,673.68**
ජූලි	3,823.03	144.26	516.83	3,956.86	**8,441.00**
අගෝස්තු	3,973.43	164.71	571.51	4,306.96	**9,016.61**
සැප්තැම්බර්	3,939.96	173.72	573.34	4,362.38	**9,049.40**
සාමාන්‍ය (ජන-සැප්)	**3,951.48**	**148.15**	**547.89**	**4,252.90**	**8,900.42**

මූලික අන්තර්ගතයන්

සමස්ත සාමාන්‍ය දෛනික ඉන්ධන පරිභෝජනය (ජන - සැප් 2025) : දිනකට මෙ.ටො. 8900

උපරිම මුළු පරිභෝජනය : ජුනි (දිනකට මෙ.ටො. 9,674)

අවම මුළු පරිභෝජනය : ජූලි (දිනකට මෙ.ටො. 8,441)

ඔක්ටේන් 92 විශාලතම දෛනික කොටස සඳහා දායක වන අතර එය මුළු ඉන්ධන පරිභෝජනයෙන් සාමාන්‍යයෙන් 44% කි.

ප්‍රස්තාරය 1.4:
2025 වර්ෂයේ සමස්ත සාමාන්‍ය දෛනික තෙල් පරිභෝජනය



මූලාශ්‍රය: ලංක ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම

1.5.4 2025 වර්ෂය තුළ ඉටු කරන ලද නියාමන කාර්යයන්

- **ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නව නියාමකයෙකු හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ පසුභාග ඛනිජ තෙල් කර්මාන්තය සඳහා මෙතෙක් පුළුල් නියාමන යාන්ත්‍රණයක් නොතිබූ අතර, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන තෙල්, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (LPG) සහ ලිහිසි තෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම ඇතුළත් ඛනිජතෙල් කර්මාන්තය, විදුලිබල ක්ෂේත්‍රය සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය අධීක්ෂණය හා නියාමනය කිරීමට පාර්ලිමේන්තුව විසින් විවිධ පනත් සම්මත කර ගෙන ඇති අතර, දැනට මෙම ක්ෂේත්‍ර එම නීති රාමු තුළ ක්‍රියාත්මක වේ. මෙලෙස ඒකාබද්ධතාවයක් හා ඒකීය නියාමනයක් නොමැතිකම හේතු කොටගෙන එකම කාර්යය විවිධ පාර්ශ්ව විසින් සිදු කිරීම මෙන්ම එකම කාර්යය යළි යළිත් සිදු කිරීම නිසා අකාර්යක්ෂමතාවය මෙන්ම රටේ බලශක්ති සංක්‍රාන්තිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අභියෝගාත්මක වී ඇත. වර්තමානයේ ඛනිජ තෙල් වෙළඳපොළ ක්‍රියාකාරකම් පුළුල්වීමත් සමඟම නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීම හේතුවෙන්, නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වාගෙනයාම සහ පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ස්වාධීන නියාමකයෙකු සහ ශක්තිමත් නියාමන රාමුවක අවශ්‍යතාවය වර්තමාන රජය විසින් හඳුනා ගෙන ඇත.

ඒ අනුව, ක්ෂේත්‍රයේ අනෙකුත් කර්මාන්ත පනත් ඒකාබද්ධ කර උසස් මට්ටමේ බලශක්ති සංක්‍රාන්ති පනතක් සකස් කිරීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇත. ඒ තුළින් බලශක්ති පාරිභෝගිකයන්ගේ අභිලාශයන් සපුරාලීමත් බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රජා සහභාගීත්වය සවිබල ගැන්වීමත් අපේක්ෂා කෙරේ.

මේ අතර, ලිහිසි තෙල් වෙළඳපොළ නියාමනය කිරීම සඳහා ස්ථිර නියාමකයකු පත් කරන තෙක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මේ වන විට බලය ලබා දී ඇත.

- **ඉන්ධන පිරවුම්හල් ඉදි කිරීම සහ මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳ මාර්ගෝපදේශ හඳුන්වා දීම.**

වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සහ බෙදාහැරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් පමණක් සිදු කරන ලදී. කෙසේ නමුත් වෙළඳපොළ ලිහිල්කරණයත්

සමඟ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) අමතරව, ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC), සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම (Sinopec), ආර්.එම්.පාර්ක්ස් පුද්ගලික සමාගම සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා පුද්ගලික සමාගම (UP) යන ආයතන මඟින් ද ඉන්ධන ආනයනය සහ බෙදාහැරීම සිදු කරනු ලැබේ. කෙසේ වුවත්, යම් යම් ගැටළු නිසා මේ වන විට යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා පුද්ගලික සමාගම ශ්‍රී ලංකා වෙළඳපොළෙන් ඉවත්ව ගොස් ඇත.

නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීමත් සමඟම, ඉන්ධන පිරවුම්හල් ස්ථාපනය කර පවත්වාගෙන යාමේ අවම ප්‍රමිතීන් ආරක්ෂා කර ගැනීමට පහත ක්ෂේත්‍ර සඳහා මාර්ගෝපදේශ බලශක්ති අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලදී.

- ඉන්ධන පිරවුම්හල් ස්ථානගත කිරීමේ නිර්ණායක
- ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීමේ නිර්ණායක
- ඉන්ධන පිරවුම්හල්වල මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමේ නිර්ණායක

මෙම මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙසට ඉන්ධන සැපයුම්කාර ආයතන දැනුවත් කර ඇති අතර, මහජනතාවගේ දැන ගැනීම සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවියේ මාර්ගෝපදේශ පළ කරන ලදී. තවද මෙම මාර්ගෝපදේශ අනුව නව ඉන්ධන සැපයුම්කාර ආයතන කටයුතු කරන්නේද යන්න පිළිබඳව අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

- **ඛනිජ තෙල් නිෂ්පාදන සෘජුවම පාරිභෝගික ආයතන වෙත සැපයීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම**

ඉන්ධන සැපයුම්කාර ආයතන/ සමාගම් විසින් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් මඟින් සහ සෘජුවම විවිධ පාරිභෝගික ආයතන, එනම්, කර්මාන්ත, ව්‍යාපාරික ස්ථාන හඳුනා ගන්නා ලද විශේෂිත රජයේ ආයතන යනාදිය වෙත ඉන්ධන බෙදාහැරීම සිදු කරනු ලැබේ. ඉන්ධන පිරවුම්හල් ස්ථාපිත කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශයේ විධිමත් අනුමැතිය ලබා ගනු ලැබුවද සෘජුවම එම පාරිභෝගික ආයතන වෙත ඉන්ධන තොග සැපයීම සඳහා මීට පෙර අමාත්‍යාංශයෙන් අනුමැතියක් ලබා නොගන්නා ලදී. 2023 ඔක්තෝබර් 31 වන විට ඉන්ධන සැපයුම්කාර ආයතන විසින් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 3385 ක් පමණ පවත්වාගෙන යනු ලබන බව අමාත්‍යාංශයට නිරීක්ෂණය විය.

මෙම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන මඟින් සැලකිය යුතු ඉන්ධන ප්‍රමාණයක් දෛනිකව බෙදාහැරීම සිදු කරනු ලබන බැවින් එම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පිහිටුවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ඒ අනුව, දැනට ලියාපදිංචි වී ඇති පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අතරින් තවදුරටත් පවත්වා ගෙන යායුතු මධ්‍යස්ථාන සහ නව ආයතන ලියාපදිංචි කිරීම සඳහා අවම නිර්ණායක හඳුන්වා දීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදී.

මෙම අවම නිර්ණායක සම්පූර්ණ කරනු ලබන පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්ධන සැපයුම්කාර ආයතන අමාත්‍යාංශයේ විධිමත් අනුමැතිය ලබා ගත යුතුය. 2025.09.30 දිනට ක්‍රියාත්මක පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත වගුවේ පරිදි වේ.

වගුව 1.14
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව - 2025.09.30 දිනට

සැපයුම්කාර සමාගම	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	521
ලංකා ඉන්දියානු තෙල් සමාගම	178
සිනොපෙක් එනර්ජි ලංකා සමාගම	14
එකතුව	**713**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම

- **අලුතින් පිහිටුවන ලද සහ පවතින පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම**

අළුතින් ආරම්භ කරනු ලබන පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ කටයුතු සහ දැනට පවතින පාරිභෝගික සේවා මධ්‍යස්ථාන නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු අමාත්‍යාංශය හරහා සිදු කරයි.

- **ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම**

දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ඉන්ධන මිලකරණ යාන්ත්‍රණය අක්‍රමවත් හා ක්‍රමානුකූල නොවන ආකාරයකින් ක්‍රියාත්මක වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැඩි මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දෙන ලදී. ස්ථාවර පද්ධතියක් නොමැති විට පෙර මිල සංශෝධන බොහෝ විට ඉන්ධන මිලෙහි හදිසි හා සැලකිය යුතු උච්ඡාවචනයන්ට හේතු විය. මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා, රජය 2022 මැයි මාසයේදී පිරිවැය පිළිබිඹු කරන ඉන්ධන මිල සූත්‍රයක් හඳුන්වා දීමට මූලිකත්වය ගත් අතර, එමගින් ඉන්ධන මිල ගණන් සැබෑ පිරිවැය මත පදනම්ව තීරණය වන බව සහතික කරන අතර එමගින් වෙළඳපොලේ වැඩි මිල ස්ථාවරත්වයක් පවත්වා ගැනීමට උපකාරී වේ.

2025 වර්ෂයේදී අවස්ථා නවයකදී (09) ඉන්ධන මිල සංශෝධන සිදු කරන ලදී. 2025 සැප්තැම්බර් මාසයේ ඉන්ධන මිල ගණන් 2024 සැප්තැම්බර් මාසයේ ඉන්ධන මිල ගණන් සමඟ සසඳන විට, පහත පරිදි මිල ගණන් අඩු වී ඇති බව නිරීක්ෂණය විය

- පෙට්‍රල් (ඔක්ටේන් 92) - 10% කින්
- පෙට්‍රල් (ඔක්ටේන් 95) - 11% කින්
- ඔටෝ ඩීසල - 9.7% කින්
- සුපර් ඩීසල් - 11% කින්
- ලංකා භූමිතෙල් 10.89% කින්

වගුව 1.15

2025 වර්ෂය තුළ වාර්තා වූ උපරිම සහ අවම වෙළෙඳපොළ මිල ගණන්

නිෂ්පාදනය	උපරිම මිල (රු./ලීටර්)	වාර්තා වූ මාසය	අවම මිල (රු./ලීටර්)	වාර්තා වූ මාසය
පෙට්‍රල් (ඔක්ටේන් 92)	රු. 309.00	(ජනවාරි/පෙබරවාරි)	රු. 293.00	(අප්‍රේල්/මැයි)
පෙට්‍රල් (ඔක්ටේන් 95)	රු. 371.00	(ජනවාරි/පෙබරවාරි)	රු. 335.00	(සැප්තැම්බර්)
ඔටෝ ඩීසල්	රු. 289.00	(ජුනි /ජූලි)	රු. 277.00	(සැප්තැම්බර්)
සුපර් ඩීසල්	රු. 331.00	(ජනවාරි/පෙබරවාරි/මාර්තු)	රු. 313.00	(සැප්තැම්බර්)
ලංකා භූමිතෙල්	රු. 185.00	(ජුනි/ජූලි/අගෝස්තු)	රු. 178.00	(අප්‍රේල්/මැයි)

මූලාශ්‍රය : බලශක්ති අමාත්‍යාංශය

ප්‍රස්තාරය 1.5

2025.09.30 දිනට වාර්තා වූ වෙළෙඳපොළ මිල ගණන් (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව)









මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

1.5.5 ඛනිජ තෙල් වෙළඳපොළ ස්වභාවය

- **ලිහිසි තෙල් වෙළඳාම**

ශ්‍රී ලාංකික පාරිභෝගිකයා වෙත ගුණාත්මක හා උසස් ප්‍රමිතියෙන් යුතු ලිහිසි තෙල් හා ග්‍රීස් නිෂ්පාදන තරගකාරී මිල ගණන් යටතේ ලබා දීම ලිහිසි තෙල් වෙළඳපොළ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාවයි.

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 5(c) වගන්තිය හා ඊට අනුශාංගික සංශෝධිත විධිවිධාන අනුව" ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලෙස "ලිහිසි තෙල්" නිර්වචනය කර ඇත. ඒ අනුව අදාළ බලතල ප්‍රකාරව 2006.05.08 දිනැති අංක 06/0858217/015 දරණ කැබිනට් පත්‍රිකාව (2006.05.24 දිනැති තීරණය) අනුව අංක 1453/6 හා 2006.07.12 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ශ්‍රී ලංකාවේ ලිහිසි තෙල් වෙළඳපොළ සම්පූර්ණයෙන්ම ලිහිල්කරණය කරන ලදී.

ඒ අනුව 2025 වර්ෂය වන විට මෙරට ලිහිසි තෙල් ආනයනය සඳහා ආයතන 34 කට අනුමැතිය ලැබී ඇති අතර ඒවා සන්නාමයන් 45 ක් යටතේ තම ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබයි. එම ආයතන අතරින් ආයතන 4 ක් මෙරට තුළ ලිහිසි තෙල් නිෂ්පාදනය සිදු කරයි. මෙහිදී ක්‍රියාකාරකම් 5 ක් යටතේ කටයුතු කරනු ලබයි.

වගුව 1.16
ලිහිසිතෙල් අංශයේ ක්‍රියාකාරකම් - 2025

ක්‍රියාකාරකම	විස්තරය	ආයතන ප්‍රමාණය
A1	ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය,විකිණීම, සැපයීම, බෙදාහැරීම, මිශ්‍ර කිරීම හා නිෂ්පාදනය	4
A2	ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය,විකිණීම, සැපයීම හා බෙදාහැරීම	27
B	අමිශ්‍ර සම්ප්‍රේෂණ තෙල් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හා බෙදාහැරීම	1
C1	සමුද්‍රීය ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හා	1
C2	කාර්මික ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හා බෙදාහැරීම	1

මීට අමතරව මෙම අමාත්‍යාංශය මූලිකත්වයෙන් ශ්‍රී ලංකාවේ ලිහිසි තෙල් කර්මාන්තය වෙනුවෙන් නව ප්‍රතිපත්තියක් හඳුන්වා දීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. එය 2026 වර්ෂයේ මුල් කාර්තුව තුළ අවසන් කිරීමට අපේක්ෂිතය.

- **තාර වෙළඳාම**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව මඟින් තාර නිෂ්පාදනය සිදු කරනු ලබන අතර එය දේශීය ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට ප්‍රමාණවත් නොවේ. එබැවින් පිළිගත් නිර්ණායක මත පදනම්ව වෙනත් ආයතන සඳහා තාර ආනයනය කිරීමට අවසර ලබා දීම සිදුවේ. 2025 වර්ෂයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැර වෙනත් ආයතන 10 ක් වෙත මෙ.ටො. 185,000 ක ප්‍රමාණයක තාර ආනයනය සඳහා අනුමැතිය ලබා දී ඇත. මෙම අනුමැතිය ලබා දුන් ප්‍රමාණයෙන් මෙ.ටො. 55,944.5 ක ප්‍රමාණයක් ආනයනය වෙනුවෙන් විරෝධතාවයක් නොමැති බවට ලිපි එම ආයතන වෙනුවෙන් ලබා දී ඇත. ශ්‍රී ලංකාව තුළ තාර ආනයනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමට නියමිතය.

- **නැව් තෙල් වෙළඳාම**

මේ වන විට නැව් තෙල් ආනයනය වෙනුවෙන් ආයතන 12 ක් සඳහා අනුමැතිය ලැබී ඇත. මෙම අනුමැතිය ලබා දුන් ප්‍රමාණයෙන් මෙ.ටො. 778,979.13 ක ප්‍රමාණයක් ආනයනය වෙනුවෙන් විරෝධතාවයක් නොමැති බවට ලිපි ලබා දී ඇත. නැව් තෙල් වෙළඳාම වඩාත් පුළුල්ව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා නව ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයෙකුගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර, මේ වන විට කමිටු රැස්වීම් 4 ක් පවත්වා ඇත. මෙහි අවසාන වාර්තාව 2025 දෙසැම්බර් මාසය වන විට ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිතය.

- **ගුවන් යානා ඉන්ධන වෙළඳාම**

ගුවන් යානා සඳහා භාවිතා කරන ජෙට් ඒ 1 ඉන්ධන සැපයීමේ කාර්යය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කරන අතර මීට අමතරව ජෙට් ඒ 1 ඉන්ධන ආනයනයට Cannel (Pvt) Ltd ආයතනයට අනුමැතිය ලබා දී ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත ප්‍රකාරව ගුවන් යානා ඉන්ධන සැපයීමේ බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරී බලය විෂය භාර අමාත්‍යවරයාට හිමිව ඇත. ශ්‍රී ලංකාව තුළ ජෙට් ඒ 1 ආනයනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමට බලාපොරොත්තු වේ.

- **කර්මාන්ත හා සේවා සඳහා මෙරට බලපත්‍රලාභීන් ආනයනය නොකරන ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය වෙනුවෙන් විරෝධතාවයක් නොමැති බවට ලිපි නිකුත් කිරීම - 2025**

මෙරට කර්මාන්ත හා සේවා සඳහා අත්‍යාවශ්‍ය ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීමට බලපත්‍රලාභී ආයතන වෙත බලය ලබා දී ඇති අතර එම ආයතන විසින් ආනයනය නොකරන වෙනත් නිෂ්පාදන ආනයනය සඳහා නොයෙක් ආයතන විසින් අමාත්‍යාංශය වෙත දෛනිකව ඉල්ලීම් ඉදිරිපත් කරයි. එම ඉල්ලීම් පිළිබඳ සළකා බැලීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් පත් කර ඇති කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරයි.

තවද පහත ආයතනවල නිර්දේශ ද වෙන වෙනම ලබා ගනී.

- කර්මාන්ත අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
- රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

- අදාළ අනෙකුත් ආයතන

ඒ අනුව, 2025 වර්ෂය තුළ පහත කාණ්ඩ යටතේ ආනයන කටයුතු සඳහා බලශක්ති අමාත්‍යාංශය විසින් විරෝධතාවයක් නොමැති බවට ලිපි නිකුත් කර ඇත.

- රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- රූපලාවන්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- තීන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- වෙනත් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- වෙනත් කර්මාන්ත හා සේවා ආයතන වෙත අලෙවි කිරීම සඳහා

2025 වසර තුළ අමාත්‍යාංශය විසින්,

- වෙනත් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉන්ධන ආනයනය වෙනුවෙන් විරෝධතාවයක් නොමැති බවට ලිපි 383 ක් ද
- වෙනත් කර්මාන්ත හා සේවා ආයතන වෙත අලෙවි කිරීම සඳහා ඉන්ධන ආනයනය වෙනුවෙන් විරෝධතාවයක් නොමැති බවට ලිපි 69 ක් ද නිකුත් කර ඇත.

1.5.6 ඛනිජ තෙල් ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

- **අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**

හම්බන්තොට ආශ්‍රිතව අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් 2023.02.24 දින සුදුසුකම්ලත් ආයෝජකයන් වෙතින් අභිලාෂ කැඳවන ලද අතර ඒ සඳහා ආයෝජකයින් හත්දෙනෙකු (07) සිය අභිලාෂ ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීමට ලක් කිරීමෙන් පසු විස්තරාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආයතන දෙකක් සුදුසුකම් ලබන ලදී. එම ආයතන දෙක අතරින් චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් (M/s China Petroleum and Chemical Corporation) සමාගම පමණක් විස්තරාත්මක යෝජනාව ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘති ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් මෙම විස්තරාත්මක යෝජනාව සලකා බැලීමෙන් අනතුරුව, පිරිපහදුව ඉදිකර පවත්වාගෙන යාමට චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් ආයතනය සමඟ ගිවිසුම් ගත වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

ඒ අනුව චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් ආයතනය සමඟ ගිවිසුම් ගත වීම සඳහා සාකච්ඡා වට හතරක් පවත්වන ලද අතර සාකච්ඡා අවසන් අදියරේ පවතී. මේ පිළිබඳව අවසාන එකඟතාවයකට එළඹී පසුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට නියමිතය.

ව්‍යාපෘතියේ ප්‍රධාන ලක්ෂණ

- අපේක්ෂිත ධාරිතාවය - දිනකට අවම බොරතෙල් බැරල් ලක්ෂයක් පිරිපහදු කිරීම
- අපේක්ෂිත ආයෝජනය - ඇ.එ.ජ.ඩො. බිලියන 1.5 ත් 2 ත් අතර
- ව්‍යාපෘතිය නිමකිරීමට අපේක්ෂිත කාලය - (2024 - 2028)

යෝජිත පිරිපහදුවේ ආකෘතියක්

මෙම ව්‍යාපෘතිය මඟින්,

- රට තුළ ඉන්ධන සුරක්ෂිතතාවය තහවුරු කිරීම
- නව රැකියා අවස්ථා උදාකිරීම
- ඛනිජ තෙල් කර්මාන්තය ආශ්‍රිත නව කර්මාන්ත අවස්ථා බිහිවීම
- විදේශ විනිමය වාසියක් මෙරටට ලබා ගැනීම

අපේක්ෂා කරනු ලැබේ.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) - ඉන්ධන ටැංකි 24
- ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) - ඉන්ධන ටැංකි 14
- ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගම (TPTL) - ඉන්ධන ටැංකි 61

රූප සටහන 2
ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය

- **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධන ව්‍යාපෘතිය**

ත්‍රිකුණාමලයේ චීන වරායේ ඉහළ ටැංකි අංගනය, යටත් විජිත යුගයේ නැව් සඳහා ඉන්ධන සැපයීමට බ්‍රිතාන්‍ය රජය විසින් ඉදිකර ඇති අතර එය මෙ.ටො. 10,000 බැගින් වූ ටැංකි අනූ නවයකින් (99) සමන්විත ය.

මෙම ඉන්ධන ගබඩා ටැංකි සංවර්ධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/2285/325/050 දරණ 2022.01.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වසර 50 ක කාලයක් සඳහා පහත සඳහන් ආකාරයට බදු දීමට තීරණය විය.

- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ටැංකි 24 සංවර්ධනය කිරීමේ ප්‍රගතිය**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ත්‍රිකුණාමල ඉන්ධන තෙල් ටැංකි 24 සංවර්ධනය කිරීම සඳහා ඩොලර් මිලියන 20 ක් ඇස්තමේන්තු කර ඇති අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මූල්‍යනය කරමින් අදියර දෙකක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

2025.09.30 දින වන විට 40 සහ 41 ටැංකිවල නවීකරණ කටයුතුවලින් 75%ක් අවසන් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2027 මාර්තු වන විට අවසන් කිරීමට නියමිතය.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි 24 සංවර්ධනය

- **ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගමට අයත් ටැංකි සංවර්ධනය කිරීමේ ප්‍රගතිය**

ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇති ඉන්ධන ටැංකි 61 සංවර්ධනය කිරීමේ මූලික පියවර වශයෙන් පහත සඳහන් කටයුතු දැනටමත් සිදු කර ඇත.

- ඉන්ධන ටැංකි දහයක් (10) සඳහා ප්‍රවේශය ලබා දීමට අවශ්‍ය වන භූමි ප්‍රදේශය පිරිසිදු කිරීම
- බියුරෝ වෙරිටාස් ලංකා පුද්ගලික සමාගම වෙතින් මෙම තෙල් ටැංකි දහය (10) සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම
- ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර මෙහිදී දිගුකාලීන හා කෙටිකාලීන ලෙස සංවර්ධන උපාය මාර්ග හඳුනා ගැනීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ආයෝජකයකු තෝරා ගැනීම සඳහා අභිලාශ කැඳවන ලද අතර ආයතන 05 ක් සිය යෝජනා ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ව්‍යාපෘති කමිටුව සහ සාකච්ඡා සම්මුති කමිටුව යෝජනා ඇගයීම් සිදු කරමින් පවතී.

එහෙත්, ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය හා ශ්‍රී ලංකාව අතර ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති බැවින් ඒ යටතේ මෙම ටැංකි 61 ද සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මේ සම්බන්ධයෙන් ත්‍රෛපාර්ශ්වික සාකච්ඡා පැවැත්වෙන අතර ව්‍යාපාර ආකෘතිය (Business Model) මේ වන විට සකස් කිරීමට කටයුතු කරමින් පවතී.

- **ත්‍රිකුණාමලය බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය (එක්සත් අරාබි එමීර් රාජ්‍යය) අතර සහයෝගීතාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ඉන්දීය ජනරජය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අනුමැතිය ඉල්ලා බලශක්ති අමාත්‍යාංශය සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් 2025.03.28 දින ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. 2025.04.02 දිනැති අංක 25/0567/825/031-I දරන තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය මෙම යෝජනාවට අනුමැතිය ලබා දුන්නේය. ඒ අනුව, ශ්‍රී ලංකාව වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2025.04.05 දින අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. මේ සම්බන්ධයෙන් දැනට ත්‍රෛපාර්ශ්වික සාකච්ඡා සිදුවෙමින් පවතී.

1.5.7 2026 වර්ෂය සඳහා බලශක්ති අංශයේ ඉදිරි සැලසුම්

දේශීය බලශක්ති ඉල්ලුම සපුරාලීමේ දී පොසිල ඉන්ධන තවදුරටත් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන අතර, දේශීය බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම සහ ගෝලීය බලශක්ති සැපයුමට ශ්‍රී ලංකාව දායක කිරීම අරමුණු කරගෙන 2025 වර්ෂය තුළ දී පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- **සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම සහ නව පිරිපහදුවක් ඉදිකිරීම**

අප රට තුළ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 25% ක් පමණ සපුගස්කන්ද තෙල් පිරිපහදුව මඟින් සපයනු ලබයි. ඉතිරි 75% ක පමණ ප්‍රමාණය ආනයනය කිරීම මඟින් සපුරා ගනු ලබයි. මෙය විදේශ විනිමය සංචිතය කෙරෙහි බලපෑමක් ඇති කරනු ලබන තත්ත්වයකි. දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාවය අප රට තුළම පිරිපහදුව මඟින් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරන බැවින් දැනට පවතින පිරිපහදුව ඒ සඳහා නවීකරණය කළ යුතුව ඇත. එමෙන්ම දිනකට බැරල් 10,000 ක පිරිපහදු ධාරිතාවයක් සහිත නව පිරිපහදුවක් ඉදි කිරීමේ අවශ්‍යතාවය ද පවතී. ඒ සඳහා මේ වන විට ජාත්‍යන්තර සමාගම් වෙතින් අභිලාෂ කැඳවා ඇති අතර එයට ප්‍රතිචාර වශයෙන් අභිලාෂ 20 ක ප්‍රමාණයක් ලැබී ඇත. මේ වන විට එම ලේඛණ ගොනු ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

- **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම**

මේ වන විට ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය තුළ පවතින ටැංකි 99 ක ප්‍රමාණය අතරින් ටැංකි 24 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ද තෙල් ටැංකි 61 ක් ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත සමාගම මඟින් ද සංවර්ධනය කිරීමට මූලික පියවර ගෙන ඇත. ඒ අතරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ටැංකි 24 න් ටැංකි 2 ක අළුත්වැඩියා කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

එහෙත්, ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය හා ශ්‍රී ලංකාව අතර ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති බැවින් ඒ යටතේ මෙම ටැංකි 61 ද සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මේ සම්බන්ධයෙන් ත්‍රෛපාර්ශ්වික සාකච්ඡා පැවැත්වෙන අතර, ව්‍යාපාර ආකෘතිය (Business Model) මේ වන විට සකස් කිරීමට කටයුතු කරමින් පවතී.

- **විද්‍යුත් වාහන ආරෝපනය සඳහා දිවයින පුරා ආරෝපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

මේ වන විට විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථාන 10 ක් ඉදි කිරීමට ඉලක්කගත කර ඇති අතර එයින් ස්ථාන 07 ක මේ වන විට ඉදි කිරීම් කටයුතු අවසන්ව ඇත. පාරිභෝගිකයන් සඳහා අදාළ සේවාව ලබා දීමද අරඹා ඇත. තවත් ස්ථාන 03 ක එනම්, අනුරාධපුරය, දෙමටගොඩ සහ බම්බලපිටිය යන ප්‍රදේශවල ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

විද්‍යුත් වාහන ආරෝපණ යටිතල පහසුකම් සඳහා වැඩිවන ඉල්ලුමට සහාය වීම පිරිසිදු සහ ප්‍රවාහනය කරා මාරුවීම දිරිමත් කිරීමේ අරමුණින්, දිවයින පුරා උපායමාර්ගිකව පිහිටා ඇති පිරවුම්හල්වල විදුලි වාහන (EV) ආරෝපණ මධ්‍යස්ථාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන තිබේ.

- **ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම**

රට තුළ බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ඉන්ධන ගබඩා ධාරිතාවයක් පවත්වා ගත යුතුය. මෙම අවස්ථාව වන විට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මෙට්‍රික් ටොන් 440,147 ක සමස්ත ගබඩා ධාරිතාවයක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම ධාරිතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා පහත පරිදි නව ගබඩා ටැංකි ඉදි කිරීමට සැලසුම් කර ඇත.

වගුව 1.17
ඉන්ධන ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලියන)	අරමුදල් සම්පාදනය	වර්තමාන තත්වය
කොලොන්නාව ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 64,000 කින් යුත් ටැංකි 06 ක් ඉදි කිරීම	3,374	ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	ටැංකි 6 ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත
කොලොන්නාව ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 22,000 කින් යුත් ටැංකි 02 ක් ඉදි කිරීම	1,470.4	ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	මෙම ටැංකි දෙක ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය.
මුතුරාජවෙල ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 40,000 කින් යුත් ටැංකි 03 ක් ඉදි කිරීම	3,496	ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ප්‍රසම්පාදන ලේඛන සකස් කෙරෙමින් පවතී.

- **ඉන්ධන ප්‍රවාහන නල මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම**

කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය කරනු ලබන නල මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතී. මේ හේතුවෙන් ඉන්ධන කාන්දුවීම් මෙන්ම ඉන්ධන ගොඩබෑම සඳහා වැඩි කාලයක් සහ පිරිවැයක් දැරීමට සිදුව ඇත. එබැවින් ඉන්ධන ගොඩබෑම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම සඳහා නල මාර්ග ඉදිකිරීමට සැලසුම් කරන ලදී.

වගුව 1.18
ඉන්ධන නල මාර්ග සංවර්ධන ව්‍යාපෘති

විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලියන)	අරමුදල් සම්පාදනය	වර්තමාන තත්වය
කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා අඟල් 18 ක විෂ්කම්භයකින් යුත් නල මාර්ග යක් ඉදිකිරීම	2,852.5	ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	සංශෝධිත තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව යොමු කර ඇති අතර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීමක් පැවැත්වීමට නියමිතව ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ගැනීම සඳහා පරීක්ෂා කර අවසන් ලේඛණය ඉදිරිපත් කළ යුතුය.
කොලොන්නාව පර්යන්තයේ සිට කැළණිතිස්ස බලාගාරය දක්වා අඟල් 12 විෂ්කම්භයකින් යුත් නල මාර්ගයක් ඉදිකිරීම.	1,444	ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය.
ගුවන් යානා ඉන්ධන ප්‍රවාහනය සඳහා මුතුරාජවෙල සිට කටුනායක ගුවන් තොටුපොළ දක්වා නල මාර්ගයක් ඉදිකිරීම	18,000	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)	කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇති අතර නොවැම්බර් මාසයේ මැද භාගයේදී මිල ගනන් විවෘත කිරීමට නියමිතව ඇත

1.6 2025 වසරේ මූල්‍ය ප්‍රගතිය

වගුව 1.19
2025 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයේ මූල්‍ය ප්‍රගතිය - බලශක්ති අමාත්‍යාංශය (ශීර්ෂය 119)

	වියදම් විස්තරය		වෙන් කරන ලද ප්‍රතිපාදනය (රු.මිලි.)	වියදම	
				2025.09.30 දිනට (රු.මිලි.)	% ලෙස
	මෙහෙයුම් ක්‍රියාකාරකම්				
	අමාත්‍ය කාර්යාලය				
1	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	ගොඩනැගිලි	0.50	0.00	0%
		යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	0.50	0.02	4%
		වාහන	2.00	0.00	0%
2	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	ලී බඩු සහ කාර්යාලීය උපකරණ	0.50	0.01	2%
		යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	0.50	0.00	0%
	ආයතන හා පරිපාලන සේවා				
1	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	ගොඩනැගිලි	0.50	0.39	78%
		යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.00	0.27	27%
		වාහන	1.00	0.37	37%
2	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	ලී බඩු සහ කාර්යාලීය උපකරණ	1.00	0.20	20%
		යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	7.00	0.04	1%
		මෘදුකාංග සංවර්ධනය	9.00	0.00	0%
3	ධාරිතා සංවර්ධනය	කාර්ය මණ්ඩල පුහුණුව	1.00	0.47	47%
4	ඛනිජ තෙල් සංවර්ධන රාමුව	පර්යේෂණ සහ සංවර්ධන	0.50	0.00	0%
	සංවර්ධන ක්‍රියාකාරකම්				
1	ලංවිම ලබාගත් විදේශ ණය ගිණුම්ගත කිරීම (ADB/JICA)		7,676.00	2,125.11	28%
2	කොළඹ නගරයේ අපද්‍රව්‍ය භාවිතා කරමින් විදුලිය උත්පාදනය කිරීමේ බලාගාර ව්‍යාපෘතිය		1,204.00	239.73	20%
3	විදුලිබල අංශය සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘතිය (JICA)		0.60	0.01	2%
4	කොරියානු රජයේ ආධාර යටතේ බැටරි බලශක්ති ගබඩා පද්ධතිය ස්ථාපිත කිරීම		0.90	0.00	0%
5	රජයේ ගොඩනැගිලි, සඳහා පියැසි මත සූර්ය පැනල සවිකිරීම (ශ්‍රී ලංකා රජය/ඉන්දියාව)		290.00	222.54	77%
6	කුඩා දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම (ඉන්දීය ප්‍රදානය)		3,000.00	0.00	0%
7	ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන - USAID		297.00	0.00	0%
8	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි ධාරිතාවන් සහ හැකියාවන් පුළුල් කිරීම		163.00	48.50	30%
9	ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත ලැබෙන පරිත්‍යාග		32.00	5.00	16%

10	කෙරවලපිටිය-වරාය 2 වන සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ව්‍යාපෘතිය	7,000.00	0.00	0%
11	නව හබරණ-කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය	1.00	0.00	0%
12	සාම්පූර්-කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය	1.00	0.00	0%
13	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	200.00	103.49	52%
14	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	30.00	4.83	16%
15	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව	7.00	3.36	52%
16	ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය	50.00	0.00	0%
17	ජාතික විදුලිබල උපදේශක සභාව	51.00	0.00	0%
18	විදුලිබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම	50.00	0.00	0%
19	න්‍යෂ්ටික බලශක්ති අධ්‍යයන සහ සැලසුම් වැඩසටහන	2.50	1.33	53%
	මුළු එකතුව	**20,081.00**	**2,755.99**	**14%**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

දෙවන පරිච්ඡේදය
ලංකා විදුලිබල මණ්ඩලය

1. හැඳින්වීම

රජයට අයත් ව්‍යවසායක් වන ලංකා විදුලිබල මණ්ඩලය (CEB) ශ්‍රී ලංකාවේ විදුලිය ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම නියාමනය කිරීම සඳහා කිහිපවතාවක් සංශෝධනය කර ඇති 1969 අංක 17 දරන පනත යටතේ ස්ථාපිත කර ඇත. 2013 අංක 31 දරන පනත මගින් සංශෝධිත, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත හරහා ලං.වි.ම. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) යටතට ගෙන එන ලදී. 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් විදුලි කර්මාන්තයේ කාර්යක්ෂමතාව, වගවීම සහ ජාත්‍යන්තර යහ පරිචයන් සමග පෙළගැසීම් වැඩිදියුණු කිරීමේ අරමුණින් විදුලි අංශය ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා වූ වෙනම අනුප්‍රාප්තික ආයතන බවට වෙන්කිරීම සඳහා වූ නීතිමය රාමුව සම්පාදනය කර ඇත.

පසුගිය වසර 15 තුළ ශ්‍රී ලංකාවේ විදුලි ඉල්ලුම වාර්ෂිකව 4.1% සාමාන්‍ය අගයකින් වර්ධනය වී ඇති අතර උපරිම ඉල්ලුම වසරකට 2.6% කින් වර්ධනය වී ඇත. 2024 දී, ශුද්ධ ජනනය ගි.වො.පැ. 16,802 ක් වූ අතර, එය 2023 ට වඩා 7.9%ක වර්ධනයකි. දෛනික උපරිම ඉල්ලුම 2024 දී මෙ.වො. 2,673 අගයකට ළඟා වූ අතර, එය පෙර වර්ෂයට වඩා 10.7% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2025 පළමු මාස හය සඳහා, ශුද්ධ ජනනය ගි.වො.පැ. 8,675 ක් වූ අතර, එය 4.7% ක වර්ධනයක් නියෝජනය කෙරෙන අතර 2025 දෛනික උපරිම ඉල්ලුම මෙ.වො. 2,778 ක් වූ අතර, එම අගය පෙර වර්ෂයේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 10% ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2. සංවර්ධන ව්‍යාපෘති සහ ප්‍රධාන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

මෙම කොටස තුළ 2025-08-31 වන විට ලං.වි.ම. විසින් සිදු කරන ලද ප්‍රධාන ජනන, ගබඩාකරණ, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (ස.නො.පු.බ.), සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්වල තත්ත්වය දක්වනු ලබයි. එතුළ සපුරණු ලැබූ සන්ධිස්ථාන, ක්‍රියාත්මකව පවතින ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත නිම කිරීමේ කාලසටහන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයනු ලබයි.

වගුව 2.1
ප්‍රධාන ජනන සංවර්ධන ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතිය/ වැඩසටහන	2025-08-31 දිනට ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කෙරෙන දිනය
1	පළමු මෙ.වො. 350 ප්‍රතිවායුකරණිත ද්‍රවීකෘත ස්වභාවික වායු / ඩීසල් මගින් ක්‍රියාත්මකවන විදුලි බලාගාරය (සොබාදනව් විදුලි බලාගාරය)	විදුලි බලාගාරය සිය වාණිජ මෙහෙයුම් කටයුතු 2025-06-23 දින ආරම්භ කළේය	සම්පූර්ණයි
2	කෙරවලපිටිය මෙ.වො. 350 සහස්දනව් ස්වභාවික වායු සංයුක්ත චක්‍රීය බලාගාරය	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම 2025 අප්‍රේල් මස අත්සන් කරන ලදි. පරිසර බලපෑම් තක්සේරුව සහ සවිස්තරාත්මක සැලසුම් කටයුතු සිදු කෙරෙමින් පවතී.	වායු ටබර්යින - 2027 ඔක්. වාෂ්ප ටබර්යින - 2028 ඔක්.
3	කැළණිතිස්ස මෙ.වො. 130 වායු ටර්බයින	ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර මේවන විට අවසන් අදියරේ පවතී	2026 පෙබරවාරි
4	කැළණිතිස්ස මෙ.වො. 130 වායු ටර්බයින	ප්‍රසම්පාදන කටයුතු තාවකාලිකව නතර කරන ලදි	2030
5	මෙ.වො. 200 ස්වභාවික වායු අභ්‍යන්තර දහන එන්ජිම සහිත විදුලි බලාගාරය	යෝජනා ඉල්ලුම් සැකසුම් කටයුතු සිදු කෙරෙමින් පවතී	2028

වගුව 2.2
බලශක්ති ගබඩාකරණ සංවර්ධන ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතිය/ වැඩසටහන	2025-08-31 දිනට ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කෙරෙන දිනය
1	මෙ.වො. 100 / මෙ.වො.පැ. 100 ස්වායත්ථ බැටරි බලශක්ති ගබඩාකරණය	යෝජනා ඉල්ලුමට අදාළ කටයුතු අවසන් කෙරෙමින් පවතී	2027
2	මෙ.වො. 160 / මෙ.වො. පැ. 640 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධති ව්‍යාපෘතිය	ටෙන්ඩර් කැඳවීමේ නිවේදනය නිකුත් කෙරිණි	2026
3	දක්ෂිණ කලාපයේ මෙ.වො. 100 / මෙ.වො. පැ. 400 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය	ව්‍යාපෘති කටයුතු ආරම්භ කරනු පිණිස ලං.වි.ම. අභ්‍යන්තර අනුමැතීන් ලබාග න්නා ලදි.	2028
4	මහ ඔය පොම්ප ගබඩාකරණ විදුලි බලාගාරයේ මෙ.වො. 600 පොම්ප ගබඩාකරණ විදුලි බලාගාරය	සවිස්තරාත්මක සැලසුම්කරණය පිණිස අරමුදල් ලබාගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී	2034

වගුව 2.3
පද්ධති නවීකරණ සහ සහායක ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතිය/ වැඩසටහන	2025-08-31 දිනට ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කෙරෙන දිනය
1	ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්ති පාලන හා නිරීක්ෂණ කවුළුව	ලංසු ලේඛනය සැකසෙමින් පවතී	2027

වගුව 2.4
ස.නො.පු.බ. සංවර්ධන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම	ධාරිතාව මෙ.වො.	2025-08-31 දිනට ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කෙරෙන දිනය
සියඹලාණ්ඩුව සූර්ය විදුලි ව්‍යාපෘතිය	100	කොන්ත්‍රාත්තුව 2023 අගෝස්තු මස පිරිනමන ලදි 2024 පෙබරවාරි මස විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කරන ලදි සම්ප්‍රේෂණ ගිවිසුම 2024 අප්‍රේල් මස අත්සන් කරන ලදි ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම 2024 ජුලි මස අත්සන් කරන ලදි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු පිණිස ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ඉඩම් බදු ගිවිසුම අත්සන් කරන තෙක් රැඳී සිටී	2026
මන්නාරම මෙ.වො. 50 සුළං විදුලි ව්‍යාපෘතිය	50	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම 2025 මැයි මස අත්සන් කරන ලද අතර, ඉඩම් බදුදීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතව පවතී	2026
මුල්ලිකුලම් මෙ.වො. 2 x 50 සුළං විදුලි ව්‍යාපෘතිය	100	2025-07-09 දින යෝජනා ඉල්ලුම් කටයුතු අවසන් කිරීම සිදුවිය. තක්සේරු කටයුතු මේවන විට සිදු කෙරෙමින් පවතී	2027
මෙ.වො. 250 මන්නාරම අදියර II සුළං විදුලි ව්‍යාපෘතිය	250	Adani Green Energy ආයතනය 2025 පෙබරවාරි මස මන්නාරම සහ පූනරින් සුළං ව්‍යාපෘතිවලින් ඉවත්විය. ලං.වි.ම. විසින් ආරම්භක සංවර්ධන කටයුතු (හෙළි පෙහෙළි කිරීම් කටයුතු, ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ආදිය) සිදු කරමින් පවත්නා අතර, අරමුදල්කරණ වැඩ කටයුතු මේ දක්වා අවසන්ව නොමැතී	අර්ථ නිරූපණය කළ යුතුව පවතී
මෙවො. 1 x 90 සූර්ය විදුලි ව්‍යාපෘතිය	68	මෙ.වො. 1 x 50 ව්‍යාපෘති - මෙහෙවරෙහි යොදවන ලදී මෙ.වො.1 x 18 ව්‍යාපෘති - අවලංගු කරන ලදී	කටයුතු සම්පූර්ණයි
මෙ.වො. 10 පොළොන්නරුව සූර්ය බලාගාරය	10	මෙහෙවරෙහි යොදවන ලදී	කටයුතු සම්පූර්ණයි
මෙ.වො. 10 මහියංගනය සූර්ය විදුලි බලාගාරය	10	අවලංගු කරන ලදී	-

ව්‍යාපෘතියේ නම	ධාරිතාව මෙ.වො.	2025-08-31 දිනට ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කෙරෙන දිනය
මෙ.වො. (1-10) ධාරිතාවයන්ගෙන් යුත් මෙ.වො. 60 සුළං විදුලි ව්‍යාපෘතිය	35	මන්නාරම මෙ.වො.15 (මෙ.වො.10 සහ මෙ.වො. 5) බලාගාර - මෙහෙවරෙහි යොදවන ලදි ත්‍රිකුණාමලය මෙ.වො. 10 බලාගාරය - අවලංගු කරන ලදි (මාදම්පේ) මෙ.වො.10 (මෙ.වො.5 x 2) - විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදි [මේවන විට පාලනයෙන් බැහැර හේතු මත අක්‍රියව පවතී (පාලනයෙන් බැහැර හේතු මත අක්‍රියව පවතින තත්ත්වය ව්‍යාපෘති සමාගම විසින් දැනුම් දෙන ලද අතර 2025 අගෝස්තු මස 18වන දින සිට ක්‍රියාත්මකවන පරිදි ලං.වි.ම. විසින් එය පිළිගන්නා ලදි)]	2026
මෙ.වො.30 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 1-5)	5	(බෙලිඅත්ත) මෙ.වො.2 බලාගාරය මෙහෙවරෙහි යොදවන ලදි නාවලපිටිය මෙ.වො. 3 ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු ආශ්‍රිතව පැහැර හැරුම් නිවේදනය සහ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අවසන් කිරීමේ නිවේදනය නිකුත් කොට ඇත	2025
මෙ.වො. 30 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 1-5) (ප්‍රති-ටෙන්ඩර්කරණය)	27	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදි (වව්නතිව් - මෙ.වො. 8, මාතර - මෙ.වො.10 සහ පල්ලෙකැලේ - මෙ.වො.5) විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට නියමිතය (පල්ලෙකැලේ මෙ.වො.4 - මෙ.වො. 1 x 4 බලාගාර)	2026
මෙ.වො. 20 වෙරළත සුළං විදුලි බලාගාර (මෙ.වො. 2.5-10)	20	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදි (මෙ.වො. 5 x 4) ව්‍යාපෘති මේවන විට පාලනයෙන් බැහැර හේතු මත අක්‍රියව පවතී (පාලනයෙන් බැහැර හේතු මත අක්‍රියව පවතින තත්ත්වය ව්‍යාපෘති සමාගම විසින් දැනුම් දෙන ලද අතර 2025 අගෝස්තු මස 14වන දින සිට ක්‍රියාත්මකවන පරිදි ලංවිම විසින් එය පිළිග න්නා ලදි)	2026
මෙ.වො. 40 බිම නංවන ලද/ පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර	40	(ගාල්ල) මෙ.වො. 5 ව්‍යාපෘතිය මෙහෙවරෙහි යොදවන ලද අතර ගාල්ලේ ඉතිරි මෙ.වො. 15 (මෙ.වො.5 x 3) ව්‍යාපෘති ඉදි වෙමින් පවතී කප්පල්තුරේ මෙ.වො. 20 (මෙ.වො.5 x 4) ව්‍යාපෘති මේවන විට පාලනයෙන් බැහැර හේතු මත අක්‍රියව පවතී (පාලනයෙන් බැහැර හේතු මත අක්‍රියව පවතින තත්ත්වය ව්‍යාපෘති සමාගම විසින් දැනුම් දෙන ලද අතර 2025.05.09 දින සිට ක්‍රියාත්මකවන පරිදි ලං.වි.ම. විසින් එය පිළිගන්නා ලදි.)	2025
මෙ.වො.70 බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො. 1-5)	51	මෙ.වො.24 ව්‍යාපෘති (06 ක්) මෙහෙවරෙහි යොදවා ඇත මෙ.වො. 27 ව්‍යාපෘති (06 ක්) ඉදි වෙමින් පවතී	2025
මෙ.වො.70 බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො. 1-5) (ප්‍රති-ටෙන්ඩර්කරණය)	19	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කොට ඇත (කොස්ගම - මෙ.වො. 5, පන්නල - මෙ.වො. 6, කුරුණෑගල - මෙ.වො. 1, අම්පාර - මේවෝ 2) විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට නියමිත (හබරණ - මෙ.වො. 2 සහ වේයන්ගොඩ - මෙ.වො. 3 බලාගාර)	2026
මෙ.වො. 165 බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො. 1-5)	156	2025-01-31 දින මෙ.වො. 156 ක් පිරිනමන ලදි අභිප්‍රාය ලිපි අත්සන් කරන ලදී - මෙ.වො. 72 2025 සැප්තැම්බර් අවසන් වනවිට මෙ.වො. 84 කට අදාළ ඉතිරි අභිප්‍රාය ලිපි අත්සන් කිරීමට අපේක්ෂිතය	2026
මෙ.වො. 10/ මෙ.වො.පැ. 40 ප්‍ර.ධා. ධාරිතා ව්‍යාපෘති ආශ්‍රිත මෙ.වො.160/ මෙ.වො.පැ. 640 ස්වායත්ත බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය (BESS)	160	2025-07-30 දින ටෙන්ඩරය පළ කරන ලද අතර, 2025-10-14 දින විවෘත්ත කරනු ඇති	2026
මෙ.වො. 152 බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො. 1-5)	152	ව්‍යාපෘති කමිටුව (PC) විසින් කෙටුම්පත් යෝජනා ඉල්ලුම සමාලෝචනය කරමින් පවතී	2028

ව්‍යාපෘතියේ නම	ධාරිතාව මෙ.වො.	2025-08-31 දිනට ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කෙරෙන දිනය
මෙ.වො. 234 පුනරින් සුළං විදුලි ව්‍යාපෘතිය	234	අදානි ග්‍රීන් එනර්ජි සමාගම 2025 පෙබරවාරි මස මන්නාරම සහ පූනරින් සුළං ව්‍යාපෘතිවලින් ඉවත්විය. ව්‍යාපෘතියට අදාළ අරමුදල්කරණ වැඩ පිළිවෙලයන් තවදුරටත් අවසන් කෙරෙමින් පවත්නා අතර, ලං.වි.ම. විසින් බිම් හෙළි කිරීම් සහ ඉඩම් අත්පත් කරගැනීම් ඇතුළත් ආරම්භක සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.	අර්ථ නිරූපණය කළ යුතුව පවතී
මෙ.වො. 100 ඔඩ්ඩමාවඩි මඩකලපුව සූර්ය පැනල විදුලි ව්‍යාපෘතිය	100	අභිප්‍රාය ප්‍රකාශ (EOI) ව්‍යාපෘති සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් බලශක්ති අමාත්‍යාංශය විසින් කටයුතු කරමින් පවතී.	අර්ථ නිරූපණය කළ යුතුව පවතී
මෙ.වො. 50 සාම්පූර් සූර්ය පැනල විදුලි ව්‍යාපෘතිය	50	2024 අප්‍රේල් මස විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කරන ලදි කප්පල්තුරේ - සාම්පූර් සම්ප්‍රේෂණ මාර්ගය ආරම්භ කරන තෙක් ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකර පවතී.	2027
මෙ.වො.60 සූර්ය පැනල විදුලි ව්‍යාපෘතිය, හම්බන්තොට	60	අභිප්‍රාය ප්‍රකාශ (EOI) ව්‍යාපෘති සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් බලශක්ති අමාත්‍යාංශය විසින් කටයුතු කරමින් පවතී.	අර්ථ නිරූපණය කළ යුතුව පවතී
මෙ.වො. 54 සුළං විදුලි ව්‍යාපෘතිය, හම්බන්තොට	54	අභිප්‍රාය ප්‍රකාශ (EOI) ව්‍යාපෘති සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් බලශක්ති අමාත්‍යාංශය විසින් කටයුතු කරමින් පවතී.	අර්ථ නිරූපණය කළ යුතුව පවතී
පෝෂක ගාස්තු (FIT) ක්‍රමය යටතේ ව්‍යාපෘතිය	2,769.2	මෙ.වො. 63.7 - මෙහෙවරෙහි යොදවන ලදි මෙ.වො. 480.78 - සූර්ය විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම (SPPA) අත්සන් කරන ලදි මෙ.වො. 452.05 -අභිප්‍රාය ලිපිය නිකුත් කරන ලදි මෙ.වො. 1955.83 -එකඟතාවය නිකුත් කරන ලදි	2025/2026
මෙ.වො.100/ මෙ.වො.පැ. 400 ස්වායත්ත බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය (BESS), ඇඹිලිපිටිය	100 / මෙ.වො.පැ. 400	යෝජනා ඉල්ලුම් ලේඛනය සකස් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් තාක්ෂණික සහාය ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඔවුන් විසින් කටයුතු කරමින් පවතී.	2028
මෙ.වො. 135 සාම්පූර් සූර්ය බල ව්‍යාපෘතිය	135	2025 අප්‍රේල් මස විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කරන ලදි. සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ ටෙන්ඩර් කටයුතු සිදු වෙමින් පවතී.	2027 දෙසැ.

ජාලය ශක්තිමත් කිරීම, පද්ධති විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සහ අනාගත ඉල්ලුම් වර්ධනයට ඉඩ සැලසීම අරමුණු කරගත්, දැනට ක්‍රියාත්මකව පවතින සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල තත්ත්වය වගුව 2.5 හි ඉදිරිපත් කර ඇත. බෙදා හැරීම් අංශය ගත්කල, සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, ජාල ආවරණය පුළුල් කිරීම සහ පද්ධතිය නවීකරණය කිරීමේ උත්සාහයන් පිළිබිඹු කරමින්, වගුව 2.6 හි විස්තර කර ඇති පරිදි, ප්‍රධාන මුලපිරීම් සහ සැලසුම් කළ වැඩසටහන් යන දෙ අංශයෙහිම අඛණ්ඩ ප්‍රගතිය ඇතුළත් කර ඇත.

වගුව 2.5

ක්‍රියාත්මකව පවත්නා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘතිය/ ශාඛාව	පැකේජය	පිරිවැය	2025-08-31 දිනට භෞතික ප්‍රගතිය"	කටයුතු සම්පූර්ණ වන දිනය
ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය	පැකේජය 1: කි.වෝ. 400, කි.වෝ. 220 සහ කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම	රු.මිලි 1,589	76.10%	2026 අගෝ.
	පැකේජය 2 :කොටුමා උපපොළ ඉදිකිරීම සහ විශාලනය		78.00%	2026 ඔක්.
	පැකේජය 3: සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම (කි.වෝ.220, කි.වෝ. 132)		70% (කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදි-59.8%)	2027 අගෝ. (නව ලංසුකරණ ක්‍රියාවලියේ II අදියර)
	පැකේජය 4: බෙදාහැරීමේ උපපොළ සහ කේබල ඉදිකිරීම (කි.වෝ. 33, කි.වෝ.11, කි.වෝ. 0.4)		41% (කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදි)	2028 ජුනි (නව ලංසුකරණ ක්‍රියාවලියේ II අදියර)
සුපරීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් සහායක උසස් බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථානයක් බස්නාහිර පළාත දකුණ 1 සඳහා ස්ථාපනය	සුපරීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් සහායක උසස් බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථානයක් මූලස්ථානයේ බෙදාහැරීමේ මධ්‍යස්ථානය 4හි ස්ථාපනය සහ ව්‍යාපෘතියේ විෂය පථය ප්‍රකාර පාලක මධ්‍යස්ථානයෙහි බස්නාහිර පළාත දකුණ 1හි ප්‍රාථමික උපපොළ සහ ක්ෂේත්‍ර උපකරණ (AR/LBS) ඒකාබද්ධකරණය	රු.මිලි 2,003	100.00%	2025 අගෝ.
විදුලිය සැපයුමේ විශ්වසනීයත්වය ප්‍රවර්ධනය කිරීමට සහාය වීමේ ව්‍යාපෘතිය	කි.වෝ. 33 කුලුණු මාර්ග 16ක් සහ (කි.මී.285) ද්වි-අංශ ඒකල බස්බාර් මැසි 13ක් ඉදිකිරීම	එ.ජ.ඩො. මි 23.65 හා ශ්‍රී.ලං.රු. 4,867.5	86%	2025 දෙසැ.
කෙරවලපිටිය - වරාය කි.වෝ. 220 2වන භූගත කේබල ව්‍යාපෘතිය	කෙරවළපිටියේ සිට වරාය කොටුමා උපපොළ දක්වා කි.මී. 15.7ක භූගත කේබලයක් ඉදිකිරීම	එ.ජ.ඩො. මි 52	ණය ගිවිසුම අත්සන් කොට පිරිනැමීමට නියමිතය	
කොළොන්නාව මෙ.වො. 100/ මෙ.වො.පැ. 100 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය	කොළොන්නාවේ මෙ.වො. 100/මෙ.වො.පැ. 100 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතියක් ඉදිකිරීම	එ.ජ.ඩො. මි 26.3	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී	
කොළොන්නාව මෙ.වො. 100/ මෙ.වො.පැ. 100 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය සංවර්ධනය සඳහා කොළොන්නාව කොටුමා උපපොළ විශාලනය	කොළොන්නාව මෙ.වො.100/ මෙ.වො.පැ. 100 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය සංවර්ධනය සඳහා කොළොන්නාව කොටුමා උපපොළ විශාලනය	එ.ජ.ඩො. මි 5.7	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී	
හම්බන්තොට මෙ.වො. 5/ මෙ.වො.පැ. 10.7 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය	හම්බන්තොට මෙ.වො. 5/ මෙ.වො.පැ.10.7 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතියක් ඉදිකිරීම	රු.මිලි. 3570	80%	2025 දෙසැ.
සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	මැදගම - අම්පාර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	රු.මිලි 3,206	71%	2026 මැයි
	වික්ටෝරියා - රන්ටැඹේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	රු.මිලි 2,200	-	2027 අප්‍රේල්

සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	අතුරුගිරිය - කොලොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය විශාලනය	රු.මිලි. 143	අදියර 1 කටයුතු සම්පූර්ණයි	2025 දෙසැ.
	පූනරින් - කිලිනොච්චි කි.වෝ. 220 ඍජු ධාරා සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම		බිම හෙළි පෙහෙළි කිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට පමණක් උපදෙස් ලබාදෙන ලදි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති) වෙත භාරකරන ලදි.	අදාළ නැත
	කොලොන්නාව - පන්නිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	රු.මිලි. 1,120	5% (සැලසුම් කටයුතු සහ පස් පරීක්ෂාව)	2026 දෙසැ.
	කැළණිතිස්ස - කොලොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ උස වැඩි කිරීම	රු.මිලි. 702	(මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සතර මංතීරු වරාය ප්‍රවේශ උස් මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීමේ කටයුතු අත්හිටුවීම හේතුකොට අත් හිටුවන ලදි)	අදාළ නැත
	කොත්මලේ - නව පොල්පිටිය කි.වෝ. 220/132 පෝෂක/ නම්‍ය සම්බන්ධක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම	රු.මිලි. 1,947	කි.වෝ. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ග යට බලශක්ති සම්පාදනය සිදුකරන ලදි	2025 මැයි
	දඹුල්ල - නව හබරණ කි.වෝ. 220/132 පෝෂක/ නම්‍ය සම්බන්ධක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම	රු.මිලි. 1,790	46%	2026 මැයි
	මන්නාරම - නඩුකුඩා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය පිළිසකර කිරීම	රු.මිලි. 550	7%	2026 දෙසැ.
	නව අනුරාධපුර කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 2x50 ප්‍රතිචාරකය සහ මන්නාරම කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 1x50 ප්‍රතිචාරකය ස්ථාපනය	රු.මිලි. 1,463	100%	2022 මාර්තු
	වගවත්ත කොටුමා උපපොළ ඉදිකිරීම (ද්විත්ව බස්බාර් සහිත මෙ.වෝ.ඇ. 2x45 තරාපැවිය)	රු.මිලි. 2,278	100%	2024 දෙසැ.
	කැළණිතිස්ස කි.වෝ. 132 වායු පරිවරණිත උපපොළ පුළුල් කිරීම	රු.මිලි. 1,400	අදියර 1 - 100% සම්පූර්ණය	2025 සැප්.
	නව පොල්පිටිය ස්විච්චිකරණ ස්ථානයේ කි.වෝ. 220 ද්විත්ව බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග බොකු 02ක් ඉදිකිරීම	රු.මිලි. 170	100%	2023 මාර්තු
	කොටුගොඩ විශාලන කටයුතු	රු.මිලි. 960	අදියර 1 - - 100%	2024 දෙසැ.
	බලන්ගොඩ කොටුමා උපපොළේ කි.වෝ. 33 පෝෂක බොකු 02ක් ඉදිකිරීම	රු.මිලි. 702	85%	2026 මාර්තු
	අතුරුගිරිය විශාලන කටයුතු	රු.මිලි. 1,463	100%	2024 මාර්තු
	රත්මලාන කොටුමා උපපොළේ කි.වෝ. 33 පෝෂක බොකු දෙකක් ඉදිකිරීම	රු.මිලි. 1,898	100%	2023 සැප්.
	රන්ටැඹේ ස්විච්චිකරණාංගනයේ කි.වෝ. 220 ගෑස් පරිවරණිත පද්ධතියක් ඉදිකිරීම	රු.මිලි. 464		2025 දෙසැ.
	වික්ටෝරියා විදුලි බලාගාර ස්විච්චිකරණාංගනයේ කි.වෝ. 220 පෝෂක බොකුවක් ඉදිකිරීම	රු.මිලි 291	10%	2025 දෙසැ.
	රන්දෙණිගල (උමා ඔය ජලවිදුලි ව්‍යාපෘතිය) කි.වෝ. 132 ස්විච්චිකරණාංගනයක් ඉදිකිරීම	රු.මිලි 73	100%	2024 ජූලි

සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	අම්පාර කොටුමා පොළ කි.වෝ. 132 පෝෂක බොකුවක් ඉදිකිරීම	රු.මිලි 67	85%	2025 දෙසැ.
	කි.වෝ. 33 ආරක්ෂණ රිලේ මාරුකරණය	රු.මිලි 15	45%	2026 මාර්තු
	කිරිඳිවැල කොටුමා උපපොළ විශාලනය	රු.මිලි 148	92%	2025 නොවැ.
	නව අනුරාධපුර කොටුමා උපපොළ කි.වෝ. 220 පෝෂක බොකු 02ක් ඉදිකිරීම	රු.මිලි 2,809	65%	2026 මැයි
	චුන්නාකම් කොටුමා උපපොළ විශාලනය	රු.මිලි 229	38%	2026 මැයි
	ආනියාකන්ද කොටුමා උපපොළ විශාලනය	රු.මිලි 350	48%	2026 මාර්තු
	කුකුලේගඟ ස්විච්චිකරණාංගනය විශාලනය	රු.මිලි 85	72%	2026 අප්‍රේල්
	මතුගම කොටුමා උපපොළ විශාලනය	රු.මිලි 212	40%	2026 මැයි
	නාඩුකුඩා කොටුමා උපපොළ විශාලනය	රු.මිලි 595	5%	2026 මැයි
	ඇඹිලිපිටිය කොටුමා උපපොළ විශාලනය	රු.මිලි 353	63%	2025 දෙසැ.
මන්නාරම - වව්නියාව කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග සන්නායක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	අධි උෂ්ණ ගණ (HTLS) සන්නායකයක් (කි.මී. 72) යොදා දැනට පවත්නා ෂීබ්‍රා සන්නායකය මාරු කිරීම	රු.මිලි 569	21.50%	2026 සැප්.
මුල්ලිකුලම සුළං බලශක්ති සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	⋆ද්විත්ව පරිපථ මන්නාරම - මුල්ලිකුලම කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම (කි.මී. 28)	රු.මිලි 5,951	2026 ජනවාරියේදී ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතය	2027 අගෝ.
	⋆මන්නාරම කොටුමා උපපොළ කි.වෝ. 220 මාර්ග බොකු 02ක් ඉදිකිරීම /මුල්ලිකුලම ඒකරාශිකරණ කොටුමා උපපොළ ඇතුළුවීම් පාර්ශ්වය ඉදිකිරීම			
සම්ප්‍රේෂණ ව්‍යාපෘති	**භාණ්ඩ ප්‍රසම්පාදනය**			
	සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතාවන් සඳහා අමතර කොටස් සහ මෙවලම් වශයෙන් ද්‍රව්‍ය / උපකරණ ප්‍රසම්පාදනය - සාම්පූර් කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පැකේජ 4,5,6,10 හා 11	රු.මිලි 4,381	98.00%	2025 මාර්තු
	පූනරින් - කිලිනොච්චි කි.වෝ. 220 ඍජු ධාරා සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් මූලික කටයුතු - විදුලි පද්ධතිය සවිබල ගැන්වීමේ හා ලුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධකරණ ව්‍යාපෘතිය - අදියර 02 - මෙහෙයුම් ඒකකය 02	රු.මිලි 3,400	12.00%	2025 දෙසැ.
විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය (PSRSP) ඃ අදියර II පැකේජය 2 - මෙහෙයුම් ඒකක 01	හොරණ - පාදුක්ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු	රු.මිලි 568	2%	2026 දෙසැ.
විදුලි පද්ධතිය සවිබල ගැන්වීමේ හා පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කරණ ව්‍යාපෘතිය - PSSREIP	පැකේජ 6කින් සමන්විත වේ	රු.මිලි. 76,281	ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මේ දක්වා පිරිනමා නොමැත	2029 ණය ගිවිසුම ප්‍රකාර
විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය -PSRSP පැකේජය 4A-නව හබරණ- නව අනුරාධපුර කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	නව හබරණ - නව අනුරාධපුර කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගයේ සිවිල් කටයුතු, කුලුණු ඉදිකිරීම් කටයුතු සහ කම්බි ඇදීම් කටයුතු සහ පැරණි හබරණ - නව අනුරාධපුර දැනටපවත්නා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ගලවා දැමීම	රු.මිලි 1,911	23%	2026 සැප්.

3. ආයතනයේ මූල්‍ය තත්ත්වය

2025-06-30 වන දින අවසන් වූ මාස හය සඳහා ලං.වි.ම. විසින් රුපියල් බිලියන 13.16 ක ශුද්ධ අලාභයක් වාර්තා කරන ලදී. මෙම අලාභය මූලික වශයෙන් 2024 ජූලි මස සහ 2025 ජනවාරි මාසයේ ක්‍රියාත්මක කරන ලද ගාස්තු අඩු කිරීම් හේතුකොට ඇතිවිය. සංශෝධිත ගාස්තු 2025 පළමු භාගයේ දී සිදු වූ පිරිවැය සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට ප්‍රමාණවත් නොවූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආදායමේ පහත වැටීමක් සිදු විය.

තත්ත්වය මෙසේ පැවතියදී ද, 2024 හි අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සමස්ත ජනන පිරිවැය පහත වැටිණි. මෙය ප්‍රධාන වශයෙන් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ප්‍රභවයන්ගෙන් වැඩි නිමැවුමක් ලැබීම සහ ගල් අඟුරු සහ ඉන්ධන මිල ගණන් අඩුවීම හේතුකොට සිදුවිය. ජනන පරිමාවන් වර්ධනය වුවද මෙම සාධක විසින් මූල්‍ය බලපෑමෙන් කොටසක් සමතුලිත කරන ලදි. මේ අතර, ජාතික ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම ඉහළ විදුලි ඉල්ලුමට සහායක සාධකයක් වූ අතර, එය ආදායම් වර්ධනයට ධනාත්මකව දායක විය.

ඓතිහාසිකව, පිරිවැය පිළිබිඹු කරන ගාස්තුවක් නොමැතිකම සහ කොවිඩ් වසංගතය නිසා ගාස්තු එකතු කිරීමට ඇති වූ බාධා ලං.වි.ම. හි මුදල් ප්‍රවාහයනට දැඩි පීඩනයක් ඇති කළ අතර, ඒ හේතුකොට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) වැනි ප්‍රධාන සැපයුම්කරුවන්ට ගෙවීම් ප්‍රමාද විය. මෙම ප්‍රමාදයන් හේතුකොට පොලී සහ දඩ ගාස්තු ආකාරයෙන් සැලකිය යුතු අතිරේක පිරිවැයක් ඇති විය. කෙසේ වෙතත්, පිරිවැය පිළිබිඹු කරන ගාස්තු ක්‍රියාත්මක කිරීමත් සමග, මුදල් ප්‍රවාහ කළමනාකරණය වැඩිදියුණු වූ අතර, ලං.වි.ම.ට එහි පෙර සිට පැවත ආ ණය කොටසක් නිරවුල් කිරීමට හැකි විය. මෙමගින් ප්‍රමාද ගාස්තුවලින් පැන නගින වියදම් සැලකිය යුතු ලෙස අඩු වී ඇත. තවද, පවතින පොලී අනුපාත පහළ යාම ණය සහ ණයට ගැනීම් මත මූල්‍ය පිරිවැය අඩු කර ඇති අතර, එමගින් ආයතනයේ මූල්‍ය තත්ත්වයට තවදුරටත් සහනයක් සැලසිණි.

4. 2026 වර්ෂය සඳහා ඉදිරි සැලසුම්

2 කොටසෙහි ඉදිරිපත් කර ඇති පරිදි ජනන, ගබඩාකරණ, ස.නො.පු.බ. සහ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2026 වර්ෂය පුරාවට හෝ අදාළ ව්‍යාපෘති සම්පූර්ණයෙන් නිම වන තෙක් අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ. මෙම ක්‍රියාකාරකම් පද්ධති විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම, ධාරිතාව පුළුල් කිරීම සහ වඩාත් විවිධාංගීකරණය වූ සහ තිරසර විදුලිබල අංශයක් කරා සංක්‍රමණයට සහාය වීමෙහි ලා ප්‍රධාන සාධක වේ.

මීට අමතරව, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් සහ නව මුලපිරීම් යන දෙකරුණම ආවරණය කරන්නාවූ බෙදා හැරීමේ ජාල සංවර්ධනය සඳහා සැලසුම් කළ සහ ක්‍රියාත්මක වැඩසටහන් වගුව 2.6 හි නිරූපණය කර ඇත. මෙම වැඩසටහන් මගින් සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීම සහ රට පුරා වර්ධනය වෙමින් පවත්නා පාරිභෝගික ඉල්ලුම සපුරාලීම අරමුණු කර ඇත.

අනාගත ආයෝජන සහ ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බලමින් පවතින, මෙහෙවරෙහි නොයොදවන ලද ජනන, ගබඩාකරණ, ස.නො.පු.බ. සහ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති වගුව 2.7 හි වෙන් වෙන් වශයෙන් ලැයිස්තුගත කර ඇත. අරමුදල් ලබාගැනීමේ හැකියාවට යටත්ව මේවා ක්‍රියාත්මක කරනු ලැබේ

වගුව 2.6
බෙදාහැරීම් සංවර්ධන කටයුතු ආශ්‍රිත වැඩසටහන් සහ ප්‍රගතිය

යොමුව	කාර්යය	ඒකකය	බෙ.අ.1			බෙ.අ.2			බෙ.අ.3			බෙ.අ.4		
			2025 ඉලක්කය	2025 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු)	2026 ප්‍රක්ෂේපණය	2025 ඉලක්කය	2025 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු)	2026 ප්‍රක්ෂේපණය	2025 ඉලක්කය	2025 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු)	2026 ප්‍රක්ෂේපණය	2025 ඉලක්කය	2025 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු)	2026 ප්‍රක්ෂේපණය
1	මැ.වෝ. කුලුණ	කි.මී.	12.0	0 *	25.1	66.4	18.9	52.2	25.5	10.0	13.0	40.3	7.0	40.0
2	මැ.වෝ. කණුව (ලින්ක්ස්, රැකුන්, එල්ම් සහ හුගත)	කි.මී.	141.6	63.5	147.2	154.4	150.3	179.3	67.5	35.1	67.4	46.9	38.0	53.9
3	මැ.වෝ. කණුව - ආකාශ ගොනු කේබල (ABC)	කි.මී.	10.0	17.2	10.0	6.0	2.3	9.0	7.5	0.0	-	6.4	3.7	11.9
4	අ.වෝ. කණුව - ආකාශ ගොනු කේබල (ABC)	කි.මී.	94.0	37.5	96.5	350.0	204.8	381.0	166.6	110.2	154.0	28.0	19.1	38.0
5	සැපිරීමට නියමිත මැ.වෝ. ප්‍රති-සන්නායකකරණය සහ මාරු කිරීමේ කටයුතු (කුලුණ)	සංඛ්‍යාව	11.6	2 *	-	2.5	0.0	16.5	-	-	-	0.0	0.0	2.0
6	සැපිරීමට නියමිත මැ.වෝ. ප්‍රති-සන්නායකකරණය සහ මාරු කිරීමේ කටයුතු (කණුව)	සංඛ්‍යාව	174.2	54.2	125.9	110.1	52.3	155.5	11.7	0.0	11.0	36.4	17.0	52.8
7	සැපිරීමට නියමිත අ.වෝ. මාරු කිරීම් කටයුතු (පියසර කේබලවලින් ABC කේබල කරා)	සංඛ්‍යාව	275.0	36.7	200.0	555.0	335.2	932.0	134.0	168.2	541 **	167.0	84.6	180.0

8	ඉදිකිරීමට නියමිත බෙදාහැරීමේ උපපොළ (බෙදාහැරීමේ/ රිං/ රේඩියල්/ ප්‍රති-බෙදාහැරුම්)	සංඛ්‍යාව	333	107	287	362	231	346	84	91	130	92	50	117
9	ඉදිකිරීමට නියමිත ප්‍රාථමික උපපොළ	සංඛ්‍යාව	1	-	5	3	0	3	-	-	-	3	0	5
10	විශාලනයට නියමිත ප්‍රාථමික උපපොළ	සංඛ්‍යාව	2	-	-	1	1	1	-	-	-	0	0	0
11	ඉදි කිරීමට නියමිත ගැන්ට්‍රි මැසි	සංඛ්‍යාව	5	2	8	18	3	17	6	1	3	5	0	5
12	විශාලනයට/ වෙනස් කිරීමට නියමිත ගැන්ට්‍රි මැසි	සංඛ්‍යාව	1	-	-	6	1	12	-	-	-	1	0	1
13	(නව ගැන්ට්‍රි මැසි හැර) ස්ථාපනයට නියමිත ස්වයං ප්‍රතිවැසුම්	සංඛ්‍යාව	14	3	12	40	20	55	20	9	15	11	5	20
14	වෙනත් (නිශ්චිතව දක්වන්න)	සංඛ්‍යාව												
	(නව ගැන්ට්‍රි මැසි සඳහා හැර) ස්ථාපනයට නියමිත පැටවුම් කැඩුම් ස්විච (LBS)						21	83	-	-	-			
	පැටවුම් කැඩුම් ස්විච (LBS) ස්ථාපනය											39	23	46
	බෙදා හැරීමේ උපපොළ විශාලනය											24	9	26

සටහන : ⋆
මෙම සංඛ්‍යාව තුළ මුළුමනින් කටයුතු සම්පූර්ණ කරන ලද මැ.වෝ. කුලුණු මාර්ග දිග ඇතුළත් වේ.
පිරිවැය ගෙවන ලද කටයුතු සහ විදුලිය සැපයුම්හි විශ්වසනීයත්වය ප්‍රවර්ධනයට සහාය වීමේ ව්‍යාපෘතිය (SESRIP) යටතේ එන කටයුතු පිළිබඳ විස්තර ඇතුළත් නොකෙරිණි.
** 2024 සහ 2025 වසරවලටද අදාළව සිදු කිරීමට නියමිත කටයුතු මෙන්ම අනුමත ගුවන් බන්ධිත සන්නායක පරිවර්තන කටයුතුද මෙයට ඇතුළත් වේ.

වගුව 2.7

ණය හිමියන් විසින් අරමුදල් සම්පාදනය කිරීම මත ක්‍රියාත්මක වීමට නියමිත ජනන, ගබඩාකරණ, ස.නො.පු.බ., සහ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති

අයිතමය	ව්‍යාපෘතිය / වැඩසටහන	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත වර්ෂය [2]	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (ශ්‍රී. ලං. රු. මිලියන)	තත්වය
1	නව හබරණ මෙ.වෝ.ඇ. 75 සමමුහුර්ත ධාරිත්‍රකය	2028	9,559[1]	ලෝක බැංකු සහාය සහිතව අරමුදල් යෙදවේ
2	වව්නියාව කි.වෝ. 220 සංවර්ධනය	2028	9,351[1]	අරමුදල්කරණය සම්බන්ධයෙන් ලෝක බැංකුව සමග සාකච්ඡා සිදුවේ
3	කි.වෝ. 400 උතුරු සංවර්ධනය (කි.වෝ. 220 මෙහෙයුම් අදියර)	2030	62,400[1]	අරමුදල්කරණය සම්බන්ධයෙන් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සමග සාකච්ඡා සිදුවේ
4	පාදුක්ක කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 100 ස්ථිතික සමමුහුර්ත හානිපූරක ඒකකය ස්ථාපනය	2028	6,760[1]	අරමුදල්කරණය සම්බන්ධයෙන් ලෝක බැංකුව සමග සාකච්ඡා සිදුවේ
5	නොරොච්චෝලේ - වාරියපොල කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	2030	24,060[1]	අරමුදල්කරණය සම්බන්ධයෙන් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සමග සාකච්ඡා සිදුවේ
6	ශීඝ්‍රා සහිතව නව ලක්ෂපාන - බලන්ගොඩ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	2028	5,309[1]	අරමුදල් පෙළගැස්ම සිදු වෙමින් පවතී.
7	මහ ඔය පොම්පගත ගබඩාකරණ විදුලි බලාගාරය - යෝජිත සවිස්තරාත්මක සැලැස්ම	2034	750	අරමුදල් පෙළගැස්ම සිදු වෙමින් පවතී.

1 මිල ඉහළ යාම, හදිසි අවස්ථා, පරිපාලන වියදම් සහ බදු ඇතුළුව

2 නවතම අනුමත දිගුකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්ම 2025 - 2044 සහ දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම 2025 - 2034 අනුව

තෙවන පරිච්ඡේදය

සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම

1. හැඳින්වීම

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම යනු 1982 අංක 17 දරන සමාගම් පනත සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 1983 දී සංස්ථාගත කරන ලද සීමිත වගකීම් සහිත සමාගමකි. එහි මූලික අරමුණ වන්නේ කොළඹ නගරය සහ දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශ හැර මීගමුව සිට ගාල්ල දක්වා ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරය දිගේ ප්‍රධාන ආර්ථික කලාපය ආවරණය වන පරිදි එහි බලයලත් ප්‍රදේශය තුළ විදුලිය බෙදා හැරීමයි. පසුව 2009 අංක 20 දරන විදුලිබල පනත මගින්, සමාගමට බෙදාහැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීමත් සමඟ සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමන විෂය ක්ෂේත්‍රයට ගෙන එන ලදී. සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් පාරිභෝගිකයින් 615,000 කට පමණ සේවය සපයන අතර එය රටේ බලශක්ති බෙදාහැරීමෙන් 10% ක් පමණ ප්‍රමාණයක් වේ.

2. සමාගමේ අරමුණු

i. අපගේ අභිමතාර්ථ

- සමාගමේ මෙහෙයුම් පිළිබඳව පාර්ශ්වකරුවන්ගේ දැනුවත්භාවය නිසි අයුරින් සහ විනිවිදභාවයෙන් යුතුව සහතික කිරීම සහ උපායමාර්ගික විවිධාංගීකරණයකට යොමු වීම
- නියාමන මිණුම් සලකුණුකරණය සහ අභ්‍යන්තර සේවා ප්‍රමිතීන්ට අනුකූලව බෙදාහැරීමේ සේවා වැඩිදියුණු කිරීම
- පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදනය තුළින් සමාගමේ තාක්ෂණික හැකියාව වැඩි දියුණු කිරීම
- නාස්තිය අඩු කරමින් ව්‍යාපාර ලාභදායීතාවය, කාර්යක්ෂමතාව, අභ්‍යන්තර ක්‍රියාවලි පාලනය සහ උපායමාර්ගික ආයෝජන වැඩි දියුණු කිරීම
- ජාතික හා ජාත්‍යන්තර සම්මතයන් මගින් සලකුණුකරණය කරන ලද සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් තුළින් ඵලදායී, කුසලතා ඇති, අභිප්‍රේරිත සහ අන්‍යෝන්‍ය වශයෙන් ගරු කරන ශ්‍රම බලකායක් සහතික කිරීම

3. සංවර්ධන ව්‍යාපෘති සහ ප්‍රධාන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

සමාගම විසින් අත්පත් කරගත් ජයග්‍රහණයන් අපගේ කාර්යසාධනය සහ පාර්ශවකරුවන්ට උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීම සඳහා දක්වන කැපවීම විදහා දක්වයි.

- සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙහි සුහුරු ජාල ක්‍රියාකාරී සැලැස්මට අනුව, වර්ෂ 2025 වන විට
  - දුරස්ථව ක්‍රියාත්මක කළහැකි සහ අධීක්ෂණය කළහැකි වහරු 75 ක් ස්ථාපනය කිරීමෙන් විදුලිය බෙදාහැරීම් ජාලයෙහි සැපයුම්කරණ විශ්වසනීයත්වය තවදුරටත් වැඩිදියුණු කිරීම.
  - 2025 වසර තුළ පද්ධතියට සුහුරු මනු 30,000ක් එකතු කර ඇති අතර වර්තමානයේ LECO සුහුරු මනු භාවිතා කරන පාරිභෝගිකයින් සංඛ්‍යාව 148,000ක් වන අතර එය මුළු සංඛ්‍යාවෙන් 24%ක ප්‍රමාණයකි.
- මෙම වසර තුළ LECO විදුලිබල ජාලයට පියැසි සූර්ය කෝෂ PV පද්ධති 72MW ධාරිතාවක් එකතු කර ඇති අතර, එමඟින් අපගේ මුළු ධාරිතාව 332MW ඉක්මවා ඇත.
- LECO බල පද්ධතියේ ධාරිතාව, විශ්වසනීයත්වය සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 50 ක ණයක් ලබා ගත් අතර, ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු සාර්ථකව සිදු කෙරෙමින් පවතී.
- බෙදාහැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම සඳහා ප්‍රමිතිගත ජාල පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කරන

ලද අතර, එකී කාලය තුළ ස්ථාවර ප්‍රගතියක් වාර්තා විය.

- අධි වෝල්ටීයතා පොකුරු රැහැන් ව්‍යාපෘති හඳුන්වාදීම හරහා පද්ධතියේ විශ්වසනීයත්වය ඉහල නැංවී ඇති අතර, එමඟින් අධිවෝල්ටියතා රැහැන් මාර්ගවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කරලීමට සමත්ව ඇත.
- ජාල ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ විදුලි ඇනහිටීම් අඩු කිරීම පිළිබඳ ප්‍රගතියේ සැලකිය යුතු සන්ධිස්ථානයක් අත්පත් කර ගනිමින්, පැරණි අධි වෝල්ටීයතා රැහැන් ප්‍රතිසන්නායකකරණය සිදු කරන ලදී.
- සැපයුම් ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ සංගත වූ ප්‍රගතියක් පෙන්නුම් කරමින්, වැඩිවෙමින් පවතින ස්ථානීය බැර අවශ්‍යතා සපුරාලීම සඳහා බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘති ආරම්භ කරන ලදී.
- නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර ව්‍යුහාත්මක ඉදිකිරීම් කටයුතු ප්‍රගතියක් සහිතව සිදුකරමින් පවතී.
- ප්‍රධාන සංවර්ධන මුලපිරීම් හරහා පද්ධතියේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම වෙනුවෙන් 33kV වහරු අංගන සැලසුම් කර හඳුන්වාදීම සඳහා මුල් පියවර ගැනීම.

5. 2026 වර්ෂය සඳහා ඉදිරි සැලසුම්

නව්‍යකරණය, ඩිජිටල්කරණය සහ පාරිභෝගික කේන්ද්‍රීය සේවා සැපයීම සඳහා වූ තම කැපවීමේ කොටසක් ලෙස, 2026 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් ප්‍රධාන මුලපිරීම් කිහිපයක් හඳුනාගෙන ඇත.

- **සුහුරු මනු 200,000ක් දක්වා ස්ථාපනය කිරීම**

  සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාග මෙහි දැනට ක්‍රියාත්මක වන්නේ සුහුරු මනු 148,000ක සංඛ්‍යාවකි. තවත් ඒකක 52,000ක් පමණ එකතු කිරීමෙන්, 2026 වන විට මුළු සුහුරු මනු ඒකක සංඛ්‍යාව 200,000 දක්වා වැඩි කිරීමට සමාගම සැලසුම් කරයි. මෙම ව්‍යාප්තියත් සමඟ, LECO සමාගමෙහි පාරිභෝගික පදනමෙන් 30% කට වඩා වැඩි ප්‍රමාණයක් සුහුරු මනුවලට සම්බන්ධ වනු ඇති අතර, එමඟින් බලශක්ති අධීක්ෂණය, බිල්පත් නිරවද්‍යතාවය සහ අනෙකුත් සුහුරු සේවාවන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු වේ.

- **කාලගුණ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සහ සූර්ය බලශක්ති පුරෝකථන ආකෘතිය ක්‍රියාත්මක කිරීම**

4. සමාගමේ මූල්‍ය තත්ත්වය

වගුව 3.1
2020 සිට 2025 ජූනි දක්වා මූල්‍ය තත්ත්වය

	2020	2021	2022	2023	2024	2025 ජූනි දක්වා
වසර අවසානයේ පාරිභෝගික ගිණුම්	600729	608453	618516	624549	630859	631878
GWh විකුණුම්	1573.43	1615.7	1565.7	1580.85	1727.4	902.84
සේවක සංඛ්‍යාව	1521	1500	1448	1413	1357	1217
පාරිභෝගික/සේවක අනුපාතය	395	406	427	442	465	519
බෙදාහැරීමේ ශක්ති හානිය (%)	3.63	4.08	4.09	3.55	3.36	2.86
ආදායම රු. මිලියන	30,618	32,416	39,252	75,138	67,218	24,444
මෙහෙයුම් වලින් ලැබෙන ලාභය රු. මිලියන	1,543	4,328	991	4,129	9,842	3,697
වසර සඳහා ලාභය රු. මිලියන	1,792	3,248	1,954	4,195	5,592	2,784
මුළු මූලධනය රු. මිලියන	34,792	38,419	40,687	45,435	50,648	53,432
මුළු බැරකම් රු. මිලියන	12,630	14,202	12,015	21,708	22,477	22,409
මුළු වත්කම් රු. මිලියන	47,422	52,621	52,702	67,143	73,125	75,840

තත්‍ය කාලීන දේශගුණික දත්ත රැස් කිරීම සඳහා කාලගුණ මධ්‍යස්ථාන ස්ථාපනය කෙරෙන අතර, එමඟින් සූර්ය බලශක්ති පුරෝකථන ආකෘතියකට අවශ්‍ය දත්ත පෝෂණය කරනු ලබයි. මෙම මුලපිරීම පුනර්ජනනීය බලශක්ති උත්පාදනය පුරෝකථනය කිරීමේ හැකියාව ශක්තිමත් කරනු ඇති අතර, ජාලයට සූර්ය බලශක්තිය වඩාත් හොඳින් ඒකාබද්ධ කිරීම සහතික කරයි. වැඩිදියුණු කළ පුරෝකථනය මඟින් සැපයුම් විශ්වසනීයත්වය සහ පද්ධති ස්ථායිතාව වැඩි දියුණු කරනු ඇත.

- **බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්ති (RE) මැදිරියක් ස්ථාපිත කිරීම**

පුනර්ජනනීය බලශක්ති සම්බන්ධතා වර්ධනය වෙමින් පවතින අතර එකී වර්ධනය වෙමින් පවතින කොටස් කළමනාකරණය කිරීම සඳහා බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථානය තුළ ඒ වෙනුවෙන් කැපවූ පුනර්ජනනීය බලශක්ති මැදිරියක් පිහිටුවනු ලැබේ. මෙම ඒකකය මගින් ජාලයට ලැබෙන පුනර්ජනනීය යෙදවුම් ගලාඒම අනුමත කිරීම්, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය විධිමත් කරනු ඇත. එය සමාගමේ පුනර්ජනනීය ඒකාබද්ධතා න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස ද ක්‍රියා කරනු ඇත.

- **සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙහි පාරිභෝගික සේවා ද්වාරය වැඩිදියුණු කිරීම**

සේවා සඳහා වේගවත් හා වඩාත් ඉහළ මට්ටමේ පරිශීලක-හිතකාමී ප්‍රවේශයක් ලබා දීම සඳහා පාරිභෝගික සේවා ද්වාරය වැඩිදියුණු කෙරේ. එමගින් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ විදුලි පරිභෝජනය, ගෙවීම් සහ ඉල්ලීම් වඩාත් කාර්යක්ෂම ලෙස නිරීක්ෂණය කිරීමට හැකි වනු ඇත. මෙමගින් පාරිභෝගික පහසුව වැඩි දියුණු කරන අතර සමාගම සමග පාරිභෝගික අන්තර්ක්‍රියා තවදුරටත් ඩිජිටල්කරණය කෙරෙනු ඇත.

- **බිල්පත් ගෙවීම් කටයුතු ස්වයංක්‍රීයකරණය**

බිල්පත් ගෙවීම් කටයුතු ස්වයංක්‍රීයකරණය මඟින් පුද්ගල මැදිහත්වීමෙන් සිදුකරන සැකසීම් අඩු කරන අතර පද්ධතිය මුළුල්ලේ පවතින කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනු ඇත. කඩිනම් ලෙස ගෙවීම් කටයුතු තහවුරු කිරීමකින් සහ පුළුල් පරාසයක වූ ස්වයංක්‍රීය විකල්ප වලින් පාරිභෝගිකයින්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත. මෙය දෝෂ අවම කිරීමට සහ ආදායම් රැස් කිරීම ශක්තිමත් කිරීමට ද උපකාරී වේ.

- **කළමනාකරණය ඇගයීම සඳහා සවිස්තරාත්මක ඍජෂ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම**

ප්‍රධාන ක්ෂේත්‍ර හරහා කළමනාකරණයේ කාර්ය සාධනය මැනීම සඳහා පුළුල් ඍජෂ රාමුවක් ක්‍රියාත්මක කෙරේ. මෙම පද්ධතිය වගවීම වැඩිදියුණු කරන අතර දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට සහාය වනු ඇත. මෙම පියවර මගින් ආයතනය තුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් වලින් සමන්විත වූ සංස්කෘතියක් ද නිර්මාණය කරනු ඇත.

- **ඉහළ මට්ටමේ පාරිභෝගික සේවාවක් සඳහා ඇමතුම් මධ්‍යස්ථානයේ සේවාවන් පුළුල් කිරීම**

ඉහළ සේවා ධාරිතාවක් සහ දීර්ඝ සේවා මෙහෙයුම් පැය සංඛ්‍යාවක් ලබා දීම සඳහා ඇමතුම් මධ්‍යස්ථානය පුළුල් කෙරේ. විමසීම් සහ පැමිණිලි සඳහා කඩිනම් විසඳුම් සඳහා පාරිභෝගිකයින්ට මෙමගින් ප්‍රවේශය ලැබෙනු ඇත. එමගින් පාරිභෝගික සේවාවේ සමස්ත ගුණාත්මකභාවය සහ තෘප්තිමත්භාවයේ මට්ටම් වැඩිදියුණු කරනු ඇත.

- **ERP පද්ධතිය සහ බිල්පත් පද්ධතිය යාවත්කාලීන කිරීම**

ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ඒකාබද්ධතාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් තම ERP සහ බිල්පත් පද්ධති නවීකරණය කරනු ඇත. යාවත්කාලීන කරන ලද පද්ධති මගින් මූල්‍ය ගනුදෙනු සහ සේවා කළමනාකරණයේ නිරවද්‍යතාවය ශක්තිමත් කරනු ඇත. මෙම වැඩිදියුණු කිරීම ඩිජිටල් පරිවර්තනය සඳහා ශක්තිමත් පදනමක් ද නිර්මාණය කරනු ඇත.

- **සියලුම පරිපාලන ලේඛන ඩිජිටල්කරණය කිරීම**

  සමාගම විසින් තම ලේඛනමය වාර්තා සම්පූර්ණයෙන්ම ඩිජිටල් ආකෘති බවට පරිවර්තනය කරනු ඇත. මෙම මුලපිරීම තුළින් අභ්‍යන්තර වැඩ ප්‍රවාහයන් විධිමත් කරන අතර තොරතුරු සඳහා ඇති ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කරනු ඇත. එය ඉහළ විනිවිදභාවයක් සහ දිගුකාලීන දත්ත ආරක්ෂාවක් සඳහා ද සහාය වනු ඇත.

- **සියලුම මෙහෙයුම් සඳහා කඩදාසි රහිත කාර්යාල ක්‍රම ව්‍යාප්ත කිරීම**

  පෙර මුලපිරීම් මත පදනම්ව, කඩදාසි රහිත කාර්යාල ක්‍රම සංකල්පය සමාගමේ සියලුම අංශ තුළ ව්‍යාප්ත කිරීමට පියවර ගනු ලැබේ. මෙමගින් කඩදාසි මත යැපීම අඩු කරමින් පරිපාලන වියදම් අඩු කරන අතර පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කරයි. පූර්ණ ඩිජිටල් වැඩ පරිසරයක් හරහා කාර්යක්ෂමතාව සහ සහයෝගීතාවය වැඩි දියුණු කරයි.

- **කළමනාකරණ කාර්යමණ්ඩලය සඳහා නම්‍යශීලී වැඩ පැය ක්‍රියාත්මක කිරීම**

  සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම යනු පැය 24 පුරා ක්‍රියාත්මක වන උපයෝගිතා මෙහෙයුම් වලින් සමන්විත වූ සමාගමක් වන අතර, කළමනාකරුවන් විසින් ඕනෑම වේලාවක අවශ්‍යතා සපුරාලීමට සූදානම්ව සිටිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සන්දර්භය තුළ, කළමනාකරණ මට්ටමේ කාර්යමණ්ඩලය සඳහා නම්‍යශීලී වැඩ පැය හඳුන්වා දෙමින් අඛණ්ඩ සේවා සැපයීමක් පවත්වා ගෙන යනු ඇත. සේවකයින් සඳහා වැඩිදියුණු කළ වැඩ පරිසරය සමඟින් සාමාන්‍ය ජීවිත සමතුලිතතාවයක් ලබාදීම හරහා සමාගමේ අඛණ්ඩ මෙහෙයුම් ඉල්ලීම් සමතුලිත මට්ටමකට ගෙන ඒම සඳහා මෙම මුලපිරීම සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

1. හැඳින්වීම

2007 අංක 35 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA), ශ්‍රී ලංකාව තිරසාර බලශක්ති ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රධාන ආයතනය ලෙස අඛණ්ඩව සේවය කරයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත පැවරී ඇති වගකීමට පුනර්ජනනීය බලශක්ති සම්පත් හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම ඇතුළත් වන අතරම, විවිධ අංශ හරහා බලශක්ති භාවිතයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ද එමගින් සහතික කරයි. හරිත බලශක්තිය දෙසට සිදුවන ගෝලීය සංක්‍රාන්තිය තුළ, ශ්‍රී ලංකාවේ බලශක්ති අංශය ජාතික හා ජාත්‍යන්තර කැපවීම් සමඟ, විශේෂයෙන් පැරිස් ගිවිසුමේ දක්වා ඇති ඉලක්ක, ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDCs) සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ පෙළගැස්වීමේ දී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

2025 වසරේ දෙවන කාර්තුව වන විට, මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, සංකීර්ණ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය වැනි අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 68% ක සමස්ත කාර්ය සාධන දර්ශකයක් අත්කර ගනිමින් ස්ථාවර ප්‍රගතියක් පිළිබිඹු කරයි.

මෙම වාර්තාව 2025 අගෝස්තු 31 වන දින දක්වා ප්‍රධාන ජයග්‍රහණ, මුහුණ දුන් අභියෝග සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියාත්මක කරන උපාය මාර්ග ඉදිරිපත් කරයි. විශේෂයෙන්, 3.2 වගන්තියේ විස්තර කර ඇති පරිදි සැළකිය යුතු ජයග්‍රහණ ලබා ඇති වහල මත සවිකළ සූර්ය බල පද්ධති සංවර්ධනය මෙමගින් අවධාරණය කරයි. ප්‍රතිලාභ තහවුරු කිරීම සහ අඩු කාබන්, බලශක්ති-ආරක්ෂිත අනාගතයකට සංක්‍රමණය වේගවත් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් 2026 වසර සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ දැක්ම මෙම වාර්තාව තවදුරටත් ගෙනහැර දක්වයි.

2. ප්‍රධාන අභියෝග හා ඒවා මැඩපැවැත්වීමේ ක්‍රමවේද

වගුව 4.1
වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇති ප්‍රධාන අභියෝග

ක්ෂේත්‍රය	අභියෝග	අභියෝග ජය ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රමවේද
ප්‍රතිපත්ති සහ තාක්ෂණික බාධක	පරිපාලන ක්‍රියාවලීන් සහ දැනුවත්භාවය නොමැතිකම හේතුවෙන් උපකරණ බලශක්ති කාර්ය සාධනය සහ ගොඩනැගිලි කේත වැනි නව ප්‍රමිතීන් සම්මත කර ගැනීම ප්‍රමාදයන්ට මුහුණ දී තිබේ.	රෙගුලාසි ගැසට් කිරීම සහ විශේෂයෙන්ම ගොඩනැගිලි නීති සංග්‍රහය ගැසට් කිරීම සඳහා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවධානය කල්තබා ඉල්ලා සිටීමට අමාත්‍යාංශ මට්ටමින් මැදිහත්වීම අවශ්‍ය වේ.
	විදේශ අරමුදල් සහ අනුමැතීන් ලබා ගැනීම සඳහා වන දීර්ඝ ක්‍රියා පටිපාටි නිසා නව ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා උපකරණ අත්පත් කර ගැනීම ප්‍රමාද වීම. ප්‍රතිපත්ති සම්පාදනයේ දී තීරණාත්මක අභියෝගයක් වන්නේ විශේෂයෙන් බලශක්ති කළමනාකරණ මුලපිරීම් වලින් ගිගාවොට් පැය ඉතිරිකිරීම් ප්‍රමාණනය කිරීම සහ රටේ තාප බලශක්ති ඉල්ලුම නිවැරදිව තක්සේරු කිරීම සම්බන්ධයෙන් විශ්වාසදායක දත්ත නොමැතිකමයි. කාර්යක්ෂම ලෙස දත්ත රැස් කිරීම, සංවිධාන හරහා අනුපිටපත් වීමේ උත්සාහයන් වළක්වා ගැනීමෙන් කාලය සහ සම්පත් ඉතිරි කර ගැනීම සහ කර්මාන්තශාලා මට්ටමින් නිෂ්පාදනය විධිමත් කිරීම සඳහා ISIC වර්ගීකරණයට අනුකූල වීම ඉතා වැදගත් වේ.	පවතින ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම. ප්‍රමිතිගත වාර්තාකරණ යාන්ත්‍රණ, තත්‍ය කාලීන අධීක්ෂණ පද්ධති සහ නියමිත අවස්ථාවන්හි සිදුකරන බලශක්ති විගණන ඒකාබද්ධ කරන පුළුල් ජාතික බලශක්ති දත්ත කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. බලශක්ති, මූල්‍ය සහ සමාජීය පැතිකඩ ආවරණය වන පරිදි කාර්මික, ගෘහස්ථ සහ වාණිජ දත්ත රැස් කිරීම සඳහා ජනලේඛන දෙපාර්තමේන්තුව සමඟ ප්‍රායෝගික ප්‍රශ්නාවලියක් මත ආයතන සහයෝගයෙන් කටයුතු කරයි.

2025 ජූලි මාසයේදී හම්බන්තොට මහානාගපුර පාසලේදී සේවකයින් වෙතින් රැස් කරගන්නා ලද ලද පොත් 1,000ක්, ප්‍රතිසංස්කරණය කරන ලද පරිගණක සහ පොත් රාක්ක පරිත්‍යාග කිරීම සාර්ථකව සිදු කරන ලදී. මෙම මුලපිරීම අධ්‍යාපනික අන්තරයන් පියවා, ඩිජිටල් ඉගෙනීම ප්‍රවර්ධනය කරන අතර දැනුම බෙදා ගැනීම ප්‍රවර්ධනය කරමින් සේවකයින් අර්ථවත් ආයතනික සමාජ සත්කාරයකට සම්බන්ධ කරන ලදී.

2025-26 සඳහා යෝජිත සැලසුම්

- **"පිරිසිදු සාගරය" - වෙරළ පිරිසිදු කිරීම (SDG 14)**

ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉවත් කිරීම සහ ප්ලාස්ටික් එකතු කරන්නන් ස්ථාපනය කිරීම සඳහා සේවකයින්ගෙන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන්නන් සමඟ වෙරළ පිරිසිදු කිරීමක් 2025 ඔක්තෝබර් මාසයේදී සිදුකිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සමුද්‍ර සංරක්ෂණය, ප්‍රජා දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සහ තිරසාරභාවය සඳහා එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගමේ කැපවීම බල ගන්වනු ඇත.

- **ඉදිකිරීම් ව්‍යාපෘති**

අ) ගිනි නිවන ජල සැපයුම වැඩිදියුණු කිරීම

අවශ්‍ය ආරක්ෂක ප්‍රමිතීන් සපුරාලීම සඳහා ගිනි නිවන ජල සැපයුම් ජාලය වැඩිදියුණු කරනු ලැබේ. ගින්නක් ඇති වූ විට වේගවත් හදිසි ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා නල විෂ්කම්භය වැඩි කිරීම සහ ප්‍රවාහ

අනුපාත වැඩි දියුණු කිරීම මෙයට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය මගින් ගිනි අවදානම් අවම කිරීම, සේවා ස්ථාන ආරක්ෂණ අනුකූලතාව සහතික කිරීම සහ සුවිශේෂී නිෂ්පාදන වත්කම් ආරක්ෂා කිරීම සිදු කරනු ඇත.

ආ) ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා තෙල් ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම

ගබඩා ධාරිතාව වැඩි කිරීම, ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ පාරිසරික රෙගුලාසි වලට අනුකූල වීම සඳහා පවතින තෙල් ගබඩා පහසුකම් නවීකරණය කරනු ලැබේ. මෙයට නල මාර්ග වෙනස් කිරීම්, විබාදන ආරක්ෂාව සඳහා පින්තාරු කිරීම සහ ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් ඇතුළත් වේ. වැඩිදියුණු කරන ලද පහසුකම මෙහෙයුම්වල විශ්වසනීයත්වය වැඩි දියුණු කරන අතර තෙල් හැසිරවීම සහ ගබඩා කිරීම හා සම්බන්ධ අනතුරු අඩු කරයි.

3.12 සපුගස්කන්ද ගැල්වනයිස්කරණ සහ පිරිසැකසුම් මධ්‍යස්ථාන

1999 දී ස්ථාපනය කරන ලද කරන ලද එල්ටීඑල් ගැල්වනයිසර්ස් (පුද්) සමාගම, එල්ටීඑල් හෝල්ඩින්ග්ස් හි අනුබද්ධිත ආයතනයක් වන අතර ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වානේ ආරක්ෂණ විසඳුම් සපයන්නා වේ. දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළවල් දෙකටම සේවය සපයන උණුසුම්-ඩිප් ගැල්වනයිසින්, තාප ඉසින ලෝහකරණය, ද්විත්ව ආලේපනය සහ වානේ නිෂ්පාදන සේවා සඳහා සමාගම විශේෂඥතාවයක් දක්වයි. නවීන CNC නිෂ්පාදන පහසුකම් සහ උසස් ගැල්වනයිසින් තාක්ෂණය සමගින්, එල්ටීඑල් ගැල්වනයිසර්ස් සුවිශේෂී යටිතල පහසුකම්, බල සම්ප්‍රේෂණය, පුනර්ජනනීය බලශක්තිය, සමුද්‍රීය සහ ප්‍රවාහන අංශ ව්‍යාපෘති සඳහා දිගුකාලීන විබාදන ආරක්ෂාව සහතික කරයි.

2025 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ සමාගම එහි සංවර්ධන සැලැස්ම යටතේ සුවිශේෂී ප්‍රගතියක් අත්කරගත්තේය. ඒ සම්බන්ධ මූලික ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- මන්නාරමේ මීටර් 100ක් උස කාලගුණ විද්‍යාත්මක උපකරණ ආශ්‍රෙයන් ස්ථාපිත කුළුණ (Met Mast tower) නිම කිරීම - ශ්‍රී ලංකාවේ උසම කුළුණ කටුක වෙරළබඩ තත්වයන් යටතේ දිගුකාලීන කාර්යසාධනය සඳහා නිර්මාණය කර ගැල්වනයිස් කර, රටේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.
- දේශීය ව්‍යාපෘති ආයෝජන කළඹ ශක්තිමත් කිරීම, මාර්ග සංවර්ධනය, විදුලිය සහ කාර්මික සේවාදායකයින් සඳහා ගැල්වනයිස් සහ නිෂ්පාදන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ නාගරික සංවර්ධන අධිකාරිය සහ CIDA සමඟ ලියාපදිංචි සැපයුම්කරුවෙකු බවට පත් වීම.
- ලංවිම, මාර්ග සංවර්ධන අධිකාරිය, SLPA සහ පෞද්ගලික අංශයේ ඉංජිනේරුවන් වැනි ප්‍රධාන කොටස්කරුවන් සමඟ දැනුවත් කිරීමේ සැසි හරහා තාක්ෂණික දැනුම බෙදා ගැනීම පුළුල් කිරීම සහ IESL හි CPD පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

සපුගස්කන්ද ගැල්වනයිස්කිරීමේ බලාගාරය

නිෂ්පාදන තොරතුරුः

2025/01/01/ දින සිට 2025/08/31 දින දක්වා වාර්තා වූ නිෂ්පාදනය පහත සඳහන් පරිදි වේ:

නිෂ්පාදන නිමැවුම් ගැල්වනයිස්කරණ බලාගාරය (MT)		
ගනුදෙනුකරු	2025 ජනවාරි සිට අගෝස්තු දක්වා	2024 ජනවාරි සිට අගෝස්තු දක්වා
ලංවිම	774	1241
අපනයන	0	0
දේශීය	2830	3929
එකතුව	**3604**	**5170**

නිෂ්පාදන නිමැවුම් නිෂ්පාදන බලාගාරය		
ගනුදෙනුකරු	2025 ජනවාරි සිට අගෝස්තු දක්වා	2024 ජනවාරි සිට අගෝස්තු දක්වා
ලංවිම	150	243
අපනයන	-	71
දේශීය	266	423
එකතුව	**416**	**682**

2025 වර්ෂය සඳහා එල්ටීඑල් ගැල්වනයිසර්ස් (පුද්ගලික) සමාගමේ සමාලෝචනය

- 2025 ආරම්භයේදී, ප්‍රශස්ත කාර්යසාධනය සහතික කිරීම, අක්‍රීය කාලය අඩු කිරීම සහ නිෂ්පාදනයේ උසස් තත්ත්වයේ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වරින් වර කේතල වෙනස් කිරීම් සහ දහන පද්ධති වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.
- ව්‍යාපාරයේ පහත වැටීම අවම කිරීම සඳහා සමාගම පිරිවැටුම් ටෙන්ඩර් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තීරණය කළේය. අගෝස්තු මාසය වන විට සමාගම විවිධ අංශ හරහා එවැනි ටෙන්ඩර් විසිපහකට ක්‍රියාකාරීව සහභාගී වී ඇති අතර ටෙන්ඩර් අටකින් අඩුම ලංසුව සාර්ථකව ලබා ගෙන ඇත.

ආයතනික සමාජ වගකීම් සහ ESG ක්‍රියාකාරකම්:

- තටු 2.0 (දකුණු පළාත, 2025 අගෝස්තු): මූල්‍ය සාක්ෂරතාවයෙන් යුත් කාන්තා ව්‍යවසායකයින් 25 දෙනෙකු බලගැන්වීම
- බලාපොරොත්තුවේ බීජ - සෙනහසේ සුවඳ (ගාල්ල, 2025 අගෝස්තු): ගැබිනි මව්වරුන් 96 දෙනෙකු සඳහා වියළි සලාක පැකට් පිරිනැමීම
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ අලුත් අවුරුදු උත්සවය, විහාරමහාදේවි ආදි ගුරු සංගමය, ලංවිම සුභසාධන සංගමය සහ පොසොන් සංස්කෘතික උත්සව සඳහා අනුග්‍රාහකත්වය.

2025-26 වර්ෂය සඳහා යෝජිත සැලසුම්

තාක්ෂණ සහ ධාරිතා සංවර්ධනය

- සපුගස්කන්ද, නිෂ්පාදන කම්හල් පරිශ්‍රය 2026 පළමු කාර්තුවේ සිට, 2026 අවසානය වන විට අදියර වශයෙන් නිම කිරීම.
- නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට සහ ජාත්‍යන්තර තත්ත්ව අනුකූලතාව සහතික කිරීමට උසස් CNC නිෂ්පාදන යන්ත්‍රෝපකරණ, ගැල්වනයිස් කරන ලද කම්හල් වැඩිදියුණු කිරීම් සහ ආලේපන තාක්ෂණය සඳහා ආයෝජනය කිරීම.

නිමකළ ව්‍යාපෘති බාරදීමේ සේවය විකාශනය

- රට පුරා යටිතල පහසුකම් සහ බලශක්ති අංශයේ ව්‍යාපෘති 2025-26 පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වේ.
- තනි ව්‍යාපෘති කළමනාකරණ රාමුවක් යටතේ සැලසුම්, නිෂ්පාදන, ගැල්වනයිස්, සැපයුම් සහ ස්ථාපන සේවා ඒකාබද්ධ කිරීමෙන් "තනි -නැවතුම් විසඳුම" ආකෘතිය ශක්තිමත් කිරීම.

3.13 ආසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විස්ගියර් පුද්ගලික සමාගම, නවදිල්ලිය, ඉන්දියාව

ආසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විස්ගියර් පුද්ගලික සමාගම: විශේෂ අවස්ථා සහ ක්‍රමෝපාය සැලැස්ම

එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්) සමාගමේ හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන **ආසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විස්ගියර් පුද්. සමාගම** වාර්තාකරණ කාල සීමාව තුළ ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇත. ශක්තිමත් මූල්‍ය තත්වයක් සමඟින් ආසියාතික 2025 ජනවාරි සිට 2025 අගෝස්තු දක්වා **ඉන්දියන් රුපියල් මිලියන 1134.17 ක ප්‍රශංසනීය විකුණුම් ආදායමක්** අත්කර ගත්තේය (**අපනයනය: ඉන්දියන් රුපියල් මිලියන 455.13; දේශීය: ඉන්දියන් රුපියල් මිලියන 679.04). සමාගම තිරසාර කාර්ය සාධනයක් පෙන්නුම් කරමින් ස්ථාවර බදු පෙර ශුද්ධ ලාභයක් (NPBT)** ද පවත්වා ගෙන ගියේය.

විශේෂයෙන්, 2023/24 මූල්‍ය වර්ෂයේදී, ආසියාටික් සමාගම එහි ගමන් මගෙහි ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් එහි **ඉහළම පිරිවැටුම වන ඉන්දියන් රුපියල් බිලියන 1.49** ක් ලෙස වාර්තා කළේය. වසර

ගණනාවක් පුරා ආසියාටික් සමාගම ශක්තිමත් ගෝලීය පැවැත්මක් ගොඩනඟා ගෙන ඇති අතර ලොව පුරා ප්‍රමුඛ උපයෝගිතා ආයතන වෙතින් අනුමැතිය ලබා ගෙන ඇත, ඒවා අතරː

- මැද පෙරදිගː DEWA (ඩුබායි), AADC/ ADEWA (අබුඩාබි), MEW (ඕමාන් සහ කුවේට්), EWA (බහරේන්), Kahramaa (කටාර්), PEC යේමනය
- අප්‍රිකාවː Eskom (දකුණු අප්‍රිකාව), KPLC (කෙන්යාව), MEW උගන්ඩාව, EEU (ඉතියෝපියාව)
- ආසියාව සහ යුරෝපයː EAC (සයිප්‍රසය), ලංවිම (ශ්‍රී ලංකාව)

අනුමැතියන්ගෙන් ඔබ්බට ආසියාතික සමාගම සිය නිෂ්පාදන **එක්සත් රාජධානිය, උගන්ඩාව, ඝානාව, නේපාලය, බංග්ලාදේශය** සහ තවත් බොහෝ ජාත්‍යන්තර වෙළඳපොළවල් වෙත අපනයනය කරයි.

ඉන්දියාවේ ආසියාටික් සමාගම JVVNL (ජයිපූර්), AVVNL (අජ්මර්), JDVVNL (ජෝද්පූර්), BEST (මුම්බායි), BSES (දිල්ලි), TPDDL (දිල්ලි), MPPVVC (මධ්‍ය ප්‍රදේශ්), BESCOM (බැංගලෝර්), KSEB (කේරළ), PUVVNL **උත්තර ප්‍රදේශ් ඇතුළු සියලුම ප්‍රධාන විදුලි බෙදාහැරීමේ සමාගම්වලට** සේවය සපයයි. මීට අමතරව, සමාගම රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපෘති සඳහා සේවා සපයන අතර, දේශීය කොන්ත්‍රාත්කරුවන් සහ සෘජු ගනුදෙනුකරුවන් හරහා මධ්‍යම වෝල්ටීයතා (MV) පැනල් සපයයි.

සුවිශේෂී ජයග්‍රහණ

- **ලීන් (පිරිවැය සහ නාස්තිය අවම කර වැඩි ඵලදායීත්වයක් ලබාගැනීමේ) තාක්ෂණය ක්‍රියාත්මක කිරීමː**

ඉන්වෙන්ටරි අඩු කිරීම, නාස්තිය අවම කිරීම සහ නිෂ්පාදන වේගය වේගවත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලීන් නිෂ්පාදන පිළිවෙත් හඳුන්වා දෙන ලදී. මෙම මුලපිරීම් සමඟින් ආසියාටික් සමාගම **ප්‍රමිතිගත MV** පැනල් **සඳහා දින 7 ක සහ ප්‍රමිතිගත** නොවන පැනල් **සඳහා දින 21 ක** බෙදාහැරීමේ කාලරාමු ඉලක්ක කරයි. විශේෂයෙන් නිර්මාණය කරන ලද අතින් සම්ප්‍රේෂකයක් දැනටමත් මිනිස් පැය 35% කින් අඩු කර ඇති අතර, මෙම නවෝත්පාදනය ඛV රේඛා දක්වා ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත. කාලයත් සමඟ නිෂ්පාදන කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සමාගම අර්ධ ස්වයංක්‍රීය පද්ධති වෙත මාරු වීමට අරමුණු කරයි.

- **පාරිභෝගික සහභාගීත්ව විශිෂ්ටත්වයː**
  ප්‍රථම වරට ආසියාටික් සමාගම විසින් ශ්‍රී ලංකාවේ **2025 පාරිභෝගික හමුවක්** පැවැත්වූ අතර එමඟින් ප්‍රභූ ගනුදෙනුකරුවන්ට දර්ශනීය ගමනාන්ත වෙත විනෝද චාරිකාවක් සහ එහි සහෝදර සමාගම්වල **අති නවීන පහසුකම්** නැරඹීම ඒකාබද්ධ කළ අද්විතීය අත්දැකීමක් ලබා දෙන ලදී. මෙම අවස්ථාව **ආසියාටික්** සමාගමේ ශක්තිමත් තාක්ෂණික සහ මූල්‍යමය සහයෝගය කෙරෙහි පාරිභෝගික විශ්වාසය ශක්තිමත් කළේය. ප්‍රධාන විධායක නිලධාරියාගේ නායකත්වයෙන් යුත් විශේෂ **සම්මාන උළෙලක්,** පක්ෂපාතිත්වය පෝෂණය කිරීම සහ දිගුකාලීන හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම යන කාණ්ඩ හරහා ගනුදෙනුකරුවන් හඳුනාගන්නා ලදී.

- **පුනර්ජනනීය බලශක්තිය වෙත යොමුවීම**
  රාජස්ථානයේ ආසියාටික් සමාගමේ සූර්ය බලශක්ති IPP ව්‍යාපෘති දෙක **(ඒකාබද්ධ ධාරිතාව මෙගාවොට් 8)** අවසන් වීමට ආසන්නව ඇති අතර **2025 සැප්තැම්බර්** අග වන විට ක්‍රියාත්මක වීමට අපේක්ෂා කෙරේ. මෙම සන්ධිස්ථාන මුලපිරීම ආසියාටික් සමාගමේ **පුනර්ජනනීය** බලශක්ති අංශයට **පිවිසීම** සනිටුහන් කිරීම, ESG කැපවීම් සඳහා සහය දැක්වීම සහ කාබන් පියසටහන් අඩු කිරීම සිදු කරයි. විදේශීය හිමිකාරිත්වය හේතුවෙන් මූලික මූල්‍යකරණ අභියෝග පැවතියද **BIP-Singapore, Transformers, Galvanizers** සහ **එල්ටීඑල් Holdings** වෙතින් කොටස් මුදල් සම්භාරයක් වියදම් කිරීම හරහා ව්‍යාපෘති සඳහා සාර්ථකව අරමුදල් සපයන ලදී. මෙම නව ව්‍යාපෘතිය සමඟ, ඉදිරි වසරවලදී එහි ස්ථාපිත ධාරිතාව ක්‍රමානුකූලව පුළුල් කිරීමට සැලසුම් කර ඇති අතර, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතනයක් බවට පත්වීමට ආසියාටික් සමාගම හොඳින් ස්ථානගත වී ඇත.

- මෙම කාලය තුළ, ආසියාටික් සමාගමේ **මෙහෙයුම් හිවාඩි හි E-92 හි අලුතින් බදු දුන් කම්හලේදී ආරම්භ විය.** නවීන පහසුකම, අලුතින් මිලදී ගත් **ලේසර් යන්ත්‍රයක්** ඇතුළුව, පවතින **CNC** මුරෝටෝ සහ අමාඩා යන්ත්‍ර ඇතුළුව **අති නවීන නිෂ්පාදන යන්ත්‍රෝපකරණ** වලින් සමන්විත වේ. බස්බාර් සම්බන්ධතා නිරවද්‍ය ලෙස කැපීම සහ සිදුරු කිරීම සඳහා **CNC තඹ නිෂ්පාදන යන්ත්‍ර** ද කම්හල සතුවේ. නව පූර්ව ප්‍රතිකාර සහ කුඩු ආලේපන කම්හලක් ස්ථාපනය වෙමින් පවතින අතර 2025 සැප්තැම්බර් මැද භාගය වන විට ක්‍රියාත්මක වීමට අපේක්ෂා කෙරේ.

වෙනත් සුවිශේෂී අවස්ථා

2024 ජූනි 5 වන දින ලෝක පරිසර දිනයේදී, ආසියාටික් කණ්ඩායම පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා රුක් රෝපණ ව්‍යාපාරයකට සහභාගී විය. මෙම මුලපිරීම පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා ගස් සිටුවීමේ වැදගත්කම අවධාරණය කළ අතර පරිසරයට සහාය වීම සඳහා ආසියාටික් සමාගමේ කැපවීම අවධාරණය කළේය.

2025-26 සඳහා යෝජිත සැලසුම්

පුළුල් කිරීම, නවෝත්පාදනය සහ පාරිභෝගික සහභාගීත්වය වටා ගොඩනගා ඇති අවධානය යොමු කළ උපාය මාර්ගයක් හරහා ආසියාටික් සමාගමේ ඊළඟ අදියරේ වර්ධනය සඳහා සූදානම් වෙමින් සිටී. ප්‍රධාන මූලික ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

(අ) නිෂ්පාදන ආයෝජන කළඹ පුළුල් කිරීම
ආ) දේශීය වෙළෙඳපොළට පිවිසීම
ඇ) ආයතනික වෙළඳ නාමකරණය
ඈ) ධාරිතාව පුළුල් කිරීම
ඉ) ගෝලීය වෙළඳපල ව්‍යාප්තිය

4. ඉගෙනුම් සහ සංවර්ධන විස්තර හා අනෙකුත් ක්‍රියාකාරකම්

- **සේවස්ථ පුහුණු සඳහා ස්ථානගත කිරීම්**

ශ්‍රී ලාංකික ව්‍යාපාරික ඒකක හරහා ප්‍රධාන වශයෙන් යාන්ත්‍රික, විදුලි සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවලින් උපාධි අපේක්ෂකයින් 88 දෙනෙකු වෙත සේවස්ථ පුහුණුව ස්ථානගත කිරීම් පිරිනමනු ලැබේ.

2025 ජනවාරි 01 සිට 2025 අගෝස්තු 31 දක්වා සමුච්චිත සමූහ ඉගෙනුම් හා සංවර්ධන තොරතුරු සංඛ්‍යාත්මකව

මුළු ඉගෙනුම් පැය	මුළු ආයෝජනය (ලංකා රුපියල්)	මුළු පුහුණු අවස්ථා සංඛ්‍යාව
6863.1	23,877,632.54	2786

- **වෘත්තීය ප්‍රදර්ශන සහ ඒ ආශ්‍රිත කුසලතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම්**

සේවායෝජක සන්නාමය වැඩිදියුණු කිරීමට සහ කුසලතා උපාය මාර්ගයක් ලෙස කුසලතා ගොඩනැගීම සඳහා ආයෝජනය කිරීමට එල්ටීඑල් හෝල්ඩින්ග්ස් රැකියා පොළවල ක්‍රියාකාරීව නිරත වේ.

- **ආයතනික සමාජ සත්කාරක ක්‍රියාකාරකම්**
සමාගම විසින් 2025-2027 කාලය තුළ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මී ගස් 10,000ක් සිටුවීමේ "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන

සමග සමගාමීව පරිසර පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් වන "දස දහසක් මී තුරු" නමින් වැඩසටහනක් දියත් කර ඇත. මොණරාගල දිස්ත්‍රික්කයේ දැනට ගස් 1700ක් සිටුවා ඇත. (මොණරාගල ගලපිටආර වැව අවට)

- එක්සත් රාජධානියේ පැවති IMechE Formula Student තරඟයට සහභාගී වීම සඳහා 2 වන පරම්පරාවේ මෝටර් රථය නිෂ්පාදනය කිරීම සඳහා ද්‍රව්‍ය සහ අමතර කොටස් මිලදී ගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයේ තරුණ ඉංජිනේරුවන් කණ්ඩායමක් වන "Team FalconE" සඳහා Silver Plus අනුග්‍රාහකත්වය සමාගම විසින් ලබාදෙන ලදී.

- මෙම එහි අනුබද්ධිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකා ජාතික රෝහලේ විදුලි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ආයතනික සමාජ වගකීමේ මූලික කාර්යයන්හි (පළමු අදියර ආරම්භ කර ඇත. සැත්කම්, බද්ධ කිරීම් සහ දැඩි සත්කාර ඒකක ඇතුළු තීරණාත්මක මෙහෙයුම් සඳහා අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම, රෝහල පුරා විදුලි බෙදාහැරීමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සහ අනපේක්ෂිත විදුලි බිඳවැටීම් වැළැක්වීමේදී යල් පැන ගිය උපකරණවලින් පැන නගින ආරක්ෂක අවදානම් අවම කිරීම යන මූලික අරමුණු සහිතව, රෝහලේ යල් පැන ගිය විදුලි පද්ධති නවීකරණය කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

5. ආයතනයේ සමස්ත මූල්‍ය තත්ත්වය

ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ සුවිශේෂී මූල්‍යමය අවස්ථා ඇතුළුව මූල්‍ය වර්ෂය තුළ එල්ටීඑල් හෝල්ඩින්ග්ස් සමාගම් සමූහයේ කාර්ය සාධනය

2025 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ ජනනය කරන ලද දළ ලාභය පසුගිය වසරේ එම දිනයට සාපේක්ෂව 6% ක වැඩිවීමක් වාර්තා කළේය. 2025 ජුනි මාසයේදී වාණිජ මෙහෙයුම් ආරම්භ කළ මෙගාවොට් 350 සොබාධනවි RLNG බලාගාරයේ සම්පූර්ණ ක්‍රියාකාරිත්වයත් සමඟ මූල්‍ය වර්ෂය අවසානයේ මෙම ප්‍රවණතාවය 20% ක් පමණ දක්වා තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්ෂය වූ විදේශ විනිමය තත්ත්වය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආනයන සඳහා පනවා ඇති සීමාවන් තරමක් ලිහිල් කර ඇති අතර, එමඟින් සමාගම් සමූහයේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ආනයන සැලකිය යුතු ලෙස පුළුල් කිරීමට පහසුකම් සැලසී ඇත.

පෙර වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුළ සමාග මේ ප්‍රධාන මෙහෙයුම්වල මූල්‍ය කාර්යසාධනයේ සමාලෝචනය පහත පරිදි වේ.:-

කාලපරිච්ඡේදය	2025 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා	2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලිත් වර්ෂය	2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලිත් වර්ෂය
පිරිවැටුම	(රු.මි.)	(රු.මි.)	(රු.මි.)
නිෂ්පාදන සහ විවිධ සේවා	10,757	15,387	13,906
විදුලි බල උත්පාදනය	32,394	43,343	42,717
එකතුව	**43,151**	**58,730**	**56,623**
දළ ලාභය			
නිෂ්පාදන සහ විවිධ සේවා	2,360	4,152	4,678
විදුලිබල උත්පාදනය	8,562	14,184	14,552
එකතුව	**10,922**	**18,336**	**19,230**

ලාභාංශ ආදායම-2025

සමාගමට එහි ආයෝජන වලින් ලාභාංශ ආදායම ලැබුණු අතර සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සමාගමට අත්‍යවශ්‍ය අරමුදල් උපයා ලන්නා ලදී. පහත වගුවේ දක්වා ඇති විස්තර අනුව රු. 5,715,600,909.00 ක මුදලක් උපයා ඇතඃ

එල්ටීඑල් සමූහය උපයාගත් ලාභාංශ ආදායම	
සමාගම්	මුදල (රු.)
ලක්ධනවි සමාගම	4,084,965,451
එල්ටීඑල් ගැල්වනයිසර්ස් සමාගම	1,000,000,000
ආසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විස්ජියර් සමාගම	15,383,454
පවන්ධනවි (පුද්) සමාගම	25,500,007
එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම	500,000,000
නිව්දු (පුද්) සමාගම	89,751,997
එකතුව	**5,715,600,909**

6. 2026 වර්ෂය සඳහා ඉදිරි සැලසුම්

(අ) අප්‍රිකාවේ සහ ටැන්සානියාවේ ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදන පහසුකම පුළුල් කිරීම

එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර් ටැන්සානියාව, අවසාන සේවාදායකයා වන ග්‍රාමීය බලශක්ති ඒජන්සිය (REA) සහ ටැන්සානියා විදුලි සැපයුම් සමාගම් සීමාසහිත (TANESCO) නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණ (FAT) දෙකක් සාර්ථකව නිම කිරීමෙන් පසු ට්‍රාන්ස්ෆෝමර් 375 සඳහා ඔවුන්ගේ පළමු ට්‍රාන්ස්ෆෝමර් ඇණවුමෙන් ට්‍රාන්ස්ෆෝමර් 124 කින් යුත් 1 ලොට් සහ 2 ලොට් සාර්ථකව බෙදාහැර ඇත. ඊළඟ ට්‍රාන්ස්ෆෝමර් 137 නිෂ්පාදනය කර ඇති අතර 2025 ජූලි අවසානය වන විට FAT සඳහා සැලසුම් කර ඇති අතර ඉතිරි ඒකක 114 2025 සැප්තැම්බර් අවසානය වන විට යැවීමට සූදානම් කරනු ලැබේ.

නැගෙනහිර අප්‍රිකානු කලාපයේ ටෙන්ඩර් සඳහා ශක්තිමත් මෙන් ම නිත්‍ය සාර්ථක ලංසුකරුවෙකු වීම නිසා මේ දක්වා ලබා ඇති අත්දැකීම් අප්‍රිකාවේ එහි පැවැත්ම ස්ථාපිත කිරීමට මංපෙත් විවර කරනු ඇතැයි එල්ටීඑල් හෝල්ඩින්ග්ස් විශ්වාස කරයි. එබැවින්, ඉහළ මට්ටමේ තරඟකාරිත්වයකට විනිවිද යාම සඳහා, අඩු වියදම් ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනයක් අත්‍යවශ්‍ය වන ටෙන්ඩර් දිනා ගැනීමේ විභවයන් උපයෝගී කර ගැනීම සඳහා ශක්තිමත් මිලකරණ උපාය මාර්ගයක් ඉදිරිපත් කිරීමට සමාගම අදහස් කරයි.

(ආ) විදුලි බලාගාර ව්‍යාපෘති සංවර්ධනය - කෙරවලපිටියේ ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය - සහස්ධනවි විදුලි බලාගාරය - 350MW RLNG – II

ලංකා ඛනිජ තෙල් සංස්ථාව (CPC) සමඟ ඉන්ධන සැපයුම් ගිවිසුම (FSA), ශ්‍රී ලංකා රජය සමග ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (IA) සහ BOI සමග ආයෝජන මණ්ඩල (BOI) ගිවිසුම වැනි අනෙකුත් ව්‍යාපෘති ආශ්‍රිත ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් සිටියි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

1. හැඳින්වීම

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, පිරිපහදු කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීමට අදාළ ව්‍යාපාරික කටයුතු කර ගෙන යාම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ස්ථාපිත කරන ලද අතර ඊට අයත් කාර්යයන් ඉටු කිරීමට අදාළ නෛතික ප්‍රතිපාදන 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මඟින් ලබා දෙන ලදී.

2. 2025 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ආනයන සහ දේශීය සැපයුම හරහා රටේ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුමෙන් බහුතරය සපුරාලයි. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට අමතරව, සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ දී ආනයනික බොරතෙල් පිරිපහදු කිරීමෙන් දේශීයව ඉන්ධන නිෂ්පාදනය කරයි. ඒ අනුව, 2025 වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කාර්ය සාධනය සහ ප්‍රගතිය මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කෙරේ.

2.1 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් නිෂ්පාදනවල ප්‍රාථමික ආනයනකරු ලෙස කටයුතු කරන අතර, ආනයනය සහ බෙදා හැරීම හරහා මුළු ජාතික ඉල්ලුමෙන් ආසන්න වශයෙන් 52% ක් පමණ සපුරාලනු ලබයි. මීට අමතරව, 1969 සිට, සංස්ථාව දේශීය වශයෙන් බොරතෙල් ආනයනය, පිරිපහදු කිරීම සහ සැපයීම සඳහා වගකියන එකම ආයතනය වන අතර, දේශීය පිරිපහදු මෙහෙයුම් හරහා රටේ මුළු ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 27% කට පමණ දායක වේ. ඒ අනුව, 2022 සිට 2025 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සහ සැපයුම්වල ප්‍රගතිය 10.1 වගුවේ ඉදිරිපත් කර ඇත.

වගුව 10.1
පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය (2022 - 2025)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නිෂ්පාදනය	ප්‍රමාණය (මෙ.ටො) ('000)			
	2022	2023	2024	2025.09.30 දිනට
1. පිරිපහදු කළ නිෂ්පාදන ආනයන ප්‍රමාණය				
▪ ඔටෝ ඩීසල්	1,267	695	547	408
▪ සුපර් ඩීසල්	128	24	27	15
▪ පෙට්‍රල් - 92 ඔක්ටේන්	888	794	586	466
▪ පෙට්‍රල් - 95 ඔක්ටේන්	46	28	20	10
▪ ජෙට් ඒ-1	269	168	316	219
▪ අඩු සල්ෆර් දැවි තෙල් (180 CST)	124	124	35	0
▪ නැප්තා	-	16	-	-
එකතුව	**2,723**	**1,849**	**1,531**	**1,118**
2. බොරතෙල් නිෂ්පාදන ආනයන ප්‍රමාණය				
▪ බොරතෙල්	743	1,666	1,519	1,319
සමස්ත ආනයන ප්‍රමාණය	**3,466**	**3,515**	**3,050**	**2,437**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2022 වර්ෂයේ සිට 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන ප්‍රමාණයන් සැලකිල්ලට ගැනීමේ දී 2022 සිට 2024 දක්වා වර්ෂවලදී මෙට්‍රික් ටොන් 2,723,000 ක්, මෙට්‍රික් ටොන් 1,849,000 ක් සහ 1,531,000 ක් පිළිවෙලින් ආනයනය කර ඇති අතර 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා පිරිපහදු කළ නිෂ්පාදන ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,118,000 කි.

ඉන්ධන මෙට්‍රික් ටොන් 5,300 ක පමණ පිරිපහදු ධාරිතාවයකින් යුක්ත වන අතර වසරක උපරිම පිරිපහදු ධාරිතාවය මෙට්‍රික් ටොන් 1,934,500 කි. 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා බොරතෙල් මෙට්‍රික් ටොන් 1,355,201 ක ප්‍රමාණයක් පිරිපහදු කර ඇති අතර එය උපරිම පිරිපහදු ධාරිතාවයෙන් 70% කි.

2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා පිරිපහදු

ප්‍රස්තාරය 10.1

පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය (2022 - 2025.09.30 දිනට)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

තවද, පසුගිය වර්ෂයන්හි බොරතෙල් ආනයන ප්‍රමාණයන් සලකා බැලීමේදී 2022 වර්ෂයේ මෙට්‍රික් ටොන් 743,000 ක්, 2023 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,666,000 ක්, 2024 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,519,000 ක් ආනයනය කර ඇති අතර 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා මෙට්‍රික් ටොන් 1,319,000 ක් ආනයනය කරන ලදී.

2.2 සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුවේ දායකත්වය

සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව දිනකට

ක්‍රියාවලිය මඟින් ඛනිජ තෙල් නිෂ්පාදන 08 කින් මෙට්‍රික් ටොන් 1,287,215 ක් නිෂ්පාදනය කරන ලද අතර එම ප්‍රමාණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් සැපයුමින් 53% කට ආසන්න අගයක් ගනී. ඔටෝ ඩීසල්, දැවි තෙල්, ජෙට් ඒ 1, පෙට්‍රල් 92 ඔක්ටේන් සහ භූමිතෙල් යනු මෙම පිරිපහදු ක්‍රියාවලියෙන් නිපදවෙන ප්‍රධාන නිෂ්පාදනයි. සපුගස්කන්ද පිරිපහදුව මඟින් පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සංයුතිය පහතින් දක්වා ඇත.

වගුව 10.2
පිරිපහදුවේ නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) (2022 - 2025.09.30 දිනට)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වර්ෂය	2022	2023	2024	2025.09.30 දිනට
බොරතෙල් යෙදවුම් ප්‍රමාණය	**529,773**	**1,677,033**	**1,528,719**	**1,355,201**
නිෂ්පාදනය				
▪ පෙට්‍රල් -92 ඔක්ටේන්	38,666	171,186	150,566	138,367
▪ ලංකා ඔටෝ ඩීසල්	128,165	505,675	443,933	384,312
▪ භූමිතෙල්	25,289	49,484	72,618	58,490
▪ ජෙට් ඒ 1	57,346	233,652	207,434	196,559
▪ දැවි තෙල් 800 සුපර්	87,196	379,015	345,447	388,480
▪ දැවි තෙල් 1500 සුපර්	107,001	103,111	-	-
▪ දැවි තෙල් 800 නැව් තෙල්	-	-	82,000	-
▪ නැප්තා	30,835	129,058	121,449	116,139
▪ SBP	2,690	1,524	1,267	515
▪ තාර	-	-	-	-
▪ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු	5,687	23,800	20,815	20,654
නිමැවුම් එකතුව	**482,875**	**1,596,505**	**1,445,529**	**1,287,215**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වගුව 10.3
ආනයනික නිමි නිෂ්පාදන සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන - (2022 - 2025.09.30 දිනට)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නිෂ්පාදනය	ආනයනික නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.)	පිරිපහදුවෙන් නිෂ්පාදනය කළ ප්‍රමාණය (මෙ.ටො.)	එකතුව (මෙ.ටො.)
පෙට්‍රල් -92 ඔක්ටේන්	465,751.15	138,367	604,118.15
පෙට්‍රල් -95 ඔක්ටේන්	10,277.91	-	10,277.91
ලංකා ඔටෝ ඩීසල්	408,450.03	384,312.35	792,762.38
ලංකා සුපර් ඩීසල්	15,098.09	-	15,098.09
භූමි තෙල්	-	58,490	58,490
ජෙට් ඒ 1	219,142.59	196,559	415,701.59
දැවි තෙල් 800 සුපර්	-	388,480	388,480
දැවි තෙල් 800 නැව්තෙල්	-	-	-
අඩු සල්ෆර් දැවි තෙල් (180 CST)	-	-	-
නැප්තා	-	116,139	116,139
SBP	-	515.00	515.00
ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු	-	20,654	20,654
එකතුව	**1,118,719.77**	**1,287,215**	**2, 422,236.12**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.3 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

ජනගහනයේ වර්ධනයත් සමග වැඩි වන අවශ්‍යතාවලට අනුකූලව ගෘහස්ථ සහ වාණිජ අංශවල පමණක් නොව විදුලිය නිෂ්පාදනය, ප්‍රවාහනය, කර්මාන්ත, ධීවර සහ කෘෂිකාර්මික අංශවල ද ඛනිජ තෙල් පරිභෝජනය ඉහළ ගොස් ඇත. ඒ අනුව, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පවත්නා ඉල්ලුම සපුරාලීම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලු අංශයන් ඔස්සේ නිෂ්පාදන අලෙවි කටයුතුවල නිරත වේ.

2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් නිෂ්පාදන වර්ග පහළොවක් (15) ක් අලෙවි කර ඇත. 2023 -2025.09.30 දක්වා කාලය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ථ ඉන්ධන අලෙවිය පිළිබඳ තොරතුරු 10.4 වගුව මගින් දක්වා ඇත. 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා මෙට්‍රික් ටොන් 2,506,953 ක සමස්ථ ඉන්ධන අලෙවියක් වාර්තා කර ඇත.

වගුව 10.4: සමස්ත ඉන්ධන අලෙවිය (2023 - 2025.09.30 දිනට)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නිෂ්පාදන වර්ගය	සමස්ත අලෙවිය (මෙ.ටො.)		
	2023	**2024**	**30.09.2025 දිනට**
ලංකා පෙට්‍රල් - 92 ඔක්ටේන්	982,939.25	804,419	624,797
ලංකා පෙට්‍රල් - 95 ඔක්ටේන්	29,042.01	20,893	18,509
ලංකා ඔටෝ ඩීසල්	1,257,303.75	1,025,160	770,631
ලංකා සුපර් ඩීසල්	29,809.39	23,531	20,121
ලංකා භූමිතෙල්	82,724.80	134,580	110,624
ලංකා කාර්මාන්ත භූමිතෙල්	1,828.13	4,134	6,497
ලංකා රසායනික නැප්තා	120,093.96	101,541	88,618
ලංකා දැවි තෙල් 800	12.51	6	-
ලංකා දැවි තෙල් 1500 (වැඩි සල්ෆර්)	168,800.54	116,652	75,348
ලංකා දැවි තෙල් 1500 (අඩු සල්ෆර්)	237,192.23	155,816	86,649
ලංකා දැවි තෙල් - සුපර්	117,198.22	155,857	118,607
ජෙට් ඒ-1	377,456.72	468,158	374,699
ලංකා සොල්වන්ට් (SBP)	1,362.94	1,161	751
ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු	23,877.74	19,676	19,918
ලංකා ඒ.වී.ගෑස්	120.67	132	108
එකතුව	**3,429,762.86**	**3,031,716**	**2,506,953**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.4 විදුලි ජනනය සඳහා ඉන්ධන අලෙවි කිරීම

විදුලිය ජනනයට අවශ්‍ය ඉන්ධන සැපයුම් කරනු ලබන එකම සැපයුම්කරුවා ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු කරනු ලබන අතර ලංකා විදුලිබල මණ්ඩලයට සහ පෞද්ගලික විදුලිය නිෂ්පාදකයන් වෙත අවශ්‍ය ඉන්ධන සැපයීම සිදු කරනු ලබයි. විදුලිය නිෂ්පාදනය සඳහා 2022 වර්ෂයේ සිට 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා ඉන්ධන අලෙවිය වගු අංක 10.5 න් දැක්වේ. ඒ අනුව, 2025 සැප්තැම්බර් 30 දින වන විට විදුලිය නිෂ්පාදනය සඳහා ඉන්ධන ලීටර් 402,730,000 ක් සපයා ඇත.

වගුව 10.5 : විදුලි ජනනයට ඉන්ධන අලෙවි කිරීම - (2022 - 2025.09.30 දින දක්වා)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

	ලංකා විදුලිබල මණ්ඩලය ලීටර් ('000')				පෞද්ගලික විදුලි නිෂ්පාදකයන් ලීටර් ('000')			මුළු එකතුව ලීටර් ('000')
වර්ෂය	ලංකා ඔටෝ ඩීසල්	නැප්තා	දැවි තෙල්	ලංකා සුපර් ඩීසල්	ලංකා ඔටෝ ඩීසල්	දැවි තෙල්	ලංකා සුපර් ඩීසල්	
2022	86,769	46,781	181,103	12,147	115,205	123,369	5,678	**571,051**
2023	102,877	174,136	228,885	-	3,175	256,580	-	**765,653**
2024	44,647	147,251	206,467	-	16,609	164,335	-	**579,309**
2025.09.30 දිනට	12,813	128,496	119,979		23,839	117,603	-	**402,730**

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.5 ගුවන් යානා ඉන්ධන (ජෙට් ඒ 1) අලෙවිය

ශ්‍රී ලංකාවේ ගුවන් යානා ඉන්ධන එකම සැපයුම්කරු වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ජාතික ආර්ථිකයේ ප්‍රධාන කොටස්කරුවෙකු බවට පත්ව ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (BIA), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (MIA), රත්මලාන ගුවන් තොටුපොළ සහ පලාලි ගුවන් තොටුපොළ යන ගුවන් තොටුපොළ හතර සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගුවන් යානා ඉන්ධන අංශය සිය සේවා සපයනු ලබයි.

2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා මෙට්‍රික් ටොන් 373,668 ක සමස්ථ ගුවන් යානා ඉන්ධන අලෙවියක් වාර්තා කර ඇති අතර දෛනිකව මෙට්‍රික් ටොන් 1,369 ක පමණ සාමාන්‍ය ඉල්ලුමක් පවතී. 2022 - 2025 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළදී ගුවන් යානා ඉන්ධන අලෙවිය පිළිබඳ තොරතුරු 10.6 ප්‍රස්තාරය මගින් දක්වා ඇත.

වගුව 10.6 : ගුවන් යානා ඉන්ධන අලෙවිය - (2022 - 2025.09.30 දින දක්වා)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වර්ෂය	ප්‍රමාණය (මෙ.ටො.)
2022	245,838
2023	377,608
2024	468,158
2025.09.30	373,668

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ප්‍රස්තාරය 10.2

ගුවන් යානා ඉන්ධන අලෙවි කිරීම - (2022 - 2025.09.30 දිනට)



මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.6 ලිහිසි තෙල් අලෙවිය

ලිහිසි තෙල් කර්මාන්තය යනු කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින වඩා තරඟකාරී මෙන්ම ක්‍රමෝපායික ව්‍යාපාරයකි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිපෙට්කෝ සන්නාමය යටතේ සිය නිෂ්පාදන අලෙවි කරනු ලබන අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිය නිෂ්පාදන ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2022 වර්ෂයේ සිට 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට සිදු කරන ලද ලිහිසි තෙල් අලෙවි ප්‍රමාණයන් 10.7 වගුව මඟින් දක්වා ඇත. එම දත්ත අනුව 2022 වර්ෂයේ ලිහිසි තෙල් අංශයෙහි කැපී පෙනෙන පහළයාමක් දක්නට ලැබෙන අතර 2023 වර්ෂයේ සිට නැවතත් ක්‍රමයෙන් වෙළෙඳපොළ තුළ සිය ව්‍යාපාර ප්‍රකෘතිමත් කර ගැනීමක් දක්නට ලැබේ.

වගුව 10.7

ලිහිසි තෙල් අලෙවිය - (2022 - 2025.09.30 දිනට)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වර්ෂය	ප්‍රමාණය (මෙ.ටො.)
2022	901
2023	1,310
2024	1,532
2025.09.30 දිනට	1,862

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.7 කෘෂි රසායන අලෙවිය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දසක පහකට වැඩි කාලයක් කෘෂි රසායන ව්‍යාපාරයේ නිරතය. 2025 වර්ෂයේ කෘෂි රසායන අංශයේ ප්‍රගතිය සැලකිල්ලට ගැනීමේදී කෘමි නාශක, වල් නාශක වර්ග කිහිපයක් වෙළඳපොළට හඳුන්වා දී ඇති අතර වසර කිහිපයකට පසුව කෘමි නාශක, වල් නාශක හා දිලීර නාශක වර්ග කිහිපයක් නැවත ආනයනය කර ඇත. තවද, කෘෂි රසායන නිෂ්පාදන සඳහා නව APP (යෙදුම) එකක් හඳුන්වා දීම හා කෘෂි නිෂ්පාදන ඇසුරුම් සඳහා QR කේතයක් හඳුන්වා දීම ආදී කටයුතු සිදු කර ඇත.

2.8 යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවල ප්‍රගතිය

- **පිරවුම්හල්වල විදුලි වාහන ආරෝපණ පහසුකම් ස්ථාපිත කිරීම**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් කරන ලද අධ්‍යයනයකින් හෙළි වූයේ ඉන්ධන පිරවුම්හල් ආශ්‍රිතව විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බවයි. මෙම අධ්‍යයනය මත පදනම්ව, දිවයින පුරා උපායමාර්ගිකව පිහිටා ඇති ඉන්ධන පිරවුම්හල්වල විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන පිහිටුවීමට (CPC) සැලසුම් කර ඇත. 2025 වසරේදී මෙම මුලපිරීම සඳහා රුපියල් මිලියන 100 ක අයවැයක් වෙන් කර ඇත. සැලැස්ම මඟින් විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන 10 ක් ඉදිකිරීම ඉලක්ක කර ඇති

අතර, ඉන් ස්ථාන 7 ක් දැනටමත් අවසන් කර ඇති අතර පාරිභෝගිකයින්ට සේවා සපයයි. මෙම මෙහෙයුම් මධ්‍යස්ථාන ගාල්ල, දිවුලපිටිය, ඇතුල්කෝට්ටේ, කඩවත, කළුතර, හික්කඩුව සහ පැළියගොඩ යන ප්‍රදේශවල පිහිටා ඇත.

විද්‍යුත් ආරෝපණ මධ්‍යස්ථාන පිහිටුවීම

- **ත්‍රිකුණාමලය ඉහළ තෙල් ටැංකි සංකීර්ණයේ ටැංකි 24 සංවර්ධනය**

2025.09.30 දින වන විට පහත සඳහන් කාර්යයන් සිදු කර ඇත.

- ටැංකි යාන්ත්‍රික පිරිසිදු කිරීම අදියර 1 (ටැංකි 12)
- ටැංකි යාන්ත්‍රික පිරිසිදු කිරීම අදියර 2 (ටැංකි 09)
- ගිනි නිවන ජලය සහ අපජල ටැංකි ඉදිකිරීම (75%)
- TK 40 සහ 41 ටැංකි අලුත්වැඩියා කිරීම (75%)

- **ගුවන් යානා ඉන්ධන පිරවුම් පර්යන්තය සහ පවතින ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සහ ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතියක් ස්ථාපනය කිරීම - (BIA), කටුනායක**

මුළු ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 7,970.691 ක් වන අතර මුල් ව්‍යාපෘති කාලය 2018 ජනවාරි සිට 2020 ජූලි දක්වා (මාස 30) වූ අතර පසුව 2018 ජනවාරි සිට 2024 නොවැම්බර් දක්වා (මාස 82) සංශෝධනය කරන ලදී. 2025.09.30 වන විට සමුච්චිත වියදම රු. මිලියන 7,207 ක් වන අතර 2025.09.30 වන විට ලබා ඇති සමුච්චිත භෞතික ප්‍රගතිය 92% කි.

3. 2026 වර්ෂයේ ඉලක්ක

- මුතුරාජවෙල ජෙට් ඒ-1 නල මාර්ගය සහ ටැංකි ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීම
- ත්‍රිකුණාමලයේ ටැංකි 24 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියරේ දෙවන පියවර ආරම්භ කිරීම
- දිවයින පුරා පිහිටි පිරවුම්හල්වල විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කිරීම
- අනාගතයේදී ශුද්ධ ශුන්‍ය කාබන් ඉලක්ක කරා ළඟාවීමට පොසිල ඉන්ධන ප්‍රතිස්ථාපනය කළ හැකි හරිත හයිඩ්‍රජන්, හරිත ඇමෝනියා, ජෛව ඉන්ධන, සූර්යය ශක්තිය ආදී විකල්ප බලශක්ති ඉන්ධන තාක්ෂණයන් පිළිබඳව අධ්‍යයනය සහ ධාරිතා වර්ධනය
- Clean Sri Lanka වැඩසටහන යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් සියළුම ඉන්ධන පිරවුම්හල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම
- තෙල් හා ස්වභාවික වායු ගවේශන කටයුතු සම්බන්ධයෙන් අනාගත කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම 2026 පළමු කාර්තුවේදී සිදු කිරීමට නියමිත අතර, ඉන් පසුව කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම සිදු කෙරේ. ගිවිසුම අත්සන් කළ දින සිට මාස 30 ක් ඇතුළත ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත

1. හැඳින්වීම

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර ආයතන පොදු සමාගම් පනත බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව විධිමත් ලෙස සංස්ථාපිත සමාගමක් වන අතර, මේ පිළිබඳව 2003.10.13 දිනැති අංක 1310/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති අයුරින්, තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නල මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත පොදු භාවිත පහසුකම්වල අයිතිය ඇත. මෙම සමාගම ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අනුබද්ධිත සමාගමක් වන අතර මෙහි ප්‍රාග්ධන කොටස්වලින් 2/3 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් වන අතර ඉතිරිය ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් වේ.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් රට පුරා ඛනිජ තෙල් නිෂ්පාදන ආරක්ෂිතව කළමනාකරණය කිරීම සහ කාලෝචිත ලෙස ප්‍රවාහනය කිරීම, නිවාස, ප්‍රවාහන ජාල, කර්මාන්ත, ගුවන්තොටුපළ සහ විදුලි උත්පාදන පහසුකම් වෙත අඛණ්ඩ බලශක්ති සැපයුම සහතික කිරීමේ කාර්‍යය ඉටු කරයි. තවද මෙම ආයතනය ශ්‍රී ලංකාවේ මධ්‍යම ඛනිජ තෙල් සැපයුම් මධ්‍යස්ථානය ලෙස වගකීම් දරමින් අවශ්‍ය කාර්යයන් සිදු කරයි.

2. 2025 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම සිදු කරනු ලබන අතර මෙහිදී ඉන්ධනවල ඉහළ ගුණාත්මකභාවය රැකගනිමින් අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම පරිච්ඡේදයෙන් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ඉන්ධන ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඉදිරිපත් කරනු ලැබේ.

2.1 ඉන්ධන ගබඩා කිරීම

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම කොලොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන පර්යන්ත දෙකක ප්‍රධාන වශයෙන් ඉන්ධන ගබඩා පහසුකම් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව කොලොන්නාව පර්යන්තයේ මෙට්‍රික් ටොන් 265,305 ක ඉන්ධන ගබඩා ධාරිතාවයක් ද මුතුරාජවෙල පර්යන්තයේ මෙට්‍රික් ටොන් 208,738 ක් ද වශයෙන් මෙට්‍රික් ටොන් 471,043 ක ඉන්ධන ගබඩා ධාරිතාවයක් රට තුළ පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, මෙම ප්‍රධාන පර්යන්ත දෙක මඟින් 2025 වර්ෂය තුළ ඉන්ධන ගබඩා කිරීම සඳහා සක්‍රීය දායකත්වයක් සපයන ලද අතර සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවය 11.1 වගුව මඟින් දක්වා ඇත.

වගුව 11.1
කොලොන්නාව සහ මුතුරාජවෙල ඉන්ධන ගබඩා තොරතුරු
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

නිෂ්පාදනය	ගබඩා ධාරිතාවය (මෙ.ටො.)			එකතුව
	කොලොන්නාව පර්යන්තය	මුතුරාජවෙල පර්යන්තය	ප්‍රාදේශීය තොග ගබඩා	
නැප්තා	4	-	14,209	-
ඔක්ටේන් 95 පෙට්‍රල්	3	-	18,249	-
ඔක්ටේන් 92 පෙට්‍රල්	6	14	65,473	95,105
භූමිතෙල්	1	-	10,488	-
ගුවන් යානා ඉන්ධන	5	-	44,703	-
ඔටෝ ඩීසල්	5	15	44,896	113,633
සුපර් ඩීසල්	3	-	17,232	-
දැවි තෙල්	8	-	48,120	-
සොල්වන්ට්	1	-	342	-
කාර්මික භූමිතෙල්	1	-	1,593	-
අළුත්වැඩියා තත්ත්වයේ පවතින ටැංකි	3	-	-	-
එකතුව	**40**	**29**	**265,305**	**208,738**

මූලාශ්‍රයː ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

2.2 ඉන්ධන බෙදාහැරීම්

2025 වර්ෂය වන විට ඉන්ධන සැපයුම්කාර ආයතන හතරක් ඉන්ධන බෙදාහැරීමේ කටයුතුවල නිරත වන අතර ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම එම ආයතනවල ඉන්ධන අවශ්‍යතාවයන් අනුව ඉන්ධන බෙදාහැරීම සිදු කරනු ලැබේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොළොන්නාව සහ මුතුරාජවෙල යන ප්‍රධාන පර්යන්ත දෙක ඇතුළු ප්‍රාදේශීය ඉන්ධන ගබඩා වෙතින් ඉන්ධන සැපයුම්කාර ආයතන වෙත ඉන්ධන නිකුත් කිරීම සිදු කරනු ලබන අතර 2025 වර්ෂය තුළ ඉන්ධන සැපයුම්කාර ආයතන වෙත ඉන්ධන බෙදාහැරීම් ප්‍රගතිය වගු අංක 11.2 මඟින් දක්වා ඇත.

ඒ අනුව 2025 වර්ෂය තුළ වාර්තා කරනු ලබන මුළු බෙදාහැරීම් ප්‍රමාණය කිලෝ ලීටර් 3,502,397 ක් වන අතර එම බෙදාහැරීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන කිලෝ ලීටර් 2,532,372 කින් ද, ලංකා ඉන්දියානු තෙල් සමාගම් ඉන්ධන කිලෝ ලීටර් 320,214 කින් ද සිනොපෙක් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 346,512 කින් ද හා ආර්.එම්.පාර්ක්ස් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 303,299 කින් ද සමන්විත වේ. ඒ අනුවල ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ථ ඉන්ධන බෙදා හැරීම්වලින් 72% ක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව සතු ඉන්ධන වන අතර ඉතිරි 28% ක ප්‍රමාණය ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් සමාගම සහ ආර්.එම්.පාර්ක්ස් සමාගම සතු ඉන්ධනවලින් සමන්විත වේ.

වගුව 11.2
ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය - 2025.09.30 දිනට
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

නිෂ්පාදනය	ප්‍රමාණය (කි.ලී)				
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්.පාර්ක්ස්	එකතුව
ද්‍රව තෙල්	385,960	-	-	-	385,960
ජෙට් ඒ 1	453,410	-	-	-	453,410
ලංකා ඔටෝ ඩීසල්	761,621	144,042	167,935	136,250	1,209,847
ලංකා සුපර් ඩීසල්	23,784	5,023	6,580	6,857	42,244
නැප්තා	193,018	-	-	-	193,018
පෙට්‍රල් 92 ඔක්ටේන්	690,258	160,226	166,189	153,665	1,170,339
පෙට්‍රල් 95 ඔක්ටේන්	24,321	10,923	5,808	6,527	47,579
එකතුව	**2,532,372**	**320,214**	**346,512**	**303,299**	**3,502,397**

මූලාශ්‍රය: : ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

ප්‍රස්තාරය 11.1
ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය - 2025.09.30 දිනට
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

2.3 ඉන්ධන බෙදාහැරීම සඳහා ආශ්‍රිත පහසුකම් සංවර්ධනය

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මඟින් ඉන්ධන තොග ගබඩා පවත්වා ගෙන යාම සහ ඉන්ධන ප්‍රවාහනය සඳහා නල මාර්ග පවත්වා ගෙන යාම සිදු කරනු ලබන බැවින්, එම ආශ්‍රිත පහසුකම් වඩාත් ගුණාත්මක සහ ප්‍රමිතිගත තත්ත්වයෙන් යුක්ත විය යුතු බවට හඳුනාගෙන ඇත. එබැවින් එම පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාවට නංවා ඇත.

- **කොළොන්නාවේ ඛනිජ තෙල් ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නව ගබඩා ටැංකි 06ක් ඉදිකිරීම**

ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් ගබඩා කිරීම සඳහා පොදු පහසුකම් සපයන්නා වශයෙන් ක්‍රියාත්මක වන ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, කොළොන්නාව පර්යන්තය තුළ ඉන්ධන ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා නව ඉන්ධන ටැංකි හයක් (06) ඉදිකිරීමේ කටයුතු මෙම වසරේ සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. පසුගිය කොවිඩ් වසංගත කාලය

තුළ ඉදිකිරීමට සැලසුම්කර තිබූ මෙම ටැංකි හයේ ඉදිකිරීම් කටයුතු එම අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ක්‍රියාවට නැංවීමට නොහැකි විය. කෙසේ වුවද නැවත එම සංවර්ධන කාර්යය මෙම වසරේදී ආරම්භ කරන ලද අතර, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් එම ව්‍යාපෘතියේ කටයුතු මෙම සැප්තැම්බර් මස 17 දින ආරම්භ කරන ලදී. මෙම ගබඩා ටැංකි 06 ඉදිකිරීමේ කටයුතු 2027 සැප්තැම්බර් 29 දින අවසන් කිරීමට අපේක්ෂිතය. මෙම ටැංකි

- **කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා අඟල් 18 ක විෂ්කම්භයකින් යුතු නළ මාර්ගයක් ඉදිකිරීම**

කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය කරනු ලබන නල මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බැවින් ඉන්ධන ගොඩබෑම කාර්යක්ෂම කිරීම සඳහා අඟල් 18 ක විෂ්කම්භයකින් යුතු නල මාර්ගයක් ඉදිකිරීම සඳහා සැලසුම් කරන ලදී. ඒ

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නව ගබඩා ටැංකි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම

06 හි ගබඩා ධාරිතාවය ඝන මීටර් 64000 කි. එමගින්, කොළොන්නාව පර්යන්තයෙහි ඉන්ධන ගබඩා ධාරිතාවය සැලකියයුතු මට්ටමකින් ඉහළ දැමීමට හැකියාව ලැබේ. මේ සඳහා වැයවෙතැයි අපේක්ෂිත ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 3374 කි. මෙම අරමුදල ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) මඟින් දරනු ලැබේ. 2025 සැප්තැම්බර් 30 දින වන විට අදාළ කොන්ත්‍රාත්කරු වැඩබිමට ප්‍රවිශ්ට වී ටැංකි ඉදිකිරීමේ කටයුතු වල මූලික අඩියර ආරම්භ කරන ලදී.

සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. මේ සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 2853 ක් (බදු රහිත) වන අතර අපේක්ෂිත ව්‍යාපෘති කාලය මාස 18 කි.

- **කන්කසන්තුරයෙහි පිහිටි ප්‍රාදේශීය ඉන්ධන තොග ගබඩාව නැවත ස්ථාන ගත කිරීම**

කන්කසන්තුරයෙහි පිහිටි ප්‍රාදේශීය ඉන්ධන තොග ගබඩාව උතුරු පළාතට ඉන්ධන

බෙදාහැරීම සඳහා උපක්‍රමික වශයෙන් වැදගත් වන ගබඩාවකි. මෙම ගබඩාව සිමෙන්ති කර්මාන්ත ශාලාවට අයත් ඉඩමක පවත්වාගෙන ගොස් ඇති අතර එම ගබඩාව දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. මෙම ප්‍රාදේශීය ගබඩාව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත් ඉඩමක නැවත ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන ලදී. මෙහි සමස්ත ස්ථාපිත ධාරිතාවය ලීටර් 540,000 ක් පමණ වේ. මෙම ව්‍යාපෘතිය 2025 මැයි මස 8 වැනි දින අවසන් කර අදාළ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

- **කොලොන්නාව ඉන්ධන තොග ගබඩා පර්යන්තයේ සිට කොළඹ වරායේ Seram Gate දක්වා දැනට පවතින අඟල් 10 විෂ්කම්භයෙන් යුක්ත නල මාර්ගය වෙනුවට අඟල් 18 විෂ්කම්භයෙන් යුක්ත නල මාර්ග යක් ඉදි කිරීම**

මෙම ව්‍යාපෘතියට අදාළව ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඊට අදාළ මිල ගණන් කැඳවීම ඇගයීම් සිදු කර අවසන් කර ඇත. මීට අදාළ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා එම වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රමන්ත්‍රණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

- **කොලොන්නාව ඉන්ධන තොග ගබඩා පර්යන්තය තුළ පිහිටි අංක 30 හා 31 දරණ ටැංකි දෙක (02) වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම**

මෙම ව්‍යාපෘතියට අදාළව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට නියමිතය.

- **කොලොන්නාව ඉන්ධන තොග ගබඩා පර්යන්තයෙහි කලාප අංක 07 හි ඉන්ධන පිරවුම් පහසුකම් සංවර්ධනය කිරීම**

2026 වසර සඳහා රු.මිලියන 500 ක් වෙන් කර ඇත. මීට අදාළව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.

- **කොලොන්නාව ඉන්ධන තොග ගබඩා පර්යන්තයේ සිට කැළණිතිස්ස විදුලි බලාගාරය දක්වා නැප්තා ප්‍රවාහනය කරනු ලබන අඟල් 10 නල මාර්ගය වෙනුවට අඟල් 12 නල මාර්ගයක් ස්ථාපිත කිරීම**

මෙම ව්‍යාපෘතියට අදාළව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.

අලුතින් ඉදිකරන ලද සහායක නල මාර්ග යක් සහ ආධාරක යටිතල පහසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු, 2025 අගෝස්තු 22 වන දින කොළඹ වරායේ දකුණු ජැටියේදී නැව් තෙල් සැපයුම් මෙහෙයුම් නිල වශයෙන් ආරම්භ කරන ලදී. මෙම වැදගත් වර්ධනය, කලාපීය නැව් තෙල් ඉන්ධන වෙළඳාමේ ශ්‍රී ලංකාවේ හැකියාවන් පුළුල් කිරීමේ ප්‍රධාන ඉදිරි පියවරක් සනිටුහන් කරයි.

2.6 2026 වර්ෂයේ ඉලක්ක

1. යටිතල පහසුකම් සහ ධාරිතාව පුළුල් කිරීම

- ඉන්ධන ආරක්ෂාව වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් සමස්ත ගබඩා ධාරිතාව වැඩි කිරීම සඳහා කොළොන්නාව සහ මුතුරාජවෙල ගබඩා ටැංකි ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- ආරක්ෂිත සහ විශ්වාසදායක ඉන්ධන හුවමාරු සහතික කිරීම සඳහා ප්‍රතිස්ථාපන සහ අඛණ්ඩතා තක්සේරු කිරීම් ඇතුළුව නල මාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- රට පුරා ඉල්ලුම සපුරාලීම සඳහා තොග ඩිපෝවල මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ධාරිතාව වැඩි දියුණු කිරීම.

2. මෙහෙයුම් විශිෂ්ටත්වය සහ ආරක්ෂාව

- වෘත්තීය සෞඛ්‍ය, ආරක්ෂාව සහ පරිසර කළමනාකරණ පද්ධතිය (OHSEMS) ක්‍රියාත්මක කිරීම සහ සිදුවීම් අවම කිරීම සහ හදිසි සූදානම වැඩි දියුණු කිරීම සඳහා අදාළ ප්‍රමිති සහතිකය (ISO) ලබා ගැනීම.

- තීරණාත්මක අනතුරු ශූන්‍යයක් පවත්වා ගැනීම සහ කාර්ය මණ්ඩල පුහුණුව සහ ශක්තිමත් ආරක්ෂක වැඩසටහන් හරහා අහිමි වූ කාලය තුවාල සහ වාහන අනතුරු අඩු කිරීම සඳහා උත්සාහ කිරීම.

3. **තාක්ෂණය සහ නවෝත්පාදනය**

- පද්ධති භාවිතය, දත්ත අඛණ්ඩතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා SAP ERP නවතම අනුවාදයට (RISE with S/4HANA) උත්ශ්‍රේණි කිරීම, ශූන්‍ය අක්‍රීය කාලය සහතික කිරීම.
- විදුලි පරිභෝජනය සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා බහු ස්ථානවල සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති ඒකාබද්ධ කිරීම පුළුල් කිරීම.
- වත්කම් අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා චුම්බක ප්‍රවාහ කාන්දු (MFL) මෙවලම් වැනි උසස් පරීක්ෂණ තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම.

4. **මානව සම්පත් සංවර්ධනය**

- සංශෝධිත මානව සම්පත් ප්‍රතිපත්ති, අනුප්‍රාප්ති සැලසුම්කරණය, යාවත්කාලීන කරන ලද බඳවා ගැනීම් සහ උසස්වීම් රාමු සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හරහා ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම.
- ආයතනික අරමුණු සමඟ සමපාත වන සේවක කාර්ය සාධන කළමනාකරණය (KPI) සහ පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම.

5. **සේවා සහ ආදායම් ප්‍රවාහ පුළුල් කිරීම**

- අතිරේක ආදායම් ප්‍රභවයන් ලෙස රසායනාගාර සේවා සහ පුහුණු වැඩසටහන් විවිධාංගීකරණය කිරීම.
- නැගී එන වෙළඳපොළ අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීම සඳහා ඉන්ධන තෙල් ඉන්ධන සැපයුම් පහසුකම් සංවර්ධනය කිරීම සහ නැව්තෙල් ව්‍යාපාරය සඳහා ගබඩා ධාරිතාව පුළුල් කිරීම පවත්වා ගෙන යාම

1. හැඳින්වීම

2021 ඔක්තෝබර් 8 වන දින 21 වන දින ඛනිජ තෙල් සම්පත් පනත යටතේ පෙර පැවති ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය (PRDS) වෙනුවට ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) පිහිටුවන ලදී. ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) පිහිටුවීම බලාත්මක කිරීම" ශ්‍රී ලංකාව තුළ සියලුම ඛනිජ තෙල් ගවේෂණ සංවර්ධන සහ නිෂ්පාදන මෙහෙයුම් (පෙරභාග) කළමනාකරණය සහ නියාමනය සඳහා ස්වාධීන නියාමකයෙකු නිර්මාණය කිරීම සඳහා සැලකිය යුතු පියවරක් සනිටුහන් කළේය. විශේෂයෙන්, පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ යහපත් ඛනිජ තෙල් මෙහෙයුම් ක්ෂේත්‍ර පිළිවෙත් භාවිතයෙන් සිදු කරන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය වගකිව යුතු අතර, බලශක්ති ක්ෂේත්‍රයට අදාළ සෞඛ්‍යය, ආරක්ෂාව සහ පාරිසරික පිළිවෙත්වලට අනුකූලව සිදු කරන බවට සහතික වී ඇත.

අරමුණු

- උද්ගාමී ඛනිජතෙල් ක්‍රියාකාරකම් (ගවේෂණය සහ නිෂ්පාදනය) වැඩි දියුණු කිරීම.
- ජාතික ඛනිජතෙල් දත්ත ගබඩාවෙහි දත්ත පරිමාව සහ දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- උද්ගාමී ඛනිජතෙල් ක්‍රියාකාරකම් නියාමනය කිරීම.
- ඛනිජතෙල් මෙහෙයුම් ක්‍රියාත්මක වනවිට එහි අනුක්‍රමික අවධීන්හි දී ජාතික සමාජ ආර්ථික ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම.
- ඛනිජතෙල් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී පරිසර දූෂණය වැලැක්වීම සහ සෞඛ්‍ය ආරක්ෂණ පාරිසරික අවධානම අවම කිරීමට පියවර ගැනීම.

ආයතනයේ ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) හි මූලික කාර්යයන් අතරට ගවේෂණ බිම් කොටස් නම් කිරීම, ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම බිම් කොටස් ප්‍රවර්ධනය කිරීම, ඛනිජ තෙල් සම්පත් පනතට අනුකූලව අවශ්‍ය සියලුම බලපත්‍ර සහ සහතික නිකුත් කිරීම, කෙටුම්පත් රෙගුලාසි සකස් කිරීම, ඛනිජ තෙල් මෙහෙයුම් සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම, අදාළ ගිවිසුම්වලට එළඹීම සහ පනතේ නියම කර ඇති සියලුම රාජකාරි ඉටු කිරීමට අමතරව ජාත්‍යන්තරව තරඟකාරී පෙරගාමී අංශයක දක්ෂ හා වගකිවයුතු නියාමනය සහතික කිරීම ඇතුළත් වේ.

2. 2025 වර්ෂය තුළ ව්‍යාපෘති සහ මෙහෙයුම් කාර්යසාධනය

- මන්නාරම් ද්‍රෝණිය තුළ තෝරාගත් කොටස් හතරක තෙල් හා ගෑස් ගවේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදනය සඳහා බලපත්‍ර වටයක් පැවැත්වීම සඳහා 2025 මැයි 07 වන දින කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. එම බලපත්‍ර වටය ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු අලෙවිකරණ උපදේශකයෙකු ප්‍රසම්පාදනය කිරීම ද මෙම අනුමැතියට ඇතුළත් වූ අතර, ඒ සඳහා යෝජනා සඳහා ආරාධනාවක් 2025 ජූලි 15 වන දින ප්‍රචාරය කරන ලදී. ලැබුණු යෝජනා සඳහා ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.ඊට සමගාමීව, ඛනිජ තෙල් සම්පත් ගිවිසුම (PRA) කෙටුම්පත් රෙගුලාසි සකස් කර ඇති අතර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව එම කටයුතු අවසන් කරමින් පවතී.

- 2025 මන්නාරම් ද්‍රෝණියේ බලපත්‍ර වටයට සූදානම් වීමේ දී, ප්‍රධාන ලංසු තැබීමේ ලේඛනයක් වන යාවත්කාලීන කරන ලද ආදර්ශ ඛනිජ තෙල් සම්පත් ගිවිසුම, සමාලෝචනය සහ අනුමැතිය සඳහා

2025 අගෝස්තු 12 වන දින නීතිපති දෙපාර්තමේන්තුවට යවන ලදී. ඉහත සඳහන් බලපත්‍ර වටය සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුවක් (CANC) සහ ප්‍රසම්පාදන කමිටුවක් (PC) පත් කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය බලශක්ති අමාත්‍යාංශයට දන්වා ඇත.

- මෙහෙයුම් වියදම් අවම කිරීම සඳහා උපායමාර්ගික පියවරක් ලෙස, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පෙර පරිශ්‍රයෙන් ඉවත් කර ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ පරිශ්‍රය වෙත ගෙන යන ලදී.

- වර්තමානයේ, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය ඉදිරි බලපත්‍ර වටය (SL 2025-01) සඳහා අවශ්‍ය සියලුම ලියකියවිලි සකස් කිරීමේ කටයුතු සඳහා මූලික අවධානය යොමු කර ඇත.

සිතියම 12.1

2025 මන්නාරම් ද්‍රෝණියේ බලපත්‍ර වටය සඳහා වෙන් කර ඇති ආසන්න ප්‍රදේශය (SL 2025 - 01)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය

3. 2026 වර්ෂයේ ඉලක්ක

පහත සඳහන් කාලසටහනට අනුව බලපත්‍ර වටය ඉදිරියට යාමට අපේක්ෂා කෙරේ.

- අලෙවිකරණ ව්‍යාපාරය අවසන් වන අතර, යෝජනා ඇගයීම 2026 ජූනි වන විට ආරම්භ වේ.
- තෝරාගත් ආයෝජකයින් සමග ඛනිජ තෙල් සම්පත් ගිවිසුමේ නියමයන් සඳහා සාකච්ඡා 2026 අගෝස්තු වන විට අවසන් කිරීමට නියමිතය.
- අවසාන අරමුණ වන්නේ 2026 නොවැම්බර් වන විට බිම් කොටස් ප්‍රදානය කිරීම සහ ඛනිජ තෙල් සම්පත් ගිවිසුම (PRA) ක්‍රියාත්මක කිරීමයි.
- ගවේෂණ බලපත්‍ර පසුව ක්‍රියාකරුවන්ට නිකුත් කරනු ලබන අතර, එමඟින් 2026 දෙසැම්බර් වන විට ප්‍රදානය කරන ලද බිම් කොටස්වල ගවේෂණය ආරම්භ කිරීමට ඔවුන්ට හැකි වේ.

අංක 437, ගාලු පාර, කොළඹ 03.

இல. 437 காலி வீதி, கொழும்பு 03.

No. 437, Galle Road, Colombo 03.

0112 574922 **www.powermin.gov.lk**
www.powermin.gov.lk